# රණවරුණ

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ ප්‍රකාශනයකි

30 වන කලාපය | 2019 අප්‍රේල් - ජුනි

# RANAWARUNA



## පරිණත නායකයෙකුගේ සපැමිණීම

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 38 වන සේනාවිධායක ලෙස
මේජර් ජෙනරාල් එස්ඩීටී ලියනගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී රාජකාරී භාරගැනීම...



# ජය ශ්‍රී මහා බෝධි අංකුරයක් රෝපනය කිරීම

2019 ජුනි මස 12 වන දිනට යෙදුන සුභ මොහොතින් උතුම් වූ විජය ශ්‍රී ජය ශ්‍රී මහා බෝධි රජයාණන් වහන්සේගේ බෝධි අංකුරයක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථාන නව කඳවුරු පරිශ්‍රය ගොඩනැගෙන භූමියේ අභිනවයෙන් ඉදිකර ඇති පිං බිමෙහි රෝපණය කිරීම අතිඋත්කර්ශවත් අන්දමින් සිදුකරනු ලැබීය.

එම බෝධි අංකුරය අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස සිට කොස්ගම අකරවිට ලෙනවර පුරාණ රජමහා විහාරය දක්වා වැඩමකරවා එහි සිට අලංකාරවත් පෙරහැරකින් කඳවුරු භූමිය වෙත වැඩම කරවීමෙන් අනතුරුව මහ සංඝරත්නයේ හා ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ඇතිව සම්බුද්ධ සාසනයේ චිරස්ථිතිය උදෙසා බොදු ජනයාගේ වන්දනාමානය පිණිස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක, ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) - ආඥාපති, සමූහ මෙහෙයුම් ආඥාපති - බස්නාහිර පලාත හා පුත්තලම දිස්ත්‍රික්කය, කර්නල් සේනාවිධායක ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය හා යුද්ධ හමුදා බෞද්ධ බලමණ්ඩලයේ සභාපති මේජර් ජෙනරාල් එස්ඩීට් ලියනගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ පිංබර සුරතින් රෝපණය කරන ලදී.

එම පින්බර අවස්ථාවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක, මූලික මාණ්ඩලික නිලධාරි, පුහුණු පරීක්ෂක, බ්‍රිගේඩියර් (පාලන) ඇතුළු ස්වේච්ඡා බළසේනා මූලස්ථාන ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් හා සෙසුනිළයෝ විශාල පිරිසක්ද සහභාගි වූහ.









## සංස්කාරක සටහන



සිංහල අලුත් අවුරුද්ද එනතුරු අප පුල පුලා බලා සිටීම අප ළමාවියේ තිබූ සොදුරුතම සිහින වලින් එකකි. මන්ද මුලු අවුරුද්දම එකම විදියට ගෙන යන මේ ජීවිතය ඒ ඒකාකාරී බවින් මුදාලන වටිනා වූත් සුවිශේෂී වූත් සංස්කෘතික වූත් අපූරු උත්සවයකි. අප රටේ සිටින සෑම සිංහලයාම සෑම දමිලයාම එකම මොහොතක එකම කාර්යයක නිරත කරන දින කිහිපයක් මේ සිංහල හින්දු අවුරුද්ද තුල වෙයි. හෙළයන් අතීතයේ සිට අවුරුද්ද පටන්ගෙන තිබෙන්නේ බක් මාසයෙනි. දීපවංශය දක්වන්නේ දෙවන මාසය (වෙසක් මාසය) ඉකුත් වූ පසු මිහිදු හිමියන් වැඩියා කියාය. මෙහි පළමු මාසය බක් මාසය වූ බව ඉන් පැහැදිලිය. ඇතැම් රටවල අප්‍රේල් 14 උත්සව තිබුනත් ඒවා විද්‍යාත්මක පදනමකින් සමරන ඒවා නොවේ. බක් කියන්නේ සෞභාග්‍යයෙන් පිරි සමෘද්ධිමත් කාලය යන අදහසයි. අපේ මුතුන් මිත්තන් අලුත් අවුරුද්ද සම්බන්ධ කලේ නිශ්පාදනය හා පරිභෝජනය පළිබඳ විද්‍යාත්මක පදනමකිනි.

අවුරුද්ද එළබෙන්න ලඟ බව අපට පළමුව දැනුම් දෙනුයේ එරබදු ගහයි. ගසේ අතු පමනක් ඉතිරිවන සේ නග්නව සිටින එරබදු ගස අවුරුදු සමය ලං වනවිට ලැජ්ජාවෙන් බරිත වී රතු රෙද්දක් පොරවා ගන්නේ අප සිත් ඔකඳ කරවමිනි. ඒ සමගම කොහාගේ නදින් මුලු පරිසරයම ගීතවත් වන්නේ ඒ සතුට තියුනු කරවමිනි. බක් මස උදාවත්ම හැම ගෙදරකම කුස්සි වල ලිප මත හැදෙන කැවුම් කොකිස් හා එයට අවශේෂ කැවිලි පෙවිලි වල සුවඳ, කුස්සිය පිළිකන්නේ සිට අප හා හිනැහෙන කෙසෙල් කැන් මතක් කර දෙනුයේ අප කුඩා කල අවුරුදු අසිරියයි. සෑම ගෙදරකම පාහේ ඔන්චිල්ලාවක් බැඳීම, ගමේ ක්‍රීඩා පිටිය අවුරුදු උත්සවයට ලක ලැහැස්ති කිරීම ගමේ තරුණයන්ට පැවරී තිබූ කාර්යයකි.

මා මේ සඳහන් කලේ අප කුඩා කල විඳි සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවයයි. නමුත් අද අවුරුදු උත්සවය මීට වඩා හාත්පසින්ම වෙනස්ය. අද මත් පැනින් තොර අලුත් අවුරුද්දක් සොයා ගැනීම කළුනික සෙවීමටත් වඩා අපහසුය. අවුරුදු උත්සවයේ කෑම මේසය කේක්, පුඩිං ආදී නානාප්‍රකාර කෑම වලින් පිරී ඇත. අද කාන්තාව නැකතට ගිනිමෙලවන්නේ දර ලිපෙහි නොව ගෑස් ලිපෙනි. ජන ක්‍රිඩා වෙනුවට වෙනත් ආගන්තුක ක්‍රීඩාය. අවුරුදු උත්සවයේ තිබූ දේශීය ගතිය විනාශ වී ගොස් ඇති සැටියකි. තවද පසුගිය වාර්ථාවන්ට අනුව ශ්‍රී ලංකාවේ අනතුරු බහුලම මාසය මේ බක් මාසයයි. එසේ සිදුවීමට මූලික හේතු වී ඇත්තේද මිනිසුන් මෙම සිංහල අවුරුදු උත්සවයේ නියම අරුත වටහා නොගෙන මත්පැනට නැඹුරු වී ඇති නිසාය. තරහා මරහා නැතිකර ගැනීම අසමගිය නැතිකර ගැනීම වෙනුවට ඒවා වැඩිකර ගැනීමද මෙම කාලසීමාවේදී බොහෝවිට දක්නට ලැබෙන්නකි.

එදා ගම් වැසියන් අවුරුදු උත්සවයේ සිරිත් විරිත් සැලකුවේ ගෞරවයෙනි. ඒ අවුරුදු උත්සවය නිර්ව්‍යාජය අහිංසක ලස්සනක් තිබුනි. නමුත් අද ඒ අලුත් අවුරුද්ද බාහිර ආටෝප වලින් වැසී තිබේ. අනාගත පරපුරටත් ඒ අප කුඩා කල විඳි අවුරුදු අසිරිය සිහිනයක් නොවී එළෙසින්ම දක ගැනීමට ක්‍රියා කිරීම අපගේ යුතුකමක් නොවන්නේද ..?


# රණවරුණ

### ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානය

### අධීක්ෂණය



මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි කේඑස්වී

### උපදේශකත්වය



බ්‍රිගේඩියර් කේපී නුගේගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී



කර්නල් එම්ජීඑච්එන්බී මහතුවක්කාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී

### සංස්කාරක



ලුතිතන් කර්නල් එස් රාජපක්ෂ ශ්‍රීලංජාආබමු

### "රණවරුණ" කාර්ය මණ්ඩලය

කපිතන් එච්පීඑම්පීබීඑම් පළිහක්කාර ශ්‍රීලංජාආබමු
කෝප්‍රල් දයාරත්න ඩීපීඑස් (සැකසුම් සහය)
ලා/කෝ කීර්තිරත්න ඒඑච්ටී (පරිගණක නිමැවුම් සහය)

කෝප්‍රල් කුමාර පීඩබ්ලිව්ඩබ්ලිව්පීඑස්එම්
කෝප්‍රල් සාලිය බණ්ඩාර යූඕඒ
කෝප්‍රල් බණ්ඩාර ඒඑම්එස්ඩබ්
ලා/කෝප්‍රල් චාමර එම්කේආර්එල්
ලා/කෝප්‍රල් ධර්මශ්‍රී වයිඒඑස්
සාසෙ පෙරේරා එච්ආර්පීඩබ්ලිව්
සාසෙ කුමාර කේකේඑස්ආර්



### රණවරුණ ලිපිනය

සංස්කාරක, රණවරුණ
ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ස්වේච්ඡා බළසේනා මූලස්ථානය
යුද හමුදා කඳවුර, සාලාව - කොස්ගම

ඊමේල් ranawaruna@yahoo.com
වෙබ් slavf@army.lk
දුරකතන - 036 2255 362 / ෆැක්ස් - 036 2255 709



### පරිගණක නිර්මාණය හා මුද්‍රණය

නියෝ ග්‍රැෆික්ස්

# නිවැරදි නායකත්වය තුලින් ඉදිරි ගමනක් සඳහා ...







වසර 138 ක අභිමානවත් ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දෙවන විශාලතම සංවිධානාත්මක ආයතනය වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 38 වන සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් එස්ඩීටී ලියනගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරි 2019 අප්‍රේල් මස 25 වන දිනට යෙදුන සුභ මොහොතින් රාජකාරීන් භාරගන්නා ලදී.

මේ වනවිට රට තුළ උද්ගතවී ඇති තත්වය මත ඉතාමත් චාම් හා අභිමානවත් අයුරින් මෙම රාජකාරින් භාරගැනීම ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් යුද්ධ හමුදා චාරිත්‍රානුකූලව සිදුකරන ලදි. ප්‍රථමයෙන්ම මුර පිරික්සුමකින් හා සම්මාන මුරයකින් නව සේනාවිධායක තුමන් වෙත ගෞරව පිරිනමා ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල් එෆ් කස්තුරිආරච්චි කේඑස්වී විසින් පිළිගන්නා ලදී.

පසුව සුභ මොහොතින් ආගමික වතාවත් සිදුකර රාජකාරි භාරගැනීමෙන් අනතුරුව සිහිවටන පැළයක් නව කඳවුරු පරිශ්‍රය තුළ රෝපනය කරන ලදී. ඉන් අනතුරුව නව සේනාවිධායක තුමන් විසින් හටපිරිස් අමතන ලදී. ස්වේච්ඡා බළසේනාවේ නිලධාරි සහ සෙබළුන්ගේ විනය පවත්වා ගනිමින් නිසි පුහුණුව මගින් ඔවුන්ගේ වෘත්තිමය තත්ත්වය ඉහල නංවා ස්වේච්ඡා බළසේනාව තවදුරටත් ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට ක්‍රියාකිරීම නව සේනාවිධායක තුමාගේ අරමුණු අතර ප්‍රධාන තැනක් ගන්නා බව එහිදී ප්‍රකාශ කරන ලදී.

මෙම රාජකාරි භාරගැනීමේ වැඩසටහන සඳහා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ බ්‍රිගේඩියර් පාලන හා පුහුණු පරීක්ෂක ඇතුළු මූලස්ථාන කාර්ය මණ්ඩල නිළධාරීන්ද, ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරන නිළධාරීන් (ස්වේච්ඡා), රෙජිමේන්තු සම්බන්ධීකරන නිළධාරීන් සහ අණදෙන නිළධාරි වරුන් සහභාගි වූහ.



















# නික්ම යන සේනාවිධායක වෙත ස්වේච්ඡා බලසේනාවේ උපහාරය



ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ධූරය හෙබවූ මේජර් ජෙනරාල් පීආර්එච් ඩයස් වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී ඉකුත් අප්‍රේල් මස 24 වනදා යුධ හමුදා දිවියෙන් විශ්‍රාම ගැනීම සඳහා සිය ධූරයෙන් සමුගන්නා ලදී. ස්වේච්ඡා බලසේනාවේ 37 වන සේනාවිධායක ලෙස රාජකාරී භාරගත් ඔහු සිය කාලසීමාව තුළ ස්වේච්ඡා බලසේනාවේ උන්නතිය උදෙසා ඉමහත් මෙහෙයක් ඉටුකරමින් ඔහු ඉන් නික්ම යනුයේ මතක සටහන් රාශියක්ද අප හමුවේ ඉතිරි කරමිනි.


වසර 138 ක අභිමානවත් ඉතිහාසයකට උරුමකම් ඇති ස්වේච්ඡා බලසේනාව තුළ නොමැකෙන මතක සටහන් එක් කරමින් නික්ම යන සේනාවිධායක තුමන් හට ස්වේච්ඡා බළඇණි සාමාජිකයින්ගෙන් සැදුම්ලත් සම්මාණ පෙළපාලියකින් ගෞරව බුහුමන් දක්වා සමාචාරය පුදදෙන ලදී. පසුව සියලු නිළයින් සමගින් තේ පැන් සංග්‍රහයකට එක් වූ එතුමන් දෙපෙළින් සැදුම් ලත් ස්වේච්ඡා බලසේනා සාමාජිකයන් ගේ "**ජය ශ්‍රී**" සුභ පැතුම් අතරින් ස්වේච්ඡා බලසේනාවෙන් නික්ම යන ලදී. එසේම යුධ හමුදා චාරිත්‍ර පිළිපදිමින් එදින රාත්‍රියේ දී එතුමන් හට රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත්වා ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක ගේ සුරතින් සමරු අසිපත සහ සිහිවටන ඡායාරූප ඇල්බමය පිරිනමා එතුමා සහ එම මැතිණිය වෙත සොඳුරු වූ මතකයන් සමගින් නික්ම යෑමට ඉඩහසර ලබා දෙන ලදී. මෙම සමුගැනීමේ සියලු උත්සව වැඩසටහන් සඳහා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ බ්‍රිගේඩියර් භකාස, පුහුණු පරීක්‍ෂක, බ්‍රිගේඩියර් පාලන යන ජ්‍යෙෂ්ඨ නිලධාරීවරුන් ඇතුලු ස්වේච්ඡා බලසේනාවේ බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිලධාරී ස්වේච්ඡා, ශ්‍රීලංජාආබමු රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක, සෙව්පුපා - දියතලාව සේනාවිධායක, කර්නල් සම්බන්ධීකරණ නිළධාරීන්, රෙජිමේන්තු සම්බන්ධීකරණ නිලධාරීන්, ස්වේච්ඡා ඒකක අණදෙන නිලධාරින් සහභාගී වූහ. වසර 35 ක යුධ හමුදා සේවා කාළයක් සම්පූර්ණ කර විශ්‍රාම ලබා යන තත් ජ්‍යෙෂ්ඨ නිළධාරී තුමන්ට නිදුක් නීරෝගිමත් චිරජීවනයකට ස්වේච්ඡා බලසේනාවේ නියේජ්‍ය සේනාවිධායක ඇතුලු සියලුම සාමාජිකයන් මෙසේ සුභ පැතුම් එක්කර සිටින්නෙමු.





















# නව කඳවුරු පරිශ්‍රයට යුධ අවි ස්මාරකයක්

ස්වේච්ඡා බළසේනා මූලස්ථානය නවතමයෙන් ගොඩනැගෙන කඳවුරු පරිශ්‍රයේ අභිමානය විදහා දැක්වෙන පරිදි යුද අවි ස්මාරකයක් ස්වේච්ඡා බළසේනා සේනාවිධායක ගේ මග පෙන්වීම මත ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක ගේ අධීක්ෂණයෙන් යුතුව ඉංජිනේරු සේවා රෙජිමේන්තු සෙබලුන්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකරන ලදී. මෙම යුද අවි ස්මාරකය සදහා මානුෂිය මෙහෙයුමට භාවිතා කළ මිලිමීටර් 130 කාලතුවක්තු අවියක් (අක්‍රිය තත්වයේ පවතින) ස්ථානගත කර මෙම අභිමානවත් වූ ස්මාරකය ඉදිකරන ලදී. මෙම ස්මාරකය ස්වේච්ඡා බළසේනා සේනාවිධායක ලෙස රාජකාරී ඉටුකිරීමෙන් පසු 2019 අප්‍රේල් මස 24 වන දින සිය තනතුරෙන් නික්ම යන මේජර් ජෙනරාල් පීආර්එච් ඩයස් වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිපී ගේ සුරතින් එදින විවෘත කරන ලදී.

එම අවස්ථාවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක, බ්‍රිගේඩියර් පාලන, පුහුණු පරීක්ෂක, බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ නිළධාරී - ආසේමු (බ), ස්වේච්ඡා බළසේනා මූලස්ථාන කාර්ය මණ්ඩලයේ සියලුම නිළධාරීන්, කර්නල් සම්බන්ධීකරණ නිලධාරීන්, රෙජිමේන්තු සම්බන්ධීකරණ නිලධාරීන්, අණදෙන නිලධාරීන් සහ ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ රෙසැමේ ඇතුලු සෙසු නිළයින් මෙම අවස්ථාව සදහා සහභාගී වූහ.




# විරු දිරි හපන්කම් පෙන්වන කෙළිබිම

## ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා තරඟාවලිය - 2019





යුද හමුදා ස්වේච්ඡා බළසේනාව විසින් වාර්ෂිකව සංවිධානය කරන දවැන්තම ක්‍රීඩා සැණකෙළිය වන **ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා තරඟාවලිය - 2019** සමාරම්භක දින උත්සවය ඉකුත් අප්‍රේල් මස 3 වන දින සුගතදාස ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. 21 වන වරටත් පවත්වනු ලැබූ මළල ක්‍රීඩා තරඟාවලියේ සමාරම්භය සනිටුහන් කිරීම ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පැමිණි ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් පීආර්එච් ඩයස් වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී විසින් සිදුකරන ලදී. අති උත්කර්ෂවත් අන්දමින් සංවිධානය කෙරුණ එම අවස්ථාවට ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක, මූලික මාණ්ඩලික නිලධාරි, පුහුණු පරීක්ෂක, බ්‍රිගේඩියර් පාලන, බ්‍රිගේඩියර් භකාස ඇතුළු ස්වේච්ඡා බළසේනා කාර්‍ය මණ්ඩලය හා යුද හමුදා ස්වේච්ඡා ඒකක අයත් සියළු රෙජිමේන්තු නියෝජනය කරමින් ක්‍රීඩා කණ්ඩායම් එක් වූ අයුරු රණවරුණ කැමරා කාචයේ සටහන් වූ අයුරු ..




















අප්‍රේල් මස 03 වන දින ආරම්භ කරමින් පුරා දින තුනක් මුළුල්ලේ පැවති ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා තරඟාවලියේ අවසන් දින සමාප්ති උත්සවය අප්‍රේල් මස 05 වන දින ඉතා උත්කර්ෂවත් අන්දමින් යුධ හමුදාවට හා රටට තව තවත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් රාශියක් දායාද කරමින් නිමාවට පත්විය. ස්වේච්ඡා බළසේනා සේනාවිධායක තුමන්ගේ ආරාධනයෙන් එදින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී සහභාගී විය.

එම අවස්ථාවට ආරක්ෂක සේනා ආඥාපතිවරුන්, යුද හමුදා අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රධානිවරුන්, මධ්‍යස්ථාන සේනාවිධායකවරුන්, ස්වේච්ඡා බළසේනාවේ හිටපු නියෝජ්‍ය සේනාවිධායකවරුන්, විශ්‍රාමික ජ්‍යෂ්ඨ නිළධාරිවරුන්, විද්වත් වෘත්තික නිළධාරිවරුන් සහ නිළධාරිවරියන්, ස්වේච්ඡා බලසේනාව නියෝජනය කොට ජාතික හා ජාත්‍යන්තරය ජයගත් ප්‍රවීන ක්‍රීඩක ක්‍රීඩිකාවන්, ශ්‍රී ලංකා ජාතික මළල ක්‍රීඩා සංගමයේ විනිසුරු මහත්ම මහත්මීන්ද යුද හමුදා ජ්‍යෂ්ඨ සහ කණිෂ්ඨ නිළධාරිවරුන් සහ නිළධාරිවරියන්ද බළඇණි නියෝජනය කරමින් සෙසුනිළයින් විශාල පිරිසක්ද එක්වූහ.

දෙස් විදෙස් කෙළිබිම රනින් බැබළවූ අති දක්ෂ ක්‍රීඩාතරු රැසකට පාර කියන ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා තරඟාවලිය වූ කලී ජව බළ සපිරි ස්වේච්ඡා විරුවන්ගේ අභිමානයේ තෝතැන්නයි. මෙවර අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා ශූරතාවලියේ පිරිමි ශූරතාවය ලකුණු 273 ක් ලබාගනිමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවද, අනු ශූරතාවය ලකුණු 181 හිමිකර ගත් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවද, කාන්තා ශූරතාවය ලකුණු 217 ක් ලබාගත් 4 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායටද, කාන්තා අනුශූරතාවය ලකුණු 173 ක් ලබාගත් 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායද හිමිකර ගත්හ.

ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවට අයත් ආධුණික සෙබළ පියරත්න ජීඒබීඑස් විසින් දුර පැනීමේ ඉසව්වේ (මීටර් 7.86) රන් පදක්කම දිනා ගෙන මළල ක්‍රීඩා ශූරතාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලානය හිමිකර ගන්නා ලදී. 5 වන කාන්තා බළකායේ කාන්තා සෙබළ නදීෂා ලක්මාලි විසින් මීටර් 400 ඉසව්ව තප්පර 54.3 කින් නිමකර එම ඉසව්වේ රන් පදක්කම දිනා ගනිමින් දක්ෂතම ක්‍රීඩිකාවට හිමි කුසලානය හිමිකර ගන්නා ලදී.





යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සුරතින් ජයග්‍රාහකයින් හට ත්‍යාග හා කුසලාන පිරිනැමූ අතර, එහිදී පැරා මළළ ක්‍රීඩකයින් දෙදෙනෙකු වන ආසියානු පැරා මළල ක්‍රීඩා ශූරතාවලියේ ටී42 යටතේ යගුලිය විසිකිරීමේ ඉසව්වේ රිදී පදක්කම දිනා ගත් ලා/කෝ බණ්ඩාර එච්ජීපී ශ්‍රීලංජාආබමු හා ටී42 යටතේ මීටර් 100 තරඟ ඉසව්වේ ලෝකඩ පදක්කම දිනා ගත් ලා/කෝ කීර්ති බණ්ඩාර ශ්‍රීලංජාආබමු ඇගයීමට ලක්කර ඔවුන් හටද ප්‍රණාම සහතික හා කුසලාන ලබාදීමද යුද්ධ හමුදාපති තුමන්ගේ සුරතින් සිදු කරන ලදී.

තවද ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාත්‍යන්තර තරඟ ඉසව් වලට සහභාගිවී ජයග්‍රහන ලබාගත් ස්වේච්ඡා බළසේනාවට අයත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීමට ලක්කර ප්‍රණාම සහතික පිරිනමන ලදී. මෙහිදී ඔලිම්පික් මීටර් 200 ඉසව්වෙන් රිදී පදක්කමින් පිදුම් ලැබූ සුසන්තිකා ජයසිංහ ක්‍රීඩිකාව ඇතුළු ප්‍රවීණ ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසක් ඇගයීමට ලක් කිරීම විශේෂ වූ අවස්ථාවක් විය.

මෙම ක්‍රීඩා තරඟාවලිය ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායකගේ උපදෙස් හා මගපෙන්වීම මත නියෝජ්‍ය සේනාවිධායකගේ අධීක්ෂණයෙන් යුතුව ස්වේඡා බළසේනා මූලස්ථාන කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීම මත ස්වේච්ඡා බළඇණි වල දායකත්වයෙන් ඉතා විචිත්‍රත්වයෙන් යුතුව එදින සන්ධ්‍යායාමයේ නිමාවට පත්වූයේ ක්‍රීඩා තරු ගොන්නක් රටට දායාද කරමිනි.







ස්වේච්ඡා බළසේනාව නියෝජනය කරන ලද ප්‍රවීණ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන්



# සියවසක් ඉක්මගිය අටතිස් වසක අභිමානය


## සංවත්සරය

## 1881 - 2019

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 138 වෙනි සංවත්සරය 2019 අප්‍රේල් 01 දිනට යෙදී තිබිණ. දෙස බස රැස සුරැකීම උදෙසා වූ දීර්ඝ මෙහෙවරක නියැලි ස්වේච්ඡා බළසේනාව මෙවර සිය සංවත්සරය සමරනු ලබන්නේ යුද හමුදාවේ දෙවන විශාලතම සංවිධානාත්මක ව්‍යුහය ලෙසින් වන ආඩම්බරයද පෙරදැරිවය.

ශ්‍රී ලංකාව තුල ස්වේච්ඡා බළසේනා ඉතිහාස කතා කිරීමේදී ක්‍රිːවː 1860 දශකය දක්වා දිව යන්නකි. කන්ද උඩරට ගිවිසුම මගින් ලංකාව බ්‍රිතාන්‍ය පාලනයට නතු වීමෙන් පසු බ්‍රිතාන්‍යයේ විවිධ බළඇණි වරින් වර ලංකාවේ ආරක්ෂක කටයුතුවල නිරත වී ඇත. මෙම කාල සීමාවේදී එනම් 1861 අප්‍රේල් 11 වන දින මාතලේ සහකාර ඒජන්ත කාර්‍යයාලයේදී එවකට සහකාර ඒජන්ත බ්‍රෝඩ් මහතාගේ ප්‍රධානත්වයෙන් ස්වේච්ඡා රයිෆල් රෙජිමේන්තුවක් පිහිටුවා ගැනීම සඳහා සාකච්ඡා කිරිමෙන් පසු එයට අවශ්‍ය අණපනත් කෙටුම්පත් සකසා එය බ්‍රිතාන්‍ය මහරැජින වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඒ සඳහා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ස්වේච්ඡා හමුදාවක් නගා සිටුවීම සඳහා නියෝගය 1862 ජුලි මස 5 වන දින අංක 3326 දරණ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇත. නමුත් එම ගැසට් පත්‍රයේ සඳහන් විවිධ කොන්දේසි හේතුවෙන් සහ වෙනත් හේතූන් මත 1862 වසරේදී රයිෆල් බලකාය නමින් ස්වේච්ඡා ඒකකයක් මාතලේදී ස්ථාපිත වී නොමැත.



Downing Street
1st December 1881

Sir,

I have received your despatch No. 179 of the 13th September last, transmitting for Her Majesty's sanction the Ordinance No. 3 of 1881 entitled "An Ordinance to authorise the formation of Volunteer Corps in this Colony and to provide for the good order and discipline —

Governor
Sir C. Macarthy

and I have to convey to Her Majesty's gracious [illegible]ation and allowance of Ordinance.

I have the honor to be
Sir,
Your Obedient Servant

ලංකාවේ ස්වේච්ඡා හමුදාවක් ආරම්භ කිරීම සඳහා වික්ටෝරියා රැජිනගේ අනුමැතිය ලද බැව් ලංකා ආණ්ඩුකාර සර් චාල්ස් ජස්ටින් මැකාර්තා විසින් දන්වන ලද ලිපිය.




ලුතිතන් කර්නල්
ජෝන් ස්කොට් ආම්ටේජ්

කෙසේ නමුදු ඊට වසර 19 කට පසු ලාංකිකයින් හා සුදු ජාතිකයින්ගේ එකතුවෙන් සිලෝන් වොලන්ටියර්ස් (Ceylon Volunteers) නමින් ස්වේච්ඡා හමුදාවක් 1881 අප්‍රේල් 01 දින රජයේ ගැසට් පත්‍ර අංක 4396 හි 528 පිටුවේ ප්‍රකාරව ලංකාව තුළ ස්ථාපනය කරන ලද අතර, එය මුල්ම පාබල ස්වේච්ඡා බළඇණිය විය. "ලුතිතන් කර්නල් ජෝන් ස්කොට් ආම්ටේජ්" එහි අණදෙන නිළධාරී වශයෙන් පත් කරන ලද අතර, එම බළඇණිය පාලනය වූයේ ලංකා ආණ්ඩුකාරවරයා යටතේය. ලංකා ආණ්ඩුකාරවරයා බ්‍රිතාන්‍ය යටත්විජිත භාර ලේකම් වෙතින් නියෝග ලබාගත් අතර, යටත් විජිත භාර ලේකම් වික්ටෝරියා මහරැජින වෙත වගකිවයුතු විය. මෙම බලඇණිය පාබල බළඇණියක් වූ අතර, එම බළඇණියේ සංවිධානය අශ්වාරෝහක කණ්ඩායමක්, කාලතුවක්කු කණ්ඩායමක්, ගිලන් මැසි කණ්ඩායමක්, ඉංජිනේරු කණ්ඩායමක් හා තූර්ය වාදක කණ්ඩායමකින් සමන්විත වූහ.

1888 දී ස්වේච්ඡා කාලතුවක්කු බළකාය පිහිටුවන ලදුව, අතිරේක ස්වේච්ඡා කාලතුවක්කු කණ්ඩායම් ත්‍රිකුණාමලය, ගාල්ල දිස්ත්‍රික්කවල ස්ථාපිත කරන ලදී. 1892 ජූලි 12 දින අශ්වාරෝහක පාබල කණ්ඩායමක් මහනුවර පිහිටුවනු ලැබීය. මෙය පසුව "ලංකා මවුන්ටඩ් රයිෆල්" බවට පත් විය. යුද හමුදා ව්‍යාපාරයක පෙළඹවීමෙහිලා විද්‍යාලවල ශිෂ්‍යයින් උනන්දු කරවීම සඳහා ශිෂ්‍ය භට බළඇණියක් පිහිටුවීම වැදගත් අනුබද්ධිතයක් වූ අතර, එය පසුව "ලංකා ශිෂ්‍ය භට බළඇණිය" වී අනතුරුව පසු කලෙක "ශ්‍රී ලංකා ශිෂ්‍ය භට බළකාය" බවට පත් කෙරිණි. එසේම මේ අතර තුර කාළසීමාවේදී එනම් 1899 වසරේදී දකුණු අප්‍රිකනු "බූවර්" යුද්ධයට ස්වේච්ඡා හමුදා ඒකකයන්හි සාමාජිකයින් ප්‍රථම වතාවට විදේශ හමුදාමය කටයුතු සදහා සහභාගි කරවා ප්‍රසංසනීය සේවාවක් ඉටුකර ඇත.

1881 දී ආරම්භ වූ ස්වේච්ඡා බළකාය ක්‍රමයෙන් වර්ධනයවී 1910 වන විට බළඇණි කිහිපයක් දක්වා ව්‍යාප්ත විය. එම ඒකක නම් ලංකා ආරක්ෂක කාලතුවක්කු (ගැරිසන් ආටිලරි), ලංකා ඉංජිනේරු, ලංකා අශ්වාරෝහක රයිෆල් (සිලෝන් මවුන්ටඩ් රයිෆල්), ලංකා පාබල, ලංකා වැවිලිකරු රයිෆල්, ලංකා යුද හමුදා සේවා සහ ලංකා වෛද්‍ය යන ඒකක වේ. මෙම ස්වේච්ඡා ඒකකයන් තුල විධිමත් පාලනයක් හා විනයක් පවත්වා ගැනීම සදහා 1910 අංක 08 දරණ ආඥාපණත යටතේ වර්ෂ 1910 දී ලංකා ආරක්ෂක බළසේනාව පිහිටුවන ලදී.

ඉතිරිය - 38 පිටුවේ ...



# පය ඇඳි බිම
# ළය රැඳි මතක ...

**දශක තුනක යුද්ධය නිමවී වසර 10 කට ආසන්නය. නිදහස හා සාමයේ ප්‍රතිලාභ භුක්ති විඳිමින් සමස්ථ රටවැසියන්ම සිය ජීවන අරගලයන්හි නිරතව සිටින අතර තුර රණවිරුවෝද එතෙක් කළක් තම අතරැඳි ගිනි අවි පසෙකලා නිහඬ මෙහෙවරක නියැලී සිටිති. එවක සටන් පැවති උතුරු නැගෙනහිර බිම්කඩ පුරා ඇරඹි සංවර්ධන සංග්‍රාමයේ ප්‍රතිඵලයෙන් එහි පෙර වූ යුද්ධයේ නටඹුන් සහමුලින්ම මැකී ගොස්ය.**

**සියල්ල එසේ වුවද රණබිමෙහි මානුෂිය ගුණ රැඳි මතක සටහන් එලෙස මැකී යා නොදී සමාජගත කිරීම කාලීන අවශ්‍යතාවක් සේ හැඟේ. රණවිරුවන් සතුව තිබූ වීරත්වය, දේශානුරාගය, බිය සැක දුක වේදනාව සතුට හමුවේ ඔවුන් ජීවිත වලට මුහුණ දුන් අපූරුවද එකී මතක සටහන් විශ්ලේෂණය කිරීමේදී කදිමට විද්‍යාමානවේ. "පය ඇඳි බිම ළය රැඳි මතක" තුළින් දිගහැරෙනුයේ එදවස රණබිමේ සැඟවුන සුන්දර කතන්දරයි ...**

මඩකලපුව දිස්ත්‍රික්කයේ වන්දාරමුල්ල ප්‍රදේශයෙහි එවක මා රාජකාරී කරන අවදියයි. මාගේ මතකයට අනුව එය 1993 වසර හෝ ඊට ආසන්නය. ඒ වන විට දෙවන ලුතිතන් වරයෙකු වූ මා යුද හමුදාවට බැඳී වසර එකහමාරකට වැඩි නොවීය. මා සිටි කඳවුර පිහිටා තිබුනේ පොළොන්නරු මඩකළපු මාර්ගයේ හමුවන වන්දාරමුල්ල හංදියෙන් දකුණු දෙසට තිබූ අතුරු මාවතක කෙළවරට වන්නටය. වෙල්යායක් අද්දර පිහිටි එම කඳවුර මගින් සිදුකෙරුනේ එවක තොප්පිගල තාරාවිකුලම් ප්‍රදේශයේ රැඳී සිටි යුද හමුදා භට පිරිස් වෙත ආහාර පාන හා වෙනත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීමේදී ආරක්ෂාව ලබා දීමයි.

එවක විවිධ අවශ්‍යතා සඳහා මා යාබද "සිත්තාණ්ඩි" හා "චෙංකලඩි" යන ප්‍රදේශ වල පිහිටා තිබූ හමුදා කඳවුරු වෙත නිරතුරුව යාම් ඊම් සිදුකරන ලදී. එසේ යන අවස්ථාවලදී සුලභව යොදාගත්තේ කඳවුර අසලින් වැටී ඇති මාවතයි. වන්දාරමුල්ල කෝවිල අසලින් වූ දෙමළ ගම්මානයක් හරහා වැටී තිබූ එම මාවත නිරතුරු ජනාකීර්ණ ස්වභාවයක් ඉසිලීය. එම ගම්මානයේ මැදට වන්නට පාර අද්දර තල් අතුවලින් ආවරණය කල වැටකින් යුත් කටුමැටි ගැසූ කුඩා නිවසක් විය. එහි ඉතා සුන්දර යුවතියක් වූ අතර ඇය එවක පාසල් විය ඉක්මවූ අයෙකු වූවාය. මා දැන සිටි තරමට එම නිවසේ වයසක දෙපලක් පමණක් සිටි අතර ඔවුහු ඇගේ ආච්චි හා සීයා වූහ. දිවා කාළයේ යාබද ගඩොල් පෝරණුවක වැඩට යන එම දෙපල සවස් යාමයේ නැවත පැමිණෙන තෙක් ඉහත කී යුවතිය සිය කුඩා බාල සොහොයුරා බලා ගනිමින් තනිව නිවසේ උන්නාය. මා ඇ දුටු කාළසීමාව පුරාම ඇගේ දෙමව්පියෝ ඇස නොගැටුනහ. ඔවුන් මියගොස්ද එසේ නොමැති නම් දරුවන් අතහැර දමා ගොස්ද යන්න පිළිබඳව මා හට තොරතුරු නොවීය. කෙසේ හෝ ඇය හුදකලාව බොහෝ දරිද්‍රතා මැද තම ජීවිතය ගෙනයන්නට උත්සාහ දරණ බව පමණක් මට හැඟුණි.

රාජකාරී අවශ්‍යතා මත භට පිරිස් සමග නිවස අද්දරින් යන එන මා හට ඉඳහිට ඇ දක්නට ලැබුණද ලැජ්ජාශීලිව පෑ මඳ සිනහවක් හැරෙන්නට අන් ප්‍රතිචාරයක් ඇගෙන් නොලද්දෙමි. ජීවිතයේ බොහෝ දුක්ඛ දෝමනස්සයන් හංගා ගෙන හිරිමල් යෞවනයෙන් වන්දි ගෙවන ඇ පිළිබඳව මා තුළ හට ගත්තේ අනුකම්පාවකි.

එම කාලවකවානුවේ පැවතියේ යුධමය පරිසරයකි. එනිසාම සැකය, අවිශ්වාසය, බිය රැඳි හදවත් නිරතුරුවම ගැහෙමින් පැවතිණ. එවක ත්‍රස්තවාදීන් හා යුද හමුදාව අතර

**ඉතිරි කොටස 46 පිටුවට ..**

# මාලිමාව





**පසුගිය කළාපයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය දෙසට යොමු වූ "මාලිමාව" මෙවර යොමු කරනුයේ ලංකාවේ සුන්දර තේ වතුයායක අපූර්ව වූ සෞන්දර්ය අශ්වාදයක් විඳිය හැකි අතිශය මනරම්, හපුතලේ "ලිප්ටන් සීට්" වෙතටය.**

ලංකාවේ සුන්දර තේ වතුයායක අපූර්ව වූ සෞන්දර්ය අශ්වාදයක් විඳිය හැකි අතිශය මනරම්, ඒ වගේම ලංකාවේ පළාත් 9 න් 5 ක්ම එකම ස්ථානයේ සිට නැරඹිය හැකි ලංකාවේ එකම ස්ථානය ලෙස හපුතලේ **ලිප්ටන් සීට්** හඳුන්වන්නට පුළුවන්.

මේ ස්ථානය ලංකාවේ බොහෝ අය දන්න තැනක් වුණාට ලංකාවේ අයට ලංකාවේ දේ අගය නැහැ කියනවා වගේ හපුතලේට ආවත් මේ ස්ථානය මග හරිනවා. මොකද කිලෝ මීටර් හතක් විතර පයින් යන්න අපේ අය කැමති නැහැ. විදේශිකයන්නම් මේ ගමන යන්න ප්‍රියකරන්නේ පයින්. මොකද තේ වතු මැද්දෙන් කෙටි මාර්ග භාවිතා කරමින් යන මේ ගමනේදි මේ පරිසරයේ ආශ්වාදය, සුළඟ, සුන්දරත්වය උපරිමයෙන්ම විඳින්න පුළුවන්. ගමන දුෂ්කරයි. දුරයි. හැබැයි සුන්දරයි. හමන සීතල සුළඟ ඇඟේ දැවටෙද්දි ගතට මහන්සියක් දැනෙන්නේම නැතිතරම්.

මෙය අතිශය මනරම් ස්ථානයක් ලෙස නිර්මාණය වෙන්නේ විශිෂ්ට වැවිලිකරුවෙකු වුණ ලිප්ටන් තෝමස් කියන බ්‍රිතාන්‍ය ජාතිකයාගේ නිර්මානයක් ලෙසය. ව්‍යාපාරිකයෙකු මෙන්ම සෞන්දර්යවාදියෙකු වුණු ලිප්ටන් මහතා උදෑසන මෙන්ම සන්ධ්‍යා කාලයේදීද කඳුවැටියෙන් පහළ දිස්වන සොබා සෞන්දර්යයේ මිහිර විඳිමන් මෙම ස්ථානයේ ගතකල බවට ඉතිහාස තොරතුරුවල සඳහන් වනවා. ඔහු මේ ස්ථානයට බොහෝ ප්‍රිය නිසාවෙන්ම ලිප්ටන් තෝමස්ව සිහි වීමට මෙම ස්ථානයේ ඔහුගේ පිළිරුවක් ද නිර්මාණය කර තිබීම මේ ස්ථානයට තවත් සුවිශේෂත්වයක් ගෙන දෙන්නක්.

කඳු නිම්න තුනක් එකිනෙකට හමුවන කඳු මුදුනේ කාලය ගත කිරීමට හුරුව සිටි ලිප්ටන් තෝමස් ලංකාවේ ජීවත් වූ සෑම කාල වකවානුවකම සැන්දෑ සමයේ තම විදේශීය, දේශීය මිතුරන් සමඟ මේ ස්ථායේ විවිධ වූ සාද පැවැත්වූ බවද තොරතුරුවල සඳහන් වෙනවා. ඒ වගේම ලිප්ටන් තෝමස් සවස් යාමයට මේ ස්ථානයේ තමන්ගේ වතු නිවෙස්වල ජීවත් වන යොවුන් තරුණ තරුණියන් සමඟ විනෝද වූ බවත් එදා වතු සංස්කෘති අංගයක් වුණු ඉඩම් දේපල පමණක් නොව එහි ජීවත්වූ සතා සිව්පාවද, ගහ කොළ ඔහුට අයිති දේපලක් ලෙස ලිප්ටන් විසින් පාලනය කළ බව ද සඳහන් වෙනවා.



1864 ලිප්ටන් තෝමස් කැබින් බෝයි කෙනෙකු ලෙස සේවය කළ අතර පසුව ගණකාධිකාරිවරයෙකු, පොත් තබන්නෙකු, ගෙයින් ගෙට ගොස් භාණ්ඩ අලෙවි කරන්නෙකු ලෙස සේවය කර අවසානයේ සහකාර තේ පරීක්ෂකවරයෙකු ලෙස ද නිව්යොක් හි සේවය කර ඇති බව සඳහන් වේ.

1880 දී ලිප්ටන් මහතා ලංකාවට පැමිණෙන්නේ ලංකාවට තේ වගාව හඳුන්වා දුන් ජේම්ස් ටේලර් මහතාගේ ව්‍යාපාර කටයුත්තකට දායක වීම සඳහාය. එලෙසින් ලංකාවේ තේ වැවිලි ව්‍යාපාරය සමඟ සම්බන්ධ වූ ලිප්ටන් නම් තේ වර්ගය ලංකාවට හඳුන්වා දෙමින් දඹේතැන්න වත්ත, දඹේතැන්න තේ කර්මාන්තශාලාව හරහා සිලෝන් ටී තේ පානය ලොවට හඳුන්වා දී ඇත. එතැන් පටන් ලංකාවේ තේ වගාවේ ප්‍රමුඛතාවයක් ගැනීමට ඔහු සමත් වීම නිසා එදා එංගලන්තයේ බොහෝ දෙනෙක් කැමැත්තක් දක්වූයේ ලිප්ටන් මහතාගේ තේ වතුවලින් නෙලාගත් නැවුම් තේ දල්ලේ රසයටය.

පුනාගල කඳුයායේ ලිප්ටන් මහතා සතු අක්කර 2500 ක භූමි ප්‍රමාණයක තේ වගාව පැතිරී තිබෙනවා. මෙම තේ වතුයායේ සුන්දරම ස්ථානය මුහුදු මට්ටමේ සිට උස අඩි 6300 උසකින් යුත් ලිප්ටන් සීට් නම් මෙම කඳු මුදුනයි. මීදුමෙන් වෙලාගෙන සිටින මෙම කඳු පන්තියට මීදුම නොමැති දවසක පැමිණීමට නම් වාසනාවක් තිබිය යුතුමයි. මන්ද **ඌව, සබරගමුව, දකුණ, නැගෙනහිර සහ මධ්‍යම** පළාත පැහැදිලිව දැකගන්න ලැබෙන්නේ මීදුම නැති දවසක මේ ස්ථානයට ගියොත් පමණි.

මධ්‍යම පළාතේ නුවරඑළියත්, සබරගමුව පළාතේ ශ්‍රී පාදයත්, නැගෙනහිර පළාතේ මඩකළපුවත්, දකුණු පළාතේ වරායත්, ඌව පළාතේ බදුල්ලත් ඉතා සුන්දරව මේ ස්ථානයේ සිට දැක ගන්න පුළුවන්.

ඒ වගේම සවස් යාමට මීදුම් නොමැති නම් දෙවිනුවර ප්‍රදීපාගාරයේ ආලෝකය මෙන්ම ත්‍රිකුණාමලේ හා කිරින්ද ප්‍රදීපාගාරයේ ආලෝකය ඉතා පැහැදිලිව මේ ස්ථානයේ සිට දැකගැනීමේ වාසනාව ලැබෙනවා. ලිප්ටන් සීට් යෑමට මාවත් දෙකක් තිබේ. හපුතලේ සිට දඹේතැන්න හරහා වැටී තිබෙන සුන්දර කඳුවැටි අතරින් දිවෙන මාර්ග යෙන් සහ එහෙමත් නැත්නම් බණ්ඩාරවෙල, පූනාගල පාරේ නායබැද්ද වත්ත මැදින් වැටී තිබෙන මාර්ගයෙන්



මේ ස්ථානය සඳහා ලඟා විය හැක. මෙහි කිලෝ මීටර් 6 ක් පමණ දුරක් යෑමෙන් ලිප්ටන් සීට් වලට ළඟාවෙන්න පුළුවන්. මේ පාරවල් දෙකෙන්ම වැඩිපුරම ලස්සන මොකක්ද කියලා කියන්න අමාරුයි. මොකද පාරවල් දෙකම අතිශය සුන්දර කඳුවැටි තේ වතු වලින් මැදි වුණ මාර්ගයන් නිසා.

ලිප්ටන් සීට් නැරඹීමට යනවා නම් "කැතරින් සීට්" යන්නත් අමතක කරන්න එපා. ලිප්ටන් සීට් ආවොත් තවත් සැතපුම් හතරක දුරින් තවත් සුන්දර ස්ථානයක් තිබෙනවා. ඒ තමයි "කැතරින් සීට්" කැතරින් කියන්නේ ලිප්ටන් මහතාගේ විවාහක බිරිඳ. තමන්ගේ ස්වාමියා ලිප්ටන් යොවුන් තරුණියන් සමඟ විනෝද වන විට කැතරින් ඊට මඳක් දුරින් පිහිටා තිබෙන ස්ථානයකට ගොස් දුකින් කල් ගත කළ බවට විශ්වාසයක් පවතිනවා. ඒ ස්ථානය අද "කැතරින් සීට්" ලෙස හඳුන්වා තිබෙනවා. දඹේතැන්නට එනවා නම් ලිප්ටන් සීට් විතරක් නෙවෙයි කැතරින්ගේ අසුනත් දැක බලා ගැනීමට අවස්ථාව තිබේ.

**උපුටා ගැනීම - අන්තර්ජාලය ඇසුරෙනි.**





# කෙටි කතාව

## ළයට ලෙය ද ලෙයට ළය ද

ජීවිතය කියන්නෙ මොකක්ද කියල හිතන කොට ඒ ජීවිතය ජීවත් වෙලා තියන්නේ හුස්ම පොදකින් කියලා හිතුනහම මේ ජීවිතය මොකක්ද කියලා හිතෙනවා සත්තමයි.

මේ කතාව කියවන කෙනෙක්ට හිතෙයි මේක කෙටි කතාවකට ගැළපෙන ප්‍රස්තුතයක් ද කියල. හැබැයි හොඳට හිතලා බැලුවොතින් හැමෝටම පෙනෙයි මේ ජීවිතේම කෙටි කතා ගොඩක එකතුවක් කියල.

ඒ කතා සිද්ධි අපි කැමති විදිහට ඕන විදිහට වෙනස් කරන්න පුළුවන් නම් අද මම මේ විදිහට කතාවක් ලියන්න අකුරු ගැට ගහන්නෙ නැහැ. මොකද මේ තමයි ජීවිතයේ යථාර්තය. මිනිසුන්ගේ ඉරණම. අපිට ඒ දේවල් වෙනස් කරන්න බැහැ.

ඒ නොහැකියාව තුළ තියන්නේ හිස් බවක් පාළුවක් අවසානයේ කඳුළක්.

ඔහුගේ නම ............ (හිස්තැනක්) මොකද මම කැමති නැහැ ඒ හිස්තැනට ඇත්ත නමක්වත් මනඃකල්පිත නමක්වත් ගොනු කරන්න. මොකද ඒ හිස්තැන මේ වන කොට හිස්තැනක් නිසා.

ජීවිතය සුන්දරව පටන්ගන්න ඒ මිනිසාටත් අවශ්‍ය වුණා. ඒ ජීවිතය අලුත් කරන සමාජය විසින් භාර ගෙන තිබුණ ආත්මයෙන් ආත්මයේ පතාගෙන එනවයි කියන විවාහයට ඒ මිනිසත් පය තිබ්බා ඒ යුවතිය සමඟ.

ජීවිතය නැවුම් කරන්න, සුන්දර කරන්න, මේ ලෝකයට අළුත් ජීවිත බිහිකරන්න, ඒ ජීවීන්ගේ හැකියාවන්, දක්ෂතාවයන් බලලා සිත සතුටින් පුරවා ගන්න, අවසානයේ ආත්තම්මා, සීයා කියන නාමයෙන් මේ මහ පොළවේ සැඟවෙන්න ඒ දෙදෙනාගෙම හදවත් වල තිබුණු පැතුම වෙන්න ඇති.


යුවතිය ගැහැණිය වුණා. තරුණයා පිරිමියෙක් වුණා. දෙදෙනාම මව්පියන් වුණා. කාලය හෙමින් හෙමින් ඊටත් හෙමින් ගලා ගෙන ගියා.

දියණියගේ සුරතල් මවට, පියාට එක වහලක් යටට වෙලා සුන්දරව විඳින්න නොහැකි වුණා. ජීවිත වලට මහ කුණාටුවක් හැමුවා. ඒ මව පියා වෙන් වුණා. හැබැයි සම්මත දික්කසාදයෙන් නොවෙයි. ඔවුනොවුන්ගේ හදවත් වල දික්කසාදයෙන්.

ඇය තම දියණිය රැගෙන තම නිවස බලා ගියා. ඔහු තම බිරිඳ හා දියණිය සමඟ සිටි කුළී නිවසින් තම නිවස බලා ගියා. සිතුවිලි ධාරාවෙන් උපන් ඒ සුන්දර කැදැල්ල මේ විශ්ව ශක්තිය තමන්ගේ කර ගත්තා. මේ වචන ගළපන කොට මේ හැමදෙයක්ම මං මාගේ කනින් අහපු දේවල් නිසා මීට වඩා යථාර්ථයක් එනම් ඇත්තක් ඒ ජීවිත වෙන්වෙන්න හේතු වෙන්න ඇති. හැබැයි මේ මා දන්නා අන් අය විසින් දන ගත් සත්‍ය.
ඇය තම දියණිය පෝෂණය කළා. තම පියා බැලීමට ඔහුගේ මහ ගෙදර දියණිය යැව්වා. දියණිය තම පියාට ආදරය කළාද ? අප්පච්චි කියලා හදවතින්ම නැගුණ ස්වරයක් ද? මං දන්නේ නෑ ඇයට අවශ්‍ය වන්නට ඇති තම මව පියා සමඟ එක වහලක් යට ජීවත් වෙන්න. නමුත් ඇයට තම මව ඒ සඳහා කැමති කර ගන්නට නොහැකි වන්නට ඇති. මොකද මම ඒ නිසයි මේ කථාවට පණ දෙන්නේ. ඇය එනම් ඔහුගේ විවාහක බිරිඳ රජයේ රැකියාවක් කළ අයෙක්. ඔහු රියදුරෙක්. ඔහු ජීවිතය ජීවත් කිරීමට උත්සහ කළ කෙනෙක්ද? මට පෙනුණ විදිහට නම් නැහැ.

ඔහු තම ජීවිතය මත්පැන් වලට භාරදුන් අයෙක්. ජීවිතයේ අර්ථය සොයන්න ඔහු තම සිතුවිලි මත්පැන් මත වැළලූ අයෙක්. ඔහුගේ බිරිඳ පවසන්නේ මත්පැන් වලට ඔහු වහල් වූ නිසා ඔහු සමඟ ජීවත් වීමට නොහැකි වූ නිසා ඔහු දමා දරුවා රැගෙන ගිය බවයි. නමුත් එය බිරිඳකට උචිතද ? ඇයි, ඇයට නොහැකි වුණේ තම සැමියා නිවැරදි මාර්ගයට ගැනීමට. එසේ හැකි වුණා නම් ජීවිත තුනක් මේ ලෝකයේ සුන්දරත්වය විඳිනවා.

ඔහු, ඇය, දියණිය ජීවිතය ගෙව්වා. ඔහු වසර 52 ක් තම ජීවිතය ජීවත් කළා. ඒ වසර පනස් දෙක තුළ ඔහු හඬා වැටුණා ද කියලා මං දන්නේ නෑ. ඇය හඬා වැටුණා ද කියලා මං දන්නේ නෑ. දියණිය හඬා වැටුණා ද කියලා මං දන්නේ නෑ. හැබැයි ඔහුගේ හදවත තුළ පසුතැවිල්ලක්, කණගාටුවක් තිබුණා කියලා අවුරුදු පහළොවක් ඔහුව හඳුනන මා හට සිතෙනවා. අරක්කු බෝතලයට, සිගරට් එකට ඒ මිනිසා ජීවිතය වහල් කරලා තිබුණේ. ඒ වහල් බවෙන් නැගී සිටීමට මිනිසුන් ඔහුට උපදෙස් දුන්නත් ඔහු එය කනකට මායිම් කලේ නැහැ. සමහර විට ඔහුට



හිතෙන්න ඇති මෙයයි ජීවිතය කියලා. ඔහු තම දියණිය හමු වුණා. දියණිය ඔහු හමු වුණා. එයට කිසිදු බාධාවක් තිබුණේ නැහැ. හැබැයි ඇය ඔහුව හමු වූවාද කියා පැවසීමට මා දන්නේ නෑ.

ජීවිතය කියලා දීලා. ආදරයට ආදරය දුන්න ද කියලා මං දන්නේ නැහැ. හැබැයි ඔහු 2015.02.24 දින ජීවිතය පණ පොවන්නේ සුසුමෙන් කියන ඇත්තට සාක්ෂි දීලා ඒ හුස්ම මේ මහ පොළවට එකතු කළා.

මරණ පරීක්ෂණයට අනුව ඔහුගේ සිරුර අභ්‍යන්තරය බොහෝ ලෙස විනාශ වෙලා වෛද්‍ය වාර්ථා වලට අනුව අක්මාව දිය වෙලා. ඒ දියවීම අරක්කු, සිගරට් වල ප්‍රතිඵල කියලා ඔබත් හිතනවා ඇති. ඔව් මාත් හිතන්නේ, අන් අයත් හිතන්නේ ඒ සිතුවිල්ලයි.

ජීවිතයට නැවතීමක් තිබ්බ ඔහුගේ ඒ නම, ඒ රූපය දැන් වෙන කොට අන් පිරිසකගේ මනසේ තියෙනවාද කියලා මං දන්නේ නැහැ. හැබැයි ඒ හුස්ම, ඒ කටහඬ දැන් මේ ලෝකයේ නැහැ කියලා නම් මං දන්නවා.

ඔහුගේ මරණයට ඇය පැමිණියා. ඔහුගේ දියණිය පැමිණියා. අප්පච්චී කියලා ඔහු වැතිරී හිටපු පෙට්ටිය පාමුළ ඉඳන් ඇය තම පියාගේ කකුල් දෙක අල්ලා ගෙන ඇඬුවා.

නමුත් ඔහුගේ ඒ බිරිඳගේ දෑසින් කඳුළු බිඳුවක්වත් වැක් කෙරුණේ නැහැ. ඇයගේ ඉදිරියේ ඔහුගේ සොයුරියන් හඬා වැළපෙමින් ඇයගෙන් ඇහුවා ඇයි ඔයාට දුක නැද්ද කියලා. නැහැ ඒත් ඇයගේ දෑසින් කඳුලක් වැටුණේ නැහැ.

ඇය ගියා. දියණිය ගියා. ඔහු තම සිරුරේ රශ්මිය මේ වාතයට මුසුකළා. කාලය ගෙවුණා. දැන් 2018 වසර. වසර තුනක් ගෙවිලා මේ කතාව ලියන්න හේතුව මේ වසර තුළ සිදුවන දෙයයි.

ඔහුගේ දියණියට අසනීපයි. ඇය දැන් වයස අවුරුදු 24 ක් වන තරුණියක්. ඒ අසනීපය තුළ ඇත්තේ අසාධ්‍යයක්. ඇයගේ මව පවසන්නේ ඇයගේ රෝගය බරපතළ බවයි. වෛද්‍යවරුන් ද ඒ බව සනාථ කරන්න ඇත.

නමුත් මවක් ලෙස ඇගේ හඬේ දුකක්, කණගාටුවක් නැති බවයි මට හැගුණේ. නමුත් හදවතේ කඳුළැලි තියෙනවා වෙන්න පුළුවන්.

මේ අකුරු වචන එකතු කරලා මේ කතාව මම ලියන්නේ 2018.10.25 වන දිනයේයි. ඔහුගේ දියණිය තම අවසන් හුස්ම මේ වාතයට එක් කරන්න ළඟයිදෝ කියලා මට හිතෙනවා. මට විතරක් නොවෙයි අන් අයටත්, ඇගේ මවටත්, ඇයටත් එය හිතෙනවා ඇති. ඒත් එහෙම නොවන්න කියලා මං ප්‍රාර්ථනා කරනවා.

ඇයගේ රෝගය මොකක්ද කියලා දැන ගත්තහම මට විතරක් නෙවෙයි අන් අයගේ ද හදවතට අමුතු හැගීමක් ඇති වෙන්න ඇති.

ඇයට අක්මාවේ රෝගයක්. ඇය මේ වන විට රෝහලේ ඇඳක් උඩට වී තම තරුණ ජීවිතය ජීවත් කරන්න උත්සාහ කරනවා ඇති. මේ ජීවිතය මොකක්ද? අපි ඒ දේට පණ පොවන්න ඕනේ අන් අයට ඕන විදිහටද? ඔහුට, ඇයට, දියණියට සිදු වුණේ මොකක්ද? ඒ දෙයට වගකිව යුත්තේ කවුද?

මා දන්නා විදිහට, මට හිතෙන විදිහට මේ ජීවිත වලට මෙවැනි දෙයක් අත්වීමට සැලැස්සුවේ ඔහු සහ ඇය. තම ජීවිතය තුළ ඇති වූ ප්‍රශ්න වලට හොඳ විසඳුමක් ඔවුන් දෙදෙනා සොයා ගත්තා නම් ඔවුන් දෙදෙනා තම පවුල විනාශ නොකර ගෙන සිහිබුද්ධියෙන් යුතුව ජීවිතය ජීවත් කරවන්න උත්සහ කළා නම් මම මේ අකුරු, වචන එකතු කරලා මේ පිටු අතරේ මේ කතාව ලියන්නේ නැති වෙයි. මොකද ලියන්න මට කතාවක් නැති නිසා. ඔහු තම ජීවිතයට අකාලයේ සමුදුන්නා දියණිය ජීවිතය මරණය අතරින් කොතැනට තමන් හට යාමට සිදු වේද කියලා ජීවත් වෙනවා. ඇය තම ජීවිතය තුල අතරමං වෙලා. තම දරුවාව ජීවත් කරන්න උත්සහ කරනවා.




ඒ උත්සාහ කිරීම ඒ විදිහටම පැවතෙන්න. දියණියට ජීවිතය ජීවත් කරන්න හැකිවෙන්න, මම මේ කතාවට නැවතීමේ තිත තියන්න කැමති ඒ සිතුවිල්ලෙන්. මම මේ කතාව දැන් නවත්වනවා. මට මේ නැවතීමේ තිතට තිත තියලා නැවත ඒ තිතට දකුණින් අකුරු එක් කරලා මේ කතාව දික් කරන්න නොලැබෙන්න කියලා මං ප්‍රාර්ථනා කරනවා.

**ඉරක් ඔහු**
**සඳක් ඇය**
**තරුවකි ඒ**
**ඉරට සහ සඳට**
**එක් වුණා**
**ඉරද වැරදි**
**සඳද වැරදි**

**ඉරට හා සඳට**
**තරුව සමඟින්**
**එක්ආකාසයේ පෑයීමට**
**නොහැකි වූ දින**
**ඉර වෙන් වුණා**
**සඳ තරුව සමඟ**

**දුර ගිය**
**ඉරත් ඉකිබින්දා ද**
**සඳත් ඉකිබින්දා ද**
**තරුව ඉකි බින්දා ද**
**නොවේමද**

**ඉර නැති වුණා**
**ඒ මතක දුර ගියා**
**තරුව හඬනවා**
**සඳ තරුව රකිනවා**
**තරුව සොයනවා**
**ඒ වියකෙන රශ්මිය**
**සඳ පතනවා**
**ලබා දෙන්නට**
**තරුවට**
**ඒ වියැකෙන රශ්මිය**



**ආර්එම් හිමාෂි අංජලිකා සිසුවිය**
**මහනුවර මහාමායා බාලිකා විදුහල.**

**(1 වන ශ්‍රී ලංකා රයිෆල් බළකායට අයත් බනි II නන්දසේන ආර්එම්සී ගේ දියණිය)**

# ඔබ දැනුවත්ද ...?

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා රක්‍ෂණය

### හැඳින්වීම

මෙය ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සාමාජිකයින්ගේ සුභසාධනය උදෙසා සී/ස ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව සමඟ 2005 වර්ෂයේදී ආරම්භකර එතැන් සිට වාර්ෂිකව පවත්වාගෙන යනු ලබන රෝහල් ගත/සැත්කම් ගාස්තු හා පුද්ගල හදිසි අනතුරු රක්‍ෂණ යෝජනා ක්‍රමයක් වේ. ස්වේච්ඡා බලසේනාවේ සාමාජිකයන්ට අමතරව ස්වේච්ඡා බලසේනාවට අනුයුක්තව රාජකාරි කරනු ලබන නිත්‍ය බලසේනාවේ නිලධාරීන් හා සෙසු නිලයින්ද ස්වේච්ඡා බලසේනාව වෙත සක්‍රිය සේවයට කැඳවා ඇති ජාතික ශිෂ්‍යභට බළකායේ නිලධාරීන්/නිලධාරිණියන් හා ස්වේච්ඡා බලසේනාව යටතේ රාජකාරි කරනු ලබන සිවිල් සේවක මහත්ම මහත්මීන්හටද මේ සඳහා දායක විය හැක.

### රක්‍ෂණාවරණයේ අරමුණ

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේවයේ නියුතු නිලධාරීන්/සෙසුනිලයින්ගේ සුභසාධනය හා මෙමඟින් ලැබෙන අනුග්‍රහකත්වය මත මූල්‍යාධාර ප්‍රදානෝත්සවය සඳහා මූල්‍යමය ප්‍රතිලාභ ලබාගැනීම හා ස්වේච්ඡා බලසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා/කණ්ඩායම් ක්‍රීඩා ශූරතාවලීන් පැවැත්වීම වැනි බාහිර ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහකත්වය ලබා ගැනීම.

### සාමාජිකත්වය

මෙම රක්‍ෂණ යෝජනා ක්‍රමයෙහි සාමාජික මුදල වරින් වර සංශෝධනය වන අතර 2018 -2019 රක්‍ෂණ වර්ෂය සඳහා රු: 3120.57 වේ.

### ප්‍රතිලාභීන්

- විවාහක සාමාජිකයින් - සාමාජිකයා සහ ඔහුගේ/ඇයගේ බිරිඳ/ස්වාමි පුරුෂයා/අවුරුදු 21ට අඩු අවිවාහක රැකියාවක් නොකරන දරුවන් වන අතර, එයට අමතරව පියා/මව, කාලාත්‍රයාගේ මව හෝ පියා මියයාමේදී මරණාධාර ගෙවීම්.
- අවිවාහක සාමාජිකයින් - සාමාජිකයා සහ ඔහුගේ මව සහ පියා (දෙමාපියන්ගේ වයස් සීමා නොමැත)

### ආවරණ කාලය

2018.12.01 දින සිට 2019.11.30 දින දක්වා

### ප්‍රතිලාභ

#### රෝහල් හා සැත්කම් ගාස්තු රක්‍ෂණය

| | | |
|---|---|---|
| 1. | පවුල් ඒකකයක් සඳහා වර්ෂයට | රු: 300000.00 |
| 2. | එක් වරට ඉල්ලුම් කල හැකි උපරිමය | රු: 250000.00 |
| 3. | පුද්ගලික රෝහල් නේවාසික ගාස්තු හා සාත්තු නිවාස දෛනික කාමර ගාස්තු **(රු: 3,500.00 බැගින් උපරිම දින 20 ක් සඳහා)** | රු: 70000.00 |
| 4. | රෝහල් හා ශල්‍යාගාර භාවිතා කිරීමේ ගාස්තු ඖෂධ හා ප්‍රතිකාර වියදම් | රු: 70000.00 |
| 5. | ශල්‍ය වෛද්‍ය නිර්වින්දන ගාස්තු/විශේෂඥ වෛද්‍ය ගාස්තු | රු: 60000.00 |
| 6. | පරීක්‍ෂණ ගාස්තු X කිරණ පරීක්‍ෂාව සහ ස්කෑන් පරීක්‍ෂාව | රු: 20000.00 |
| 7. | ගාස්තු නොගෙවන රජයේ රෝහලකින් ප්‍රතිකාර ලැබූවිට ගෙවනු ලබන දෛනික දීමනාව දිනකට රු: 1000 බැගින් උපරිම දින 30 ක් සඳහා **(යුද්ධ හමුදා රෝහල් සඳහා ගෙවීම් සිදුකරනු නොලැබේ)** | රු: 30,000.00 |
| 8. | සාමාන්‍ය දරු උපත් **(රජයේ රෝහලක නොගෙවන වාට්ටුවක)** | රු: 7,500.00 |
| 9. | සිසේරියන්/ස්වාභාවික නොවන දරු උපත් **(රජයේ රෝහලක නොගෙවන වාට්ටුවක)** | රු: 10,000.00 |
| 10. | නිවුන් දරු උපතකදී (8) සහ (9) හි දක්වා ඇති මුදලට අමතරව | රු: 10,000.00 |
| 11. | සාමාන්‍ය දරු උපත් **(පෞද්ගලික රෝහලකදී)** | රු: 40,000.00 |
| 12. | දරු උපතකදී දින 05 කට වඩා රෝහල්ගතවී සිටී නම් 06 වන දින සිට දින 05 ක් දක්වා දිනකට රු:500.00 බැගින්. | |

සිසේරියන්/ස්වාභාවික නොවන දරු උපත් (පුද්ගලික රෝහල්) සඳහා ගෙවීම් අවසාන ගලපන ලද බිලෙන් 75 % ගණනය කල වටිනාකමට සාමාන්‍ය දරු උපතක් සඳහා මුදල වූ රු: 40000.00 එකතු කර හිමිකම පියවනු ලබන්නේ ගණනය කල බිල්පතේ වටිනාකමට යටත්වය.

13. ඇස් කණ්නාඩි ආවරණය (වසරක් හැර වසරක් සාමාජිකයාට පමණි) රු: 8,500.00

14. ඇසෙහි සුද ඉවත් කිරීමේ ශල්‍යකර්මය සඳහා අවශ්‍ය කාච සඳහා ආවරණය රු: 20,000.00

15. බාහිර ප්‍රතිකාර ආවරණය දන්තමය ප්‍රතිකාර (දත් ගැලවීම සහ පිරවීම) ඇස් පරීක්ෂාව සහ කායික චිකිත්සාව ඇතුළුව රු: 17,500,000.00

බාහිර ප්‍රතිකාර සඳහා එම්බීබීඑස් (MBBS) විශේෂඥ වෛද්‍යවරුන්, ඖෂධ සඳහා ගාස්තු (කිරිපිටි හා විටමින් වර්ග හැර) වෛද්‍ය පරීක්ෂණාගාර 'X' කිරණ පරීක්ෂණ වාර්ථා, විශේෂිත සේවා සඳහා වන ගාස්තු සහ වෛද්‍ය නිර්දේශ මත භෞත චිකිත්සක ප්‍රතිකාර ආවරණය කෙරේ. (මෙම ගෙවීම් කටයුතු සේනාවිධායකගේ අනුමැතිය මත ඉදිරිපත් කරයි.) බාහිර ප්‍රතිකාර ලෙස ලබාගත හැකි එම්ආර්අයි/සීටි ස්කෑන් හා එන්ඩෝස් වැනි පරීක්ෂණ රෝහලේදී නේවාසිකව ප්‍රතිකාර ලබාගෙන ඉදිරිපත් කරනු ලබන බිල්පත් සඳහා ගෙවීම් නොකෙරේ.

Lasic ප්‍රතිකාර (උප්පත්තියෙන් ඇස්වල ඇතිවන වපර සඳහා සිදුකරන ලබන ප්‍රතිකාර) සඳහා වන්දි මුදල් නොගෙවන අතර, Laser ප්‍රතිකාර සඳහා රෝගයේ ස්වාභාවය අනුව රක්ෂණ සංස්ථාවේ වෛද්‍ය මණ්ඩල මගින් රෝග නිශ්චය පත්‍රිකාව පරීක්ෂා කිරීමෙන් පසු වන්දි මුදල් ගෙවීම තිරණය කරනු ඇත. උදා: නහර ගැටගැසීමේ රෝගය සඳහා කරනු ලබන Laser Treatment සඳහා වන්දි මුදල් ලබා දෙනු ලැබේ.

**අසාධ්‍ය රෝග 23 ක් සඳහා ආවරණය රු:200,000.00 (සාමාජිකයාට පමණි)**

- Myocardial Infarction - හෘදයට රුධිරය සැපයීමේ අවහිර වීමක්.
- Stroke - අසාත (මොළයේ රුධිර නහර අවහිරවීම හෝ පුපුරායාම නිසා ඇති කරන රෝගී තත්වයන්)
- Cancer (Radio) Chemo therapy treatment - පිළිකා රෝග.
- Renal Failure - වකුගඩු අක්‍රිය වීම.
- Major Organ Transplant - ප්‍රධාන අවයව බද්ධ කිරීම.
- Paralysis - අංශභාගය.
- Multiple Sclerosis - ස්නායු පටක ඝනවීම සහ විනාශවීම නිසා ඇති කරන රෝගය.
- Pulmonary Arterial Hypertension - පෙනහල්ලේ අධික රුධිර පීඩනය.
- Fulminate Viral Hepatitis - අක්මාවේ බරපතල වූ වෛරස් ආසාධන.
- Heart Valve Surgery - හෘද කපාට ශල්‍යකර්මය.
- Surgery for a Disease of the Aorta - සංස්ථානිත මහා ධමනියේ රෝගී තත්වවලදී කරන ශල්‍යකර්ම.
- Chronic Liver disease - නිදන්ගත අක්මාවේ රෝග.
- Major burns - තදබල පිලිස්සීමක්.
- Blindness - අන්ධභාවය.
- Deafness (Sickness-related) - බිහිරියාව.
- Muscular Dystrophy - ආබාධිත වූ මාංශපේෂි නිසා ඇතිකරන රෝගී තත්වයන්.
- Loss of Speech - ගොළු භාවය.
- Chronic Lung disease - නිදන්ගත පෙනහළු රෝග.
- Apallic Syndrome - මොළයේ ශෛල විනාශවීමෙන් ස්ථිරවම සිහිමූර්ජාවීමේ රෝගී තත්වය.
- Angioplasty Cover - රුධිර නාලයක අබාධය ලිහිල් කරදැමීම සඳහා කරන ශල්‍යකර්මය.
- Benign Brain Tumor - මොළයේ පිළිකා නොවන ගෙඩි.
- Coma - තදබල ලෙස සිහිනැතිවන තත්වයන්.
- Motor Neuron Disease - චාලක නියුරෝන රෝගය.

**ඉතිරි කොටස මීළඟ කළාපයට ...**

**ඉදිරිපත් කිරීම :-**

සුභසාධක අංශය
ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානය

# නිර්මාණ අසපුව

### අපි වෙනුවෙන් අපේ කෙනෙක්

උදේටත් දකියි ඔබ
හවසටත්  ඒ ලෙසම
අනේ ඔබ අව්වේ
වැස්සටත් තෙමෙනවා
විසිහතර පැය පුරා
හිටගෙනම මහ පාරේ
විමසිල්ලෙනි හැමවිටම
යොමා තීක්ෂණ දෑස
මේ සියලු දුක් ගැහැට
අපව රැකුමට නේද

අභිමනින් යුතු සොල්දාදුවෙකි
ඇත්තටම ඔබ
ආඩම්බරයි ඔබ ගැන
ඔබ අපේය, දැනෙයි හද තුලට
රැක ගනිමි ඔබව
කිසිදාක තනිනොකර
දයාබර රණවිරුවානෙනි ...

.. සෞම්‍ය ..

### නොමැරෙන මිනිසුන්

බලන් අර කදු මුදුන - මීදුමෙන් මතුව එන
දැහැනකට සම වැදී - නිසංසලව කල් ගෙවන
හඹායන හදවතෙහි - නැන සුසුම්
ආගමට ගැරහුම් - රඟදෙති මිනිසුන්
නිවන් දකින්නට සිතමින් - ගාන්ද මල් සුවදින් පුදමින්
නොමැරෙන මිනිසුන් ලෙසින් - වියරු වැටී ඇත මිනිසුන්

සෙ/7පී2386 සාසෙ පුෂ්ප කුමාර ඩීපීපී
7 වන ගජබා රෙජිමේන්තුව
ඒ කණ්ඩායම
විඩත්තපලෙයි
කොඩිකාමන්
යාපනය

### සා: පෙලින්
### උ: පෙළ ට

නිතිපතා සන්තොසින්
පියමැන්න පාසලට
සමුදෙන්න කාලයක්
වෙගයෙන් පැමිණියා
දයාඹර යහළුවන්
සෙනෙහෙබර යෙහෙලියන්
මා තවත් පාසැලක
ඩෙස් අතර තනිවුනා

සෙ/2සි00507 සැරයන් රණවීර කේආර්කේචන්ට්‍රී
මුලස්ථානය - 2 ශ්‍රීලංසංඹ

### ඔබ

නපුරුකම් දරුණුකම්
පමණක් වින්ද මේ සිත්පොඩිය
එපා සෙනෙහසින් අමතන්න
නෙත් කෙවෙනි බොඳකරයි
සෙනෙහෙබර වදන් ලග
සියුමැලිව දිනන්නට බැරි ලොවට
කඳුළු වැල් අවැසි නැත
නුඹ යන්න මුදු මොලොක්
වදන් ගෙන පසෙකටම
දරුණුලෙස කුරිරු ලෙස දිනන්නට නොව
දිවි ගෙවන්නට පමණක්ම ඉඩදී

සෙ/සී101141 ලා/කෝ චන්ද්‍රසේකර කේපීපීඑස්
මුලස්ථානය - 2 ශ්‍රීලංසංඹ

### ළමා විය ඉගිලුනා

වෙල් නියර ලියැදිවල දුව පැන්න අතීතය
බිම වැටි මඩ නාපු ඒ කාලේ නිමාවිය
ගැමි බවේ සුවඳ දෙන කෙතක දිස්වන සිරිය
සිතට අරගෙන ආව සිතුවිල්ල මනහරය
කුඹුර අසබඩ කැලේ තුරු වදුලේ සැඟවිලා
දං හිඹුටු පොකුරු හොර රහසේ ඉගි බිඟි කළා
කුරුළු කිචි බිචිය මැද හා පැටව් අල්ලලා
ළමා විය ඉගිලුනා නොදැනීම සිත තලා

පුවක් කොළ වාහනේ හති දමන් ඇද ගියා
රෑන් පෙති අරන් හුස්මක් නැතිව දිව ගියා
අතීතයේ සිහිවටන නෙතින් රෑරා ගියා
ගං දෑලෙ ගුරු පාරෙ එක පොදියේ දඟ කලා
අද කොහේ කොතැනකද අපි සැවොම විසිරිලා
අමතකද ගම ඔබට සිතට සැනසුම ගෙනා
එකදොහක ඉගිලෙන්න ආයෙමත් ගම බලා

සංජි කාරියවසම්

# ස්වේච්ඡා බලසේනා පොසොන් ඇසිරියේ සිසිල

යුද හමුදා ස්වේච්ඡා බලසේනා මුලස්ථානයේ මූලිකත්වයෙන් වාර්ෂිකව සංවිධානය කරණු ලබන පොසොන් මහා ශීල ව්‍යාපාරය මෙවරත් අති පූජනීය මහා සංඝරත්නයේ සහ සැදැහැවත් බෞද්ධ බැතිමතුන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් ජුනි මස 16 වන පොසොන් පෝදා පනාගොඩ යුද හමුදා බෝධි රාජාරාමයේදී පැවැත්විණ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) - ආඥාපති සමූහ මෙහෙයුම් ආඥාපති - බස්නාහිර පලාත හා පුත්තලම දිස්ත්‍රික්කය, කර්නල් සේනාවිධායක ශ්‍රී ලංකා යුද්ධ හමුදා සන්නාහ සන්නද්ධ බලකාය, යුද්ධ හමුදා බෞද්ධ බලමණ්ඩලයේ සභාපති මේජර් ජෙනරාල් එස්ඩීටී ලියනගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සීගේ ප්‍රධානත්වයෙන් හා ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායකගේ අධීක්ෂණයෙන් යුතුව සිදුකරන ලදී. එම පිංකම් මාලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථාන සංවිධාන ශක්තියෙන් හා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය, යුද්ධ හමුදා රයිෆල් බළකායේ ශ්‍රම දායකත්වයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා බෞද්ධ බලමණ්ඩලයේ සම්බන්ධීකරනත්වයෙන් සිදුකරන ලදී.

එදින පැවති ධර්ම දේශනා හා බෝධිපූජාමය වැඩසටහන් සඳහා ගිහි පැවැදි විද්වතුන් රැසකගේ දායකත්වයද ලබා ගත් අතර, දෙදහසකට ආසන්න උවැසි උවැසියන් පිරිසක් එදින අෂ්ටාංගික ශීල සමාදානයේ යෙදුණි. එසේම ඔවුන් සියලු දෙනා වෙනුවෙන් උදා, දිවා දානයද ගිලන්පස පිළිගැන්වීමද සිදුකරන ලදී.

මියගිය සියළුම රණවිරුවන්ට පිං පැමිණවීම සහ ආබාධිත වූ රණවිරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් දැනට සේවයේ යෙදී සිටින සියළුම රණවිරුවන් සහ සිවිල් සේවක මහත්ම මහත්මීන් හා ඔවුන්ගේ පවුල්වල සියළුම අයවළුනට මෙන්ම සමස්ථ ශ්‍රී ලංකා වාසි ජනතාවට නිදුක් නිරෝගි සුවය, දීර්ඝායුෂ ප්‍රාර්ථනා කිරීම අරමුණු කරගනිමින් සංධ්‍යා යාමයේදී බෝධි පූජාමය පිංකමක් පැවැත්විණ. එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සේනාවිධායක, නියෝජ්‍ය සේනාවිධායක, මුලික මාණ්ඩලික නිළධාරි, පුහුණු පරීක්ෂක, බ්‍රිගේඩියර් පාලන, බ්‍රිගේඩියර් භකාස, යුද්ධ හමුදා යුධෝපකරණ බළකායේ මධ්‍යස්ථාන සේනාවිධායක, යුද්ධ හමුදා රයිෆල් බළකායේ දෙවන අණදෙන නිලධාරි ඇතුළු ස්වේච්ඡා බලසේනා මූලස්ථාන නිළධාරීන් රැසක්ද, සෙසුනිළයින් හා උවැසි උවැසියන් විශාල පිරිසක්ද සහභාගි වූහ.















# අභිමනින් සමරූ සංවත්සර දිනය







අභිමානවත් ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ 138 වෙනි සංවත්සරය 2019 අප්‍රේල් 01 දිනට යෙදී තිබුණි. එය ඉතා අභිමානවත් අයුරින් ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් යුධ හමුදා චාරිත්‍රානුකූලව සමරණ ලදී. ප්‍රථමයෙන්ම මාර්තු මස 27 දින රාත්‍රිය මුළුල්ලේ පරිත්‍රාණ ධර්ම දේශණයක් පවත්වා ස්වේච්ඡා බළසේනාවේ සියලුම සාමාජිකයන්ට සෙත් ප්‍රාර්ථනය කරන ලදී. පසුදින උදෑසන සාංඝික දානමය පිංකමක් පවත්වා රට වෙනුවෙන් ජීවිත දානය ලබාදුන් සියලුම රණවරුවන්ට පිං අනුමෝදන් කිරීම සිදුකරන ලදී.

එසේම මාර්තු මස 29 වන දින ස්වේච්ඡා බළසේනා සේනාවිධායක වෙත සම්මාන මුරයක් පිරිණැමූ අතර, එදින සියලු නිළ තේ පැන් සංග්‍රහයක් සහ දිවා භෝජන සංග්‍රහයක් පවත්වා යුධ හමුදා චාරිත්‍ර ඉටුකරන ලදී.

මෙම සංවත්සර වැඩසටහනට සමගාමීව පහත්ගම "සැඳෑ සෙවණ" වැඩහිටි නිවාසය සුද්ද පවිත්‍ර කිරීම හා එහි වැඩිහිටි අයවළුන් හට දිවා ආහාරය පිරිනැමීමේ ප්‍රජා සත්කාරක වැඩ සටහනක්ද පවත්වා 138 වන සංවත්සරික සැමරුම මෙසේ ස්වේච්ඡා බළසේනා ඉතිහාස මතක සටහන් අතරට එක් කරන ලදී.











# විතෙර සංචාර





මේජර් ජෙනරාල්
එල්එෆ් කස්තුරිආරච්චි කේඑස්වී



බ්‍රිගේඩියර් ටීටීපී සිල්වා

විධායක නිලධාරීන්ගේ නායකත්ව සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහනක් පසුගිය මැයි මස 30 දින සිට ජුනි මස 05 වන දින දක්වා මැලේසියාවේ HELP University හිදී පවත්වන ලදී. එම වැඩසටහන තුලින් ලබාගන්නා දැණුම හා පළපුරුද්ද තුලින් මානව විභවතාවයන් වඩා ඵලදායිතාවයෙන් යුත්තව යෙදවීම සඳහා කුසලතා වර්ධනය කිරීම එහි අරමුණ වී තිබුණි. එම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි කේඑස්වී හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ බ්‍රිගේඩියර් පාලන බ්‍රිගේඩියර් ටීටීපී සිල්වා යන ජ්‍යෙෂ්ඨ නිලධාරින් සහභාගි වූහ.

එහිදී උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය සැබැඳිව ප්‍රධාන වශයෙන් අවධානය යොමුකිරීම, මානව සම්පත් කළමණාකරණ පෞරුෂත්ව ශෛලීන්, තීරණගැනීම සහ ගැටළු විසඳීමද මෙම වැඩමුළුවේ විෂය මාලාවට ඇතුලත් වූ අතර, මැලේසියා රජයේ හා පෞද්ගලික අංශයේ ආයතන වෙත සංචාරයන් සිදුකරමින් ප්‍රායෝගික අත්දැකීම්ද ලබා ගැනීමටද එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට අවස්ථාව උදාවී තිබුණි.




# රබන් සුරල් මැද්දේ අවුරුදු සිරි වින්දේ







හෙළ ජන ක්‍රීඩාවන්ට මුල්තැන දෙමින් මෙවරත් ස්වේච්ඡා බළසේනා මූලස්ථානය විසින් අති උත්කර්ෂවත් අන්දමින් සංවිධානය කෙරුණු බක්මහ උළෙල ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් පීආර්එච් ඩයස් වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් පසුගිය 2019 අප්‍රේල් මස 18 වන දින පැවැත්විණ. මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බළසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එල්එෆ් කස්තුරිආරච්චි කේඑස්වී, ස්වේච්ඡා බළසේනා මුලස්ථාන මූලික මාණ්ඩලික නිළධාරි, බ්‍රිගේඩියර් භකාස, බ්‍රිගේඩියර් පාලන, පුහුණු පරීක්ෂක ඇතුළු ස්වේච්ඡා බළසේනා මුලස්ථානයේ සේවයේ නියුතු නිළධාරි හා ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවෝ ද ස්වේච්ඡා බළසේනාවේ සේවය කර විශ්‍රාම ගිය ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයෝද, ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ සෙසුනිළයින්ද ඔවුන්ගේ පවුල් වල සාමාජිකයෝද, සිවිල් සේවක මහතුන් විශාල පිරිසකගේද සහභාගීත්වයෙන් පැවැත්විණ. මෙහි සුවිශේෂී අංගයන් වශයෙන් ආරච්චි ගෙදර, ගැමි ගෙදර, වෙද ගෙදර, කතුරු ඔන්චිල්ලාව, විවිධ වූ ගැමි උපකරණ ඇතුළු පුරාණ ගැමි ක්‍රීඩා තරඟ රැසක් හා සංස්කෘතික නර්ථනයන් සංවිධානයද කර පැවැත්වීම සඳහන් කල හැක.



















## ශ්‍රීලංජාආබමු අවුරුදු සැමරුම



ආගමික වතාවත් වලට හා සාම්ප්‍රදායික ගැමි සිරිතට විරිතට මුල්තැන දෙමින් මෙවරත් ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සූර්ය මංගල්‍යය අප්‍රේල් මස 18 වන දින  හෙරළියාවල, අළකොළදෙණිය ක්‍රීඩාංගනයේදී අති උත්කර්ෂවකත් අන්දමින් පැවැත්විණ. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් අධ්‍යක්ෂක ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික හා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒඩබ්ලිව්එම්ඒඩබ්ලිව්එන් රණවන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහ ජාතික ආරක්ෂක බලමුළුවේ සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය ඉන්දිකා රණවන මැතිනියද සහභාගී විය. එහිදී කාගේත් නෙත සිත වසගයට ගත් මනස්කාන්ත ගැමි නිවසක් නිර්මාණය කරමින් පුරාණ ගොවියාගේ ඇවතුම් පැවතුම් ඉස්මතු කෙරෙන පරිදි රබන් සුරල් මැද කමත ආශ්‍රිත සංස්කෘතික නර්ථන හා විවිධ වූ ගැමි උපකරණ ඇතුළු පුරාණ ගැමි ක්‍රීඩා තරඟ රැසක් සංවිධානය කර පැවැත්වීම සඳහන් කල හැක. එම අවස්ථාවට රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් ද සෙසුනිළයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ද, ප්‍රදේශවාසි විශාල පිරිසක්ද එම ක්‍රිඩාංගනයට එක්රොක් වී සුහදත්වය වර්ධනය කරමින් සිංහල අවුරුදු අසිරිය විඳගත්හ.







# ඒකක තතු අභිමනින් ...

## 2 (සෙව්) ශ්‍රීලංසංබ



පසුගිය අප්‍රේල් 22 වන දින සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් බීඑච්එම්ජ් විජේසිංහ වීඑස්වී යුඑස්පී එන්ඩීයු පීඑස්සී වැලිකන්ද ප්‍රදේශයේ ස්ථාපිත 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බළකායේ කඳවුරු සංචාරයක නිරත විය. ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ඒඒටී සෝමරත්න යුඑස්පී ශ්‍රීලංසංබ විසින් කඳවුරු සම්මාන මුරයක් පිරිනමා බළකාධිපති තුමන් ඉතා හරසරින් යුතුව පිළිගනු ලැබූහ. එහිදී ඒකකයේ වත්මන් තත්වය පිළිබඳ සොයා බැලූ එතුමන් ඒකකයේ ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබාදීමෙන් අනතුරුව එම සංචාරය සිහිවීම පිණිස පැළයක් රෝපනය කිරීමෙන් පසු සමරු පොතෙහි සටහනක්ද තබමින් නික්මයන ලදී.

## 2 (සෙව්) ශ්‍රීලපාහ



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ ප්‍රථම බළඇණිය ලෙස පාබල හමුදාවේත් සමස්ථ යුද්ධ හමුදාවේත් ආරම්භකයා වන 2 වන ස්වේච්ඡා ශ්‍රී ලංකා පාබල හමුදාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියයි. වර්ෂ 1881 ක්වූ අප්‍රේල් මස 01 වන දින ආරම්භ කල මෙම බළඇණිය මේ වන විට වසර 138 ක අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියයි.

මෙම අභිමානවත් සංවත්සරය වෙනුවෙන් ඒකකය වෙතින් වැඩසටහන් රාශියක් සංවිධානය කරන ලද අතර, එහිදී සංවත්සරයට සමගාමීව 2019 මාර්තු මස 29 වන දින ලේ දන්දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් තම රුධිරය පරිත්‍යාග කරනු ලැබූහ. ඒ සඳහා එම ඒකක නිළධාරි/සෙසුනිලයින් 100 කට ආසන්න පිරිසක් සහභාගිවීමද විශේෂත්වයකි. තවද, මාර්තු 31 දින ක්‍රිකට් තරගාවලියක් සහ අත් පන්දු තරගාවලියක් ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වා එදින රාත්‍රියේ ඒකකය තුළ රාජකාරි නියුතු සිවිල් සේවක මහතුන් හට රාත්‍රී භෝජන සංග්‍රහයක් පවත් වමින් ඔවුනට හා ඔවුනගේ පවුල් වල සියළු දේනාටද සුභාෂිංසන පිරිනමණු ලැබීය. ඒකක වත්මන් අණදෙන නිළධාරී මේජර් ඩබ්එම්ඩබ්ජීසිකේඩබ් බංඩාර ආර්එස්පී වෙත සම්ප්‍රදායානුකුලව කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, අණදෙන නිළධාරිගේ සුරතින් කඳවුරු භූමිය තුළ අඹ පැළයක් රෝපණය කිරීම, සියළු නිළ දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම, එදින රාත්‍රියේ සියළු සාමාජිකයින්ගේ මානසික තෘප්තිය වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව සංගීත ප්‍රසංගයක්ද පවත්වමින් තම 138 වන සැමරුම අභිමානවත්ව සමරන ලදී.

## 10 (සෙව්) ගැහේබ



මන්නාරම, සිරිනාථකුලම් ප්‍රදේශයේ ස්ථාපිත 10 (සෙව්) ගැහේබ ඒකකයේ 541 බසේමු බළසේනාධිපති කර්නල් කේඑටීපිඑස්බී කුලතුංග ආර්එස්පී පීඑස්සී කඳවුරු සංචාරයක නිරත විය. තත් ජ්‍යෙෂ්ඨ නිලධාරි බළසේනාධිපති තනතුරෙහි රාජකාරි භාරගැනිමෙන් අනනතුරුව පළමු නිළ සංචාරයද එය වීම විශේෂත්වයකි. ඒකක වැ:බ: අණදෙන නිලධාරි මේජර් ජේඩබ්ලිව්කේ ගමගේ ගැහේබ විසින් කඳවුරු සම්මාන මුරයක් පිරිනමා බළසේනාධිපති තුමන් හරසරින් යුතුව පිළිගනු ලැබූහ. එහිදී ඒකකයේ වත්මන් තත්වය පිළිබඳ සොයා බැලූ එතුමන් හට පිරිස් ඇමතීමෙන් පසු ඉදිරි උපදෙස් ලබාදී එම සංචාරය සිහිවීම පිණිස පැළයක්ද රෝපනය කර කඳවුරෙන් නික්මයන ලදී.

# ඒකක තතු අභිමනින් ...

## 9 (සේවි) ශ්‍රීලපාහ





පසුගිය පෙබරවාරි මස 13 වන බදාදා පුහුණු දිනයට සමගාමීව FIRE FIGHTING AND PREVENTION නම් වැඩමුළුවක් 9 වන ශ්‍රී ලංකා පාබල හමුදා දේශණ ශාලාවේදී පවත්වන ලදී. එම වැඩමුළුව මෙහෙයවන ලද්දේ ගිණිනිවීම් ඒකකයට අනියුක්ත නිළධාරීන් දෙදෙනෙකුගේ උපදේශකත්වයෙනි. තත් වැඩමුළුව 14 වන සේනාංකයේ සේනාංකාධිපතිගේ මගපෙන්වීම යටතේ එම සේනාංකය යටතේ පාලනය වන සියළු ඒකකයන්හි හදිසි ආපදා කළමණාකරණ පාඨමාලාව හදාරා ඇති නිළධාරි/සෙසුනිළයින් හට සිදුකරනු ලැබීය. එම අවස්ථාවට 14 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීවීඩීපී අබේනායක යූඑස්පී එන්ඩීයූ හා 9 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිළධාරි මේජර් ගුණරත්න ශ්‍රීලපාහ ඇතුළු නිළධාරීන් 10 ක් හා සෙසුනිළයින් 100 දෙනෙකු සහභාගි වූහ.

## 12 ශ්‍රීලංජාආබමු





පසුගිය මාර්තු මස 19 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒඩබ්ලිව්එම්ඒඩබ්ලිව්එන් රණවන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරි තොප්පිගල පෙරියවඩ්ඩුවාන් ප්‍රදේශයේ ස්ථානගත 12 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ කඳවුරු නිරීක්ෂණ සංචාරයක නිරතවිය. ඒකක අණදෙන නිළධාරි මේජර් එන්ඩබ්ලිව් දහනායක ශ්‍රීලංජාආබමු විසින් රෙජිමේන්තු අධිපති තුමා වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනමා ඉතා හරසරින් යුතුව පිළිගනු ලැබීය. එහිදී එතුමන් විසින් එම ඒකකයේ පවතින පාලන ගැටළු මෙන්ම නව ඉදිකිරීම් සැබැදිව සොයා බලා උපදෙස් ලබාදුන් අතර, සියළු නිළයින් අමතා අභිමානවත් හමුදාවක සාමාජිකයෙකු ලෙස නිළධාරියෙකු හා සෙබළෙකු වශයෙන් රාජකාරි ඉටුකිරිමේදී වැදගත්වන කරුණු ඇතුලත් හරවත් දේශනයක්ද පැවැත්වූහ. එම නිරීක්ෂන සංචාරය සිහිවීම වස් කඳවුරු භූමිය තුල අඹ පැළයක් රෝපණය කිරීමෙන් අනතුරුව සමරු පොතහි සටහන් තබා ඒකකය වෙත සුභ පැතුම් එක් කරමින් ඒකකය වෙතින් නික්ම යන ලදී.

## ශ්‍රීලයුපුබ

582 බලසේනා මූලස්ථානයේ නව බලසේනාධිපති වශයෙන් රාජකාරීන් භාරගනු ලැබූ කර්නල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී පසුගියදා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුරෝගාමි බලකා මූලස්ථානයේ ප්‍රථම වරට කඳවුරු සංචාරයක නිරත විය. එම ඒකකයේ අණදෙන නිලධාරි කර්නල් ඩීඑල්ඩීඩී ජයසූරිය ඇතුළු පුරෝගාමි සෙබළුන් විසින් එතුමන්ව සම්මාන මුරයක් පිරිනමා ඉතා හරසරින් යුතුව පිළිගනු ලැබීය. එහිදී බලසේනාධිපති විසින් විනය මත පදනම්ව සියළු කාර්‍යයන් ඉටුකල යුතු බවට දැනුවත් කරමින් හරවත් වූ දේශණයක්ද සිදුකිරීමටද ඒකකයේ වත්මන් ප්‍රගතිය පිළිබඳවද සොයා බැලීමටද කටයුතු කළ අතර, සියළු නිළ තේපැන් සංග්‍රහයකටද එක්වී එම සංචාරය සිහිවීම වස් සමරු පොතේ සටහනක්ද තබමින් නික්මයන ලදී.



# ඒකක තතු අභිමනින් ...

## 2 ශ්‍රීලංජාආබමු

කිළිනොච්චිය ආරක්‍ෂක සේනා මූලස්ථානය යටතේ පාලනය වන පුනරින් ජයපුරම් ප්‍රදේශයේ ස්ථානගත 2 වන ශ්‍රීලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ නිලධාරීන් 14 හා සෙසුනිලයින් 362 ක ගේ සහභාගිත්වයෙන් 66/25 අංක දරන බළඇණි පුහුණු පාඨමාලාව 2019 ජනවාරි මස 07 දින සිට 2019 මාර්තු මස 03 දින දක්වා කාලසීමාව තුල පවත්වා සාර්ථකව නිමාකරනු ලැබීය. එම පාඨමාලාව ආසේමු (කිළි) වාර්ෂික පුහුණු සැලැස්මට අනුව 66 වන සේනාංක මූලස්ථානය යටතේ පාලනය වන අරසපුරකුලම් බළඇණි පුහුණු පාසල වෙතින් පවත්වන ලදී. එහිදී එම පුහුණු පාඨමාලාවේ සෑම අතින්ම අතිශූර සෙබළාට හිමි සම්මානය, දක්‍ෂතම වෙඩික්කරුට හිමි සම්මානය හා දක්‍ෂතම බණ්ඩභාර නිළධාරි හට හිමි සම්මානය ඇතුළු සම්මාන ත්‍රිත්වයම ඒකකයට අයත් කපිතන් එන්එච්ඒඅයි මධුමාදව ශ්‍රීලංජාආබමු නිළධාරී විසින් හිමිකර ගන්නා ලදී.





සෑම අතින්ම අතිශූර සෙබළා, දක්‍ෂතම වෙඩික්කරු හා දක්‍ෂතම බණ්ඩභාර නිළධාරි

## 12 ශ්‍රීලංජාආබමු



1993 මැයි මස 27 දින ත්‍රිකුණාමලය මංකිබ්‍රිජ් හිදී ආරම්භ කරන ලද 12 වන බලඇණිය ශ්‍රිලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවට පසුගිය මැයි මස 27 දිනට වසර 26 ක් සපිරුණි. මෙම බළඇණිය පසුගිය වසර 26 පුරාවටම ත්‍රිකුණාමලය, කිලිනොච්චි, අම්පාර හා මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි විවිධ ස්ථානවල ස්ථානගත වෙමින් ක්‍රියාන්විත රාජකාරීන්හි නියැලුණු අතර, දශක තුනක් පුරා පැවති කුරිරු ත්‍රස්ථවාදය තුරන් කිරීමේ මහගු මෙහෙවරටද සක්‍රිය දායකත්වය සැපයූ ඒකකයක් විය.

තම 26 වන සංවත්සරය ඒකක මූලස්ථානය තොප්පිගල, පෙරියවඩ්ඩුවාන් හීදී මහත් අභිමානවත් අයුරින් මැයි 27 වන දින සමරන ලදී. එහිදී ඒකකය ගොඩනැංවීම සඳහා ආරම්භයේ සිට මේ දක්වා ක්‍රියාකල සියළු නිලධාරි/සෙනින්ද ඒකකයේ රාජකාරි කොට යුද්ධය වෙනුවෙන් දිවිය පුදකල උදාර රණවිරුවන්ද, රණක්‍ෂිතයට පත්වූ රණවිරුවන්ද මහත් ගෞරවයකින් යුතුව සිහිපත් කරනු ලැබූහ. එම සංවත්සරය නිමිතිකොටගෙන වත්මන් ඒකක අණදෙන නිලධාරි මේජර් එන් ඩබ්ලිව් දහනායක ශ්‍රීලංජාආබමු හට සම්මාන මුරයක් පිරිනැමීම, මියගිය රණවිරුවන් අනුස්මරණය කිරීම හා රණක්‍ෂිතයට පත්ව දැනට ප්‍රතිකාර ලබමින් සිටින රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින් ධර්මදේශනයක් සහ මහා සංඝරත්නය උදෙසා සංඝගත දක්ෂිණාවක් පිරිනමා ඔවුන් වෙත පින්පෙත් අනුමෝදන් කිරීමද සිදුවිය. එසේම සෙබළුන්ගේ සුහදත්වය වර්ධනය කිරීම පිණිස විවිධ ක්‍රීඩා ඉසව් රැසක් පැවැත්වීම, සියළු නිලයින් සඳහා තේ පැන් සංග්‍රහයක් සහ දිවා භෝජන සංග්‍රහයක්ද පැවැත්වීමද සිදුකරන ලදී. එම අවස්ථාවට ඒකකයේ නිලධාරි/සෙසුනිළයින් විශාල පිරිසක් සහභාගි වූහ.

## 13 ශ්‍රීලංජාආබමු

13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ අණදෙන නිලධාරි මේජර් ආර්එම්බී හේරත් ශ්‍රීලංජාආබමු ගේ අණදීම යටතේ සිය බළඇණි පුහුණු පාඨමාලාව පසුගියදා සාර්ථකව නිම කරන ලදී. එම පුහුණුව 64 සේනාංක මූලස්ථානය මගින් පාලන වන මුතියන්කඩ්ඩුකුලම්හි ස්ථාපිත බළඇණි පුහුණු පාසලේ සිදුකරනු ලැබීය. එම ඒකක නිලධාරි 06 ක් සහ සෙසුනිළයින් 308 ක් ඒ සඳහා සහභාගි වූහ. එහිදී දක්‍ෂතම කණ්ඩායමට හිමි සම්මානය බී කණ්ඩායම හිමි කරගත් අතර, දක්‍ෂතම පෙල අණදෙන්නාට හිමි සම්මානය සෙ/13කිුපු01225 කෝප්‍රල් රත්නායක ආර්ආර් විසින්ද, හොඳම ශාරීරික යෝග්‍යතාවයට හිමි සම්මානය සෙ/කිුපු106305 සාසෙ සෙනරත් එච්ජීඑස්එම් විසින් හිමිකර ගත්හ.





# දිවියට සුවයක්..



## "රණවරුණ" මෙවර කලාපයේ දිවියට සුවයක් තුළින් ඔබට ගෙන එනුයේ **ස්ථුලතාවය** පිලිබඳවයි

### ස්ථූලතාවය යනු

ශරීරයේ අධික ලෙස මේදය තැම්පත් වීමයි. මෙලෙස තැන්පත් වන මේදය ශරීරයේ ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපාන අතර, එය විවිධ සංකූලතා සහ නොයෙකුත් බෝ නොවන රෝගී තත්ත්වයන් (Non communicable diseases) ඇති කිරීමට හේතු වෙයි. උසට සරිලන බර නිරෝගී බව ගෙන දෙයි. එනම්, දේහ ස්කන්ද දර්ශකය (Body Mass Index) 23 ට වඩා අඩු අගයක පවත්වා ගැනීමයි. මෙම අගය 23 ට වඩා වැඩි වූ විට ස්ථූලතාවය ලෙසද හැඳින්වෙයි. සරලව ගත් කල දේහයේ බර නියමිත බරට වඩා 20% ට වඩා වැඩි වූ විට එය ස්ථූලතාවයයි.

මීට දශක කිහිපයකට පෙර ස්ථූලතාවය දියුණු රටවලට සීමා වූ සුඛෝපභෝගී ජීවන රටාවක් හා බැඳුණු සෞඛ්‍ය ගැටලුවක් විය. නමුත් මෑත කාලයේදී මෙය දියුණු වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි රටවලටද පැතිරී ඇත. ස්ථූලතාවය ළමා වැඩිහිටි භේදයකින් තොරව ලාංකීය සමාජය ආක්‍රමණය කරමින් පවතී. විශේෂයෙන්ම ළමා ස්ථූලතාවය ඉතා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින අතර මෙය අනාගතයේදී දියවැඩියාව, හෘදය රෝග වැනි රෝගී තත්ව ඇති කිරීමට බෙහෙවින්ම හේතුවනු ඇත.

HEIGHT in/cm — Underweight | Healthy | Overweight | Obese | Extremely Obese

| WEIGHT lbs / kgs | 100 / 45.5 | 105 / 47.7 | 110 / 50.0 | 115 / 52.3 | 120 / 54.5 | 125 / 56.8 | 130 / 59.1 | 135 / 61.4 | 140 / 63.6 | 145 / 65.9 | 150 / 68.2 | 155 / 70.5 | 160 / 72.7 | 165 / 75 | 170 / 77.3 | 175 / 79.5 | 180 / 81.8 | 185 / 84.1 | 190 / 86.4 | 195 / 88.6 | 200 / 90.9 | 205 / 93.2 | 210 / 95.5 | 215 / 97.7 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5'0" – 152.4 | 19 | 20 | 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 | 31 | 32 | 33 | 34 | 35 | 36 | 37 | 38 | 39 | 40 | 41 | 42 |
| 5'1" – 154.9 | 18 | 19 | 20 | 21 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 | 31 | 32 | 33 | 34 | 35 | 36 | 36 | 37 | 38 | 39 | 40 |
| 5'2" – 157.4 | 18 | 19 | 20 | 21 | 22 | 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 | 31 | 32 | 33 | 33 | 34 | 35 | 36 | 37 | 38 | 39 |
| 5'3" – 160.0 | 17 | 18 | 19 | 20 | 21 | 22 | 23 | 24 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 | 31 | 32 | 32 | 33 | 34 | 35 | 36 | 37 | 38 |
| 5'4" – 162.5 | 17 | 18 | 18 | 19 | 20 | 21 | 22 | 23 | 24 | 24 | 25 | 26 | 27 | 28 | 29 | 30 | 31 | 31 | 32 | 33 | 34 | 35 | 36 | 37 |
| 5'5" – 165.1 | 16 | 17 | 18 | 19 | 20 | 20 | 21 | 22 | 23 | 24 | 25 | 25 | 26 | 27 | 28 | 29 | 30 | 30 | 31 | 32 | 33 | 34 | 35 | 35 |
| 5'6" – 167.6 | 16 | 17 | 17 | 18 | 19 | 20 | 21 | 21 | 22 | 23 | 24 | 25 | 25 | 26 | 27 | 28 | 29 | 29 | 30 | 31 | 32 | 33 | 34 | 34 |
| 5'7" – 170.1 | 15 | 16 | 17 | 18 | 18 | 19 | 20 | 21 | 22 | 22 | 23 | 24 | 25 | 25 | 26 | 27 | 28 | 29 | 29 | 30 | 31 | 32 | 33 | 33 |
| 5'8" – 172.7 | 15 | 16 | 16 | 17 | 18 | 19 | 19 | 20 | 21 | 22 | 22 | 23 | 24 | 25 | 25 | 26 | 27 | 28 | 28 | 29 | 30 | 31 | 32 | 32 |
| 5'9" – 175.2 | 14 | 15 | 16 | 17 | 17 | 18 | 19 | 20 | 20 | 21 | 22 | 22 | 23 | 24 | 25 | 25 | 26 | 27 | 28 | 28 | 29 | 30 | 31 | 31 |
| 5'10" – 177.8 | 14 | 15 | 15 | 16 | 17 | 18 | 18 | 19 | 20 | 20 | 21 | 22 | 23 | 23 | 24 | 25 | 25 | 26 | 27 | 28 | 28 | 29 | 30 | 30 |
| 5'11" – 180.3 | 14 | 14 | 15 | 16 | 16 | 17 | 18 | 18 | 19 | 20 | 21 | 21 | 22 | 23 | 23 | 24 | 25 | 25 | 26 | 27 | 28 | 28 | 29 | 30 |
| 6'0" – 182.8 | 13 | 14 | 14 | 15 | 16 | 17 | 17 | 18 | 19 | 19 | 20 | 21 | 21 | 22 | 23 | 23 | 24 | 25 | 25 | 26 | 27 | 27 | 28 | 29 |
| 6'1" – 185.4 | 13 | 13 | 14 | 15 | 15 | 16 | 17 | 17 | 18 | 19 | 19 | 20 | 21 | 21 | 22 | 23 | 23 | 24 | 25 | 25 | 26 | 27 | 27 | 28 |
| 6'2" – 187.9 | 12 | 13 | 14 | 14 | 15 | 16 | 16 | 17 | 18 | 18 | 19 | 19 | 20 | 21 | 21 | 22 | 23 | 23 | 24 | 25 | 25 | 26 | 27 | 27 |
| 6'3" – 190.5 | 12 | 13 | 13 | 14 | 15 | 15 | 16 | 16 | 17 | 18 | 18 | 19 | 20 | 20 | 21 | 21 | 22 | 23 | 23 | 24 | 25 | 25 | 26 | 26 |
| 6'4" – 193.0 | 12 | 12 | 13 | 14 | 14 | 15 | 15 | 16 | 17 | 17 | 18 | 18 | 19 | 20 | 20 | 21 | 22 | 22 | 23 | 23 | 24 | 25 | 25 | 26 |

දේහ ස්කන්ද දර්ශකය

# ස්ථූලතාවයට හේතු

## අධිපෝෂණය

ශරීරයට අවශ්‍ය ප්‍රමාණයට වඩා ආහාර ගැනීමයි. අධිපෝෂණය මගින් ශරීරය තුළ කැලරි අතිරික්තයක් සිදුවන අතර, අතිරික්ත කැලරි ශරීරය තුළ මේදය ලෙස තැන්පත් වේ. සෑම පුද්ගලයෙකුටම දෛනිකව අවශ්‍ය වන නියමිත කැලරි ප්‍රමාණයක් ඇත. එය කෙනෙකුගේ උස, බර, ක්‍රියාකාරකම් මට්ටම ආදිය අනුව තීරණය වෙයි. මෙහිදී කැලරි ඝනත්වය ඉහළ ආහාර අතර ක්ෂණික ආහාර (Fast Food), කෙටි කෑම (Short Eats), පැණි බීම (Soft Drinks) විශේෂ වෙයි. ක්ෂණික ආහාර හා කෙටි කෑම වල තෙල් සීනි පිටි ඉහළ මට්ටමින් පවතින අතර ගුණාත්මක බවද අඩුය. පැණි බීමවලද ඉහළ සීනි ප්‍රමාණයක් පවතී. එම ආහාර නිතර පරිභෝජනය කිරීමෙන් ශරීරයට විටමින්, ඛණිජ ලවණ හා අනෙකුත් අත්‍යවශ්‍ය පෝෂ්‍යපදාර්ථ නොලැබීයාම නිසා විවිධ ඌණතා රෝග (Micronutrient Malnutrition) ඇති වීමටද හේතු වේ.

## ව්‍යායාම අඩුකම

තාක්ෂණික දියුණුවත් සමග දෛනික ජීවන රටාව පහසු වීමෙන් කය වෙහෙසා කෙරෙන ක්‍රියාකාරකම් අඩු වී ඇත. රූපවාහිනී, පරිගණක ඉදිරියේ නිතර කාලය ගත කිරීමෙන් ක්‍රියාශීලී බව අඩු වේ. ව්‍යායාම හෝ ක්‍රියාශීලී බව අඩු වීම යනු කැලරි දහනය අඩු වීමයි. එනම්, එය මේදය ලෙස තැම්පත් වීමයි. විශේෂයෙන්ම ළමා කාලයේදී අධ්‍යාපනයයේ ඇති තරගකාරීත්වය නිසා සෙල්ලම් කිරීමට කාලය නොමැති වීම ඔවුන්ගේ තරබාරුකම ඇති වීමට හේතු වී ඇත.

## නින්ද අඩුකම

මෑතකදී කර ඇති පර්යේෂණවලට අනුව අවම නින්ද නියමිත පමණින් නොලැබීම ස්ථූලතාවයට හේතු වී ඇති බව පෙනී ගොස් ඇත. නින්ද අඩුකම හා බැඳී ඇති හෝමෝන ක්‍රියාකාරීත්වය නිසා ශරීරයේ පරිවෘත්තීය ක්‍රියාවලීන්ගේ සිදු වන වෙනස්කම් මෙයට හේතුවයි.



# ස්ථූලතාවයවළක්වා ගැනීම


## ගුණාත්මක පෝෂණ රටාව

ධාන්‍ය, එළවළු, පලතුරු, මස් මාංස ආදිය අඩංගු සමබර ආහාර රටාවලට හුරු වීම සහ තම කැලරි අවශ්‍යතාවයට සරිලන ප්‍රමාණයෙන් ආහාර ගැනීම. එනම්, ගුණාත්මක බව මෙන්ම ප්‍රමාණාත්මක බව ගැනද සැලකිලිමත් වීම හා ක්ෂණික ආහාර, කෙටිකෑම, පැණිබීම වැනි ආහාර භාවිතයෙන් වැළකීම.

## ක්‍රියාශීලී ජීවන රටාව

දෛනික වැඩ කටයුතු වලදී හැකි සෑම විටකම තාක්ෂණික උපකරණ භාවිතය වෙනුවට ශරීරය වෙහෙසා කරන වැඩ කටයුතු වල නිරත වී ක්‍රියාශීලී බව පවත්වා ගැනීම. රූපවාහිණී, පරිගණක ආදිය ඉදිරියේ ගත කරණ කාලය අඩු කිරීම සහ ඇවිදීම වැනි ව්‍යායාමවල නිරතවීම ශරීරයේ බර සහ ශාරීරික සුවතාවය (Fitness) නියමිත මට්ටමෙන් පවත්වා ගැනීම වැදගත් වේ.

**ජෛව රසායන හා සායනික රසායන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්‍ය ආචාර්‍ය සුරේකා චක්‍රවර්ති විසින් රචිත වෛද්‍ය පීඨය, කැලණිය විශ්ව විද්‍යාලයේ 25 වන සංවත්සර සැමරුම 2016 පොතෙනි.**






### කැස්බෑවා සහ යතුර

සත්ව විද්‍යාව උගැන්වීම සඳහා පන්තියට පැමිණි ගුරුවරිය පාඩම පටන් ගැනීමට කලියෙන් ළමයින්ගෙන් දැණුම පරීක්ෂා කිරීමට සිතා ප්‍රශ්නයක් ඇසුවාය.

ළමයි ඔයගොල්ලෝ දන්නවද ඉබ්බගෙයි කැස්බෑවගෙයි අතර ඇති වෙනස

පන්තියේ අනික් සියළුම දෙනා තුෂ්නිම්භූතව බලා සිටින අතර අත ඔසවා නැගී සිටි අමරපාල ක්ෂණිකව පිළිතුරු දුන්නේය

ටීච .... ඉබ්බට යතුරක් තියෙනවා කැස්බෑවට යතුරක් නෑ ..

### නෝනා වගේමයි

**බීමත් මිනිහෙක් වැනි වැනී විත් පාරේ යන කාන්තාවකගේ මුණ සිප ගත්තේය.**

මොකද තමුසෙට වෙලා තියෙන්නේ ?

අනේ සමාවෙන්න නෝනා .. මං හිතුවේ මගේ පවුල කියලා

පවුල ? ... වලත්තයා.. අවලමා,

බිව්වට පස්සෙ ගෑනු අඳුනන්නෙ නැද්ද ?

ඔය මං කිව්වේ නෝනා. මං රැවටෙන්නෙ නැද්ද ?

නෝනා හරියට කතා කරන්නේ ඒ වගේමයි



### සද්දෙ නං හොඳයි

*නිවසට පැමිණි පෙම්වතා සමග තරුණියක් සාලයේ සිට කතා බස් කරමින් විහිළු තහළු කරමින් උන්නාය.*


*ඇගේ මව වරක් දෙවරක් ඇතුළු කාමරයක සිට පැමිණ සාලයට කර පොවා බැලුවාය ...*

*ඇයි "ඇයි අම්මේ" තරුණිය ඇසුවාය*

*"අපේ සද්දේ වැඩිද" ?*

*"නෑ, නෑ ළමයිනේ සද්දෙන් මට ඇති කරදරයක් නෑ"*

*"මේ සද්දේ හිටි ගමන්*
*නවතින එක තමා හිතට කරදරේ"*



### වනයේ දස්කම්

**අප්‍රිකාවේ වානාන්තරබද පෙදෙසක සංචාරයක නිරත වූ ජොනී නැවත තම රටට පැමිණි අවස්ථාවේ තම මිතුරු සනීට තම අත්දැකීම් කියන්නට විය.**

**"උඹ කියන්නෙ සනී පඳුරක් අස්සෙ ඉඳලා එක පාරටම සිංහයෙක් කඩා පැන්නා. මම දුවන්න තියාගත්තා. ඌත් මාව එලෝගෙන ඇවිත් කන්න ලංවෙන කොටම ඌව ලිස්සලා වැටුණා. මම දිව්ල්ල නතර කළේ නැහැ. ආයෙත් ඌ නැගිටලා මගේ පස්සෙන් දුවලා ඇවිත් මාව කන්න ලංවුණා විතරයි ආයෙත් ඌව ලිස්සලා වැටුනේ නැතැයි. ඒ එක්කම මම දැක්කා කැලේ මැද්දෙ ගෙයක් තියනවා. මම කකුල් දෙකට පුළුවන් හයිය අරගෙන ගේ ඇතුළට දුවලා දඩාස් ගාලා දොර වහ ගත්තා."**

**සනී : ජොනී !....... ඕක මට වුණානම් එහෙම එතනම මට ඇඳුම් වලම මළ පහවෙයි.**

**ජොනී : ඇයි ? උඹ හිතන්නෙ අර සිංහයා දෙසැරයක්ම ලිස්සලා වැටුණේ මොනවට කියලද ... ?**






# සුවපත් දිවියට ආයුර්වේද අත්වැල
# "රණවරුණ" නන්වන ආයුර්වේද පිළියම්

ලොව දනට පවතින ඉපැරණිතම වෛද්‍ය ක්‍රමයක් ලෙස සලකනුයේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයයි. මුල් බිම භාරතය වේ. අවුරුදු 6000 කටත් පෙර සිටි සෘෂින්ගේ ඥාණයෙන් ලොව පහල වූ බවට විශ්වාස කරන මෙම විද්‍යාව පරපුරෙන් පරපුරට ගමන්කර ලිඛිත සාක්ෂි ලෙස ඇති සංහිතා ග්‍රන්ථ ඇසුරින් පරිශීලනය කල හැක. ඊට සමගාමීව රාවණා යුගයේ පටන් ශ්‍රී ලංකාවේද පැතිරී පැවති දේශීය වෙදකම ඉතා සමීපව සැසඳිය හැකි ලක්ෂණ බොහෝමයක් ඇති හෙයින් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය හා එක්ව ශ්‍රී ලාංකීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය අපරටේ ප්‍රචලිතව පවතී. මෙම වෛද්‍ය ක්‍රමයේ පවතින සුවිශේෂී වටිනාකම් පහත සඳහන් පරිදි වේ.

ස්වභාවික ශාඛ, සත්ව හෝ පොලවෙහි පවතින පාෂාණ ආදිය යොදාගෙන පමණක් ඖෂධ නිපදවීම.

පුද්ගලයාගේ වයස, ඔරොත්තුදීමේ හැකියාව, ශක්තිය, ප්‍රකෘතිය (දෝෂ පවතින ප්‍රමාණය) ආදී කරුණු පිළිබඳ සැලකිලිමත් වෙමින් වෛද්‍ය පරිපාලනය/කළමණාකරනය සිදුකිරීම.

නියම වෛද්‍ය උපදෙස් අනුව භාවිතයෙන් අතුරු ආබාධ නොමැති වීම.



ආයුර්වේදය ස්වභාවිකත්වය හා බැඳුනු විද්‍යාවකි. රෝග සුවකිරීම සේම ඊට පළමුව රෝග වලින් වැලකී නිරෝගී බව රැක ගැනීම ආරක්ෂාකර ගැනීම පිළිබඳ උපදෙස් ලබාදීම තුලින් මෙය ප්‍රමුඛ වේ. එබැවින්ම ආයුර්වේද උපදෙස් දිවියට ලංකර ගැනීමෙන් සුවපත් නිරෝගී පරපුරක් බවට පත්වීමේ ඉඩ හසර නිතැතින්ම හිමිවේ.

ආයුර්වේදයේ දක්වෙන ආකාරයට පුද්ගලයන් ප්‍රධාන ආකාර දෙකකට වර්ග කළහැක. මෙම වර්ග කරනය පාදක වී ඇත්තේ නිරෝගී බව හා සංතෘෂ්ටිය යන කරුණු දෙක මතය.

නිරෝගී බව මත වූ බෙදීම - සුඛායු - දුඛායු
යහපත් ජීවිතයක් ගෙවීම මත වූ බෙදීම - හිතායු - අහිතායු

මේ අනුව සමාජයේ ජීවත් වන පුද්ගලයන් හතර ආකාර වේ.

| | සුඛායු | දුඛායු |
|---|---|---|
| හිතායු | සුඛායු හිතායු | දුඛායු හිතායු |
| අහිතායු | සුඛායු අහිතායු | දුඛායු අහිතායු |

මෙම හතරාකාර අතුරින් වඩා හිතකර පුද්ගලයා වනුයේ නිරෝගිමත් මෙන්ම යහපත් ජීවිතයක් ගෙවන පුද්ගලයාය.

ආයුර්වේද උපදෙස් සපයා ඇත්තේද එබඳු පුද්ගලයෙකු සමාජයට දායාද කිරීමටයි.



මෙවර කලාපයෙන් අරඹන මෙම ලිපි පෙල මඟින් නිරෝගී ජීවිතයක් ගෙවීමට සේම නිරෝගී සෞඛ්‍යමත් පරපුරක් බිහිකිරීම සඳහා අවශ්‍ය වන වෛද්‍යාත්මක උපදෙස් පිළිබඳව අධියරෙන් අධියර හඳුන්වාදීමට බලාපොරොත්තු වෙමි.

සටහන :-



**කෞමදි කරුණාගොඩ මිය.**
B.A.M.S (Hons) Sri Lanka, MS (Gyn & Obs) India
විශේෂඥ වෛද්‍ය - ප්‍රසව හා නාරිවේද (ආයුර්වේද)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
දේශිය වෛද්‍ය විද්‍යාතනය
කොළඹ විශ්ව විද්‍යාලය.

# ඒකක තතු අභිමනින් ...

## 17 (සෙව්) ගරෙ





මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ආර්ඩබ්ලිව්ඩබ්ලිව්ඒඩීබී රාජගුරු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සංකල්පයකට අනුව එම බළප්‍රදේශයට අයත් සියළුම සේනාංක යටතේ පාලනය වන නිත්‍ය හා ස්වේච්ඡා ඒකකයන් අතර හොඳම පෙළ තේරීමේ තරඟාවලියක් පසුගිය මාර්තු මස මුල් දෙසතිය තුල පවත්වන ලදී. එම තරඟාවලිය සඳහා නිත්‍ය හා ස්වේච්ඡා ඒකක 14 ක් සහභාගි වූහ. යුද හමුදා දැණුම මෙන්ම යුද්ධ හමුදා සරඹ, ශාරීරික යෝග්‍යතාවය, ජීව වෙඩිතැබීම් ඇතුළු යුද හමුදා සෙබළෙකු උගත යුතු හා ප්‍රගුණ කළයුතු සියළු විෂයන් ආවරණය වන පරිදි තරඟ ඉසව් සංවිධානය කර තිබුණි. එම තරඟාවලියේ අනුශූරතාවයත්, සහභාගිවූ සියළු ස්වේච්ඡා ඒකක අතරින් ප්‍රථම ස්ථානය ලුතිතන් කර්නල් එස්එම්පී සෝමතිලක ගරෙ ගේ අණදීම යටතේ පාලනය වන 17 (සෙව්) ගජබා රෙජිමේන්තුව හිමිකරගන්නා ලදී. එමගින් ඔවුන් තමන් අයත් 64 සේනාංකයට හා 642 බළසේනා මූලස්ථානයට මෙන්ම තම රෙජිමේන්තුවටද ස්වේච්ඡා ඒකකයක් වශයෙන් ස්වේච්ඡා බළසේනාවටද අභිමානයක් එක්කරදීමටද කටයුතු කර ඇත. ඔවුනගේ මෙම ජයග්‍රහණයට රණවරුණද මෙසේ සුභාශිංසන පිරිනමන්නෙමු.

---

## 6 (සෙව්) සබුබ





6 වන සන්නාහ බුද්ධි බළකායේ අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් ඒඑම්එන්පී අත්තනායක සබුබ ගේ අධීක්ෂණය යටතේ එම ඒකක සෙනීගේ ශ්‍රමදායකත්වයෙන් සියළු නිළයින්ගේ ප්‍රයෝජනය සඳහා අභිනවයෙන් ඉදිකරන ලද කායවර්ධන මධ්‍යස්ථානය පසුගියදා අණදෙන නිලධාරිගේ සුරතින් ඒකක සෙබලුන්ගේ අයිතියට පත් කරන ලදී. එම අවස්ථාව ඒකක කැමරා කාචයේ මෙසේ සටහන් විය.

## 4 (සෙව්) ඉසේරෙ

### ප්‍රථම හා දෙවන ස්ථාන හිමිකර ගනිමින්

පසුගිය දා ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය දියතලාව වෙතින් සරඹ උපදේශක පාඨමාලාව අංක 119 පවත්වන ලද අතර, ඒ සඳහා 4 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවට අයත් ජ්‍යෙකොනොනීන් දෙදෙනෙකුද සහභාගි වූහ. එහිදී එම රෙජිමේන්තුවට අයත් සෙ/4එස්01185 සැරයන් සම්පත් එම්ජ්කේ සමස්ථ පාඨමාලාවේ ප්‍රථම ස්ථානයද, සෙ/4එස්01206 සැරයන් පුෂ්ප කුමාර පීඩීඑස් දෙවන ස්ථානයද දිනාගෙන ඇත. එම පාඨමාලාව සඳහා සහභාගි වූ සියළු ඒකක අතරින් ප්‍රථම හා දෙවන ස්ථානය 4 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුට අයත් ජ්‍යෙකොනොනීන් දෙදෙනා විසින්ම හිමිකර ගැනීම විශේෂත්වයකි. ඔවුනගේ ඉදිරි යුද හමුදා දිවියට රණවරුණද මෙසේ සුභ ප්‍රාර්ථනා එක්කර සිටී.



සෙ/4එස්01206
සැරයන්
පුෂ්ප කුමාර පීඩීඑස්



සෙ/4එස්01185
සැරයන්
සම්පත් එම්ජ්කේ





# දස්කම් අතරින් ජාත්‍යන්තරයට

5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායට අයත් සෙ/6ආර්00326 ලා/කෝ නිශාන්ති ජේසීඅයි යන සෙබලිය දැනට යුද්ධ හමුදා කාන්තා බළකායේ සූපවේදීන් අතර ප්‍රධාන ස්ථානයක් හිමි කර ගෙන සිටින සෙබළියකි. ඇය 2018.02.18 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා කාන්තා බළකායට ඇතුලත් වී ශාරීරික අභ්‍යාස පාඨමාලාවද හැදෑරීමෙන් පසු සූපවේදී පාඨමාලාව ද හදාරා ඇත. සූපවේදී අංශයෙන් ඇය ජාතික තරඟ හා ජාත්‍යන්තර තරඟාවලි කිහිපයකටම සහභාගී වී ජයග්‍රහණ හිමි කර ගෙන ඇති අතර, ඇය නව නිපැයුම් සහජ දක්ෂතාවයක් ඇති සෙබළියකි. නව නිපැයුම් අංශයෙන්ද විශිෂ්ඨ ජයග්‍රහණ හිමිකර ගෙන ඇති ඇය 2019 වර්ෂයේ ජුනි මස 20 වන දින කොරියාවේ පැවති International Women's Invention Exposition 2019 සඳහා නව නිපැයුමක් ලෙස සනීපාරක්ෂක තුවා ජෛවී අපද්‍රව්‍ය පිළිස්සීමේ යන්ත්‍රයක් ඉදිරිපත් කරමින් එහි 2 වන ස්ථානය හිමිකර ගෙන රිදී පදක්කමක් ශ්‍රී ලංකාවට ගෙන ඒමට සමත් වී ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායේ සෙබළියක් වශයෙන් ඇය විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටත් ශ්‍රී ලංකාවටත් ලබා දුන් කීර්තිය වෙනුවෙන් ශ්‍රී ලංකා ස්වේච්ඡා බළසේනාවේ උණුසුම් සුභ පැතුම් පිරිනමන්නෙමු.

# ඒකක තතු අභිමනින් ...




## 9 (සේවි) ශ්‍රීලපාහ

කැළණිමුල්ල ප්‍රදේශයේ ස්ථාපිත 9 වන ශ්‍රීලංකා යුද්ධ හමුදා පාබල හමුදාවේ වත්මන් අණදෙන නිළධාරි මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය හා මගපෙන්වීම යටතේ දෙවන අණදෙන නිළධාරිගේ උපදෙස් මත කඳවුරු භූමියට පිවිසෙන කිත්සිරි මෙවන් මාවත ප්‍රධාන මාර්ගයේ දකුණු පසින් ඉදිකරනු ලැබූ නාම පුවරුව අණදෙන නිළධාරිගේ සුරතින් පසුගිය අප්‍රේල් මස 01 වන දිනට යෙදුණ සුභ මොහොතින් විවෘත කරන ලදී.

## 5 (සේවි) ශ්‍රීලයුපොදුසේබ

කොහිලවගුරවත්ත කරන්දෙණිය අම්බලන්ගොඩ යන ස්ථානයේ ස්ථාපිත 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකාය විසින් සිංහල හා දමිළ අලුත් අවුරුද්ද නිමිති කොටගෙන පසුගිය අප්‍රේල් මස 6 වන දින ඒකක කඳවුරු භූමියේදී බක්මහ උළෙලක් පවත්වන ලදී. එම අවස්ථාවට දෙවන අණදෙන නිළධාරි ඇතුළුව ඒකකයේ රාජකාරි කරනු ලබන සියළුම නිළධාරි/සෙසුනිළයින් හා සිවිල් සේවක මහතුන් විශාල පිරිසක් සහභාගි වූහ. එහිදී එම අවස්ථාවට සමගාමීව ඒකකයට අඩු පාඩුවක්ව තිබූ සිවිල් සේවක නේවාසිකාගාරය විවෘත කිරීම හා කැලිප්සෝ සංගීත කණ්ඩායම කලඑළි දැක්වීමද එදිනම සිදු කිරීම ඒකක වැඩ බලන අණදෙන නිළධාරි මේජර් ආර්එම්එස්ජේ රාජනායක ශ්‍රීලයුපොදුසේබ ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී.






**ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව වෙත විද්වත් වෘත්තික නිලධාරීන් ස්වේච්ඡා උපසේවය යටතේ යුධ හමුදා රාජකාරීන් සඳහා බඳවා ගනු ලැබූ අතර, ඔවුන් පිළිබඳව කෙටි සටහනක් මෙවර කළාපයේ සිට රණවරුණ වෙතින් අපි ඔබට ඉදිරිපත් කරන්නෙමු. මෙවර කළාපයේ ඉදිරිපත් කරනුයේ ලුතිතන් කර්නල් කේඑම් නිශාන්ත කුමාරසිංහ ජ්‍යෙෂ්ඨ නිළධාරී පිළිබදවය ...**



| | | |
|---|---|---|
| **නම** | **-** | **කේ එම් නිශාන්ත කුමාරසිංහ** |
| **වෘත්තිය** | **-** | **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>(වෛද්‍ය පීඨය කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය)** |
| **යුද හමුදා නිළය** | **-** | **ලුතිතන් කර්නල්** |

වෛද්‍ය නිශාන්ත කුමාර මහතා 2014 වර්ෂයේ අපි ආමි වැඩසටහ යටතේ ලුතිතන් කර්නල් නිළයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව වෙත බදවා ගන්නා ලදී. ප්‍රාථමික අධ්‍යාපනය ශාන්ත ජෝශප් විද්‍යාලය අනුරාධපුර වෙතින් හැදෑරූ ඔහු ද්විතියික අධ්‍යාපන කටයුතු අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය වෙතින් හදාරා ඇත. ක්‍රීඩාවට මෙන්ම අධ්‍යාපන කටයුතු වලටද එකසේ දස්කම් දක්වූ මොහු ද්විතීක අධ්‍යාපනයෙන් පසුව ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට ඇතුලත්ව වෛද්‍ය උපාධිය ලබාගන්නා ලදී. පසුව මොහු ඕස්ට්‍රේලියාවේ නිව් කාසල් විශ්ව විද්‍යාලය තුලින් ආචාර්ය උපාධිය ලබාගනී. ඔහු මේ දක්වා වසර 17 ක් විශ්ව විද්‍යාල කාථිකාචාර්ය වරයෙකු ලෙස සේවය කරන අතර, දැනට කොතාලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙකු වශයෙන් සේවය කරයි. ඔහු විසින් සිදුකරන ලද උසස් තත්වයේ පර්යේෂණ කටයුතු සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මානය 2013, 2014, 2015 හා 2017 යන වර්ෂ වලදී හිමිකර ගෙන ඇත. මේ වනවිට ඔහු නිදන්ගත වකුග ඩු රෝග වැලැක්විමේ ජනාධිපති කාර්ය සාධක බලකායේ සම්බන්ධීකාරක ලෙස හා එහි ජාතික සම්බන්ධීකාරක ලෙස ක්‍රියාකරමින් සෞඛ්‍ය ප්‍රවර්ධනය රෝග නිවාරණ සත්කාර නිදන්ගත වකුගඩු රෝග වැලැක්වීමේ ආයතනයෙහි දැවෙන සෞඛ්‍ය ගැටලු සඳහා ශක්‍ය විසදුම් සෙවීම අරමුන කරගත් ජාතික වශයෙන් වැදගත් උපාධි හා පශ්චාත් උපාධි ව්‍යාපෘති කිහිපයක අධීක්ෂකවරයෙකු ලෙසත් ඔහු සිය සේවය දේශය වෙනුවෙන් ලබා දෙනු ලබයි.



## ඩිප්ලෝමාවෙන් පිදුම් ලබා ...

12 වන සේනාංකයේ මානි I (පාලන හා භට කාර්යය සම්පාදන) නිලධාරි වශයෙන් රාජකාරි කරනු ලබන ලුතිතන් කර්නල් ඩබ්ලිව්ඩීසීසීබී දිසානායක ගැහේබ යන ජ්‍යෙෂ්ඨ නිලධාරි 2016/2017 වර්ෂයේ රුහුණු විශ්ව විද්‍යාලය වෙතින් මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව (Diploma in Psychological & Counseling) සාර්ථකව හදාරා එම විශ්ව විද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්පීජේඩී සේනානායක මහතාගේ සුරතින් අදාල ඩිප්ලෝමාව ලබාගෙන ඇත. ඔහු විසින් ලබාගෙන ඇති ඩිප්ලෝමා අතර, මානව සම්පත් කලමණාකරන ඩිප්ලෝමාව - වානිජ කර්මාන්ත හා කෘෂිකර්ම මණ්ඩලය අනුරාධපුර (Diploma In Human Resoruse Management), ආරක්ෂක කලමණාකරන ඩිප්ලෝමාව (කණිෂ්ඨ මට්ටම) - දේවි අහිලියා විශ්ව විද්‍යාලය, ඉන්දෝර් - ඉන්දියාව (Diploma in Junior Level Defence Management - University of Indor යන ඩිප්ලෝමාද වේ. එමගින් තමා ලත් දැනුමෙන් යුද්ධ හමුදාවේ උපදේශනය අවශ්‍ය අයවලුන් වෙත තව දුරටත් උපදේශනය තුලින් විශිෂ්ඨ සේවයක් ලබා දීම මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ අරමුණ වේ. තත් නිලධාරි ගේ ඉදිරි යුද හමුදා දිවියට මෙන්ම පුද්ගලික ජීවිතයටද රණවරුණ මෙසේ සුභාශිංසන පිරිනමන්නෙමු.

# යුගදිවියට සුබ පැතුම්



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
නි/70330 කපිතාන්
පීඑම්අයි තරංග 7 ශ්‍රීලකාහ හා
වත්සලා එරන්දි මෙනවිය.



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
නි/8731 කපිතාන් කේඑච්එන්
විජේපාල ශ්‍රීලංජාආබමු හා
මදුශානි රණසිංහ මෙනවිය.



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
සෙ/එෆ්100829 ලා/කෝප්‍රල්
මදුශාන්ත එන්එල්ඩී - 2 (සේවා)
ගැහේබ හා සිතාරා ප්‍රබෝධනී
මෙනවිය.



පසුගියදා යුගදිවි ගමන් ඇරඹූ
සෙ/19ජී00563 සාසෙ කුමාර
ඩබ්ඒඩීඑස්පී - 17 (සේවා) ගරෙ
හා නිශානි නිමන්තිකා මල්වැන්න
මෙනවිය.



පසුගියදා යුග දිවි ගමන් ඇරඹූ
2 (සේවා) ශ්‍රීලංසංබ ඒකකයට අයත්
සෙ/සි100897 ලා/කෝ ප්‍රමෝද්
කුමාර ඒඩී හා දුලාංජලි සිරිවර්ධන
මෙනවිය.



පසුගියදා යුග දිවි ගමන් ඇරඹූ
3 (සේවා) ශ්‍රීලයුකාබ ඒකකයට අයත්
සෙ/3ආර්01595 කෝප්‍රල් මහේෂණී
ඩබ්ඩීඩී හා 5 කාඉරෙ ඒකකයට අයත්
සෙ/241654 සැරයන් කුමාර කේපීඒපී

# උපන්දින සුභ පැතුම්






පසුගියදා පළමු වියට පා  තැබූ එසද දිනෙත් දිව්මින පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ පියා සෙ/පී101132 ලා/කෝ මධුසංක ඩීජීඑල් සහ මව ඇතුළු පවුලේ සැම.



2019 ජුලි මස 16 වන දින දෙවන වියට පා තබන දෙහාන් සන්දිලු චුටි පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ පියා සෙ/4කියු02731 කෝප්‍රල් ලක්මාල් පිඩිආර්පි සහ මව ඇතුළු පවුලේ සැම.



පසුගියදා තෙවන වියට පා තැබූ මිනුලි විහංසා දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ පියා සෙ/පී100767 ලා/කෝ බස්නායක බීඑම්පීකේ සහ මව ඇතුළු පවුලේ සැම.



පසුගිය දා හතරවන වියට පා තැබූ දිශේන් දුලාෂ් පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ පියා සෙ/2සී00729 කෝප්‍රල් ජීවන්ත කේඑච්ආර් සහ මව ඇතුළු පවුලේ සැම.



පසුගිය දා පස්වන වියට පා තැබූ ගිහාන් ගිම්සර පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ පියා සෙ/2සී00717 කෝප්‍රල් රත්නායක ජේපීසීඩී සහ මව ඇතුළු පවුලේ සැම.



පසුගිය දා තුන්වන වියට පා තැබූ සිතිජ නිම්සර පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ පියා සෙ/11ඊ01497 ලා/කෝ ද සිල්වා කේඩබ්එස්එන්ටීඒ සහ මව ඇතුළු පවුලේ සැම.



පසුගිය දා පළමු වියට පා තැබූ අසිනි ශෂිකලා මදුවන්ති දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ පියා සෙ/ඩී101287 සාසෙ මධුවන්ත පීඑම්ආර්ඩී සහ මව ඇතුළු පවුලේ සැම.



පසුගිය දා අටවන වියට පා තැබූ සම්භාෂා දෙව්මිණි දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ පියා සෙ/4කියු02683 සාසෙ රුවන්සිරි කේබී සහ මව ඇතුළු පවුලේ සැම.

# සුභ මොහොතින් නව තනතුරු ලැබ



ස්වේච්ඡා බලසේනා මූලස්ථාන
බ්‍රිගේඩියර් (භකාස) ලෙස
බ්‍රිගේඩියර් බීපී කල්දේරා



ආසේමු (නැගෙනහිර)
කර්නල් සම්බන්ධීකරණ
නිලධාරී(සෙව්) ලෙස
කර්නල් එන්පීපීඑස් තිලකරත්න



ශ්‍රී ලංකා යුද්ධ හමුදා
පුරෝගාමී බලකායේ
අණදෙන නිලධාරී ලෙස
කර්නල් ඩීඑල්ඩීඩී ජයසූරිය



54 සේමු කර්නල්
සම්බන්ධීකරණ නිලධාරී(සෙව්)
ලෙස කර්නල් පීකේඑන්ආර්
රත්නසිංහ



ස්වේච්ඡා බලසේනා මූලස්ථාන
නිලධාරි ශාඛාවේ
මානි I (පත්කිරීම්) ලෙස
ලුතිː කර්නල් කේඑච්එම්යූබී
කොළොන්ගහපිටිය යූඑස්පී
ගැහේබ



ස්වේච්ඡා බලසේනා මූලස්ථාන
භකාස I ලෙස
ලුතිː කර්නල්
එස්පී කහවේවිතාන ගැහේබ



2 වන ශ්‍රී ලංකා සංඥා
බලකායේ
අණදෙන නිළධාරී ලෙස
ලුතිː කර්නල්
ඒඒටී සෝමරත්න යුඑස්පි
ශ්‍රීලංසංබ



13 වන ශ්‍රී ලංකා ජාතික
ආරක්‍ෂක බලමුළුවේ
අණදෙන නිලධාරී ලෙස
ලුතිː කර්නල්
ඩීඑම්එස් දිසානායක
යූඑස්පී පීඑස්සී ශ්‍රීලංසංබ



14 වන ශ්‍රී ලංකා ජාතික
ආරක්‍ෂක බලමුළුවේ අණදෙන
නිලධාරි ලෙස
ලුතිː කර්නල් බීඒටීඑස්කේ
බස්නායක ආර්එස්පී යූඑස්පී
ශ්‍රීලකාහ



8 වන ශ්‍රී ලංකා යුද්ධ
හමුදා ඉංජිනේරු සේවා
රෙජිමේන්තුවේ අණදෙන
නිලධාරි ලෙස
ලුතිː කර්නල්
එන් වනිගසිංහ එල්එස්සී



2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා
සේවා බළකායේ
අණදෙන නිලධාරි ලෙස
ලුතිː කර්නල් එච්එම්පී
සේනාරත්න ශ්‍රීලයුසේබ



1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා
පුරෝගාමී බලකා
දෙවන අණදෙන නිළධාරී ලෙස
ලුතිː කර්නල්
එස්එන් හෙට්ටිගොඩ

# ඒකක තතු අභිමනින් ...

## 2 (සෙව්) ශ්‍රීලංසංබ





පසුගිය අප්‍රේල් 23 වන දින වැලිකන්ද ප්‍රදේශයේ ස්ථාගත 2 (සෙව්) ශ්‍රී ලංකා සංඥා බළකායේ නිරීක්ෂණ චාරිකාවක ප්‍රධාන සංඥා නිලධාරි මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී කඳවුරු සංචාරයක නිරත විය. ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් බීඑම් ජයවීර පීඑස්සී ශ්‍රීලංසංබ විසින් කඳවුරු සම්මාන මුරයක් පිරිනමා එතුමන් ඉතා හරසරින් යුතුව පිළිගනු ලැබීය. එහිදී ඒකකයේ වත්මන් තත්වය හා ඒකක සියළු නිළයින්ගේ සුභ සාධනය පිළිබඳ සොයාබලා උපදෙස් ලබාදීමෙන් අනතුරුව සියළු නිළ තේපැන් සංග්‍රහයකටද සහභාගි වී සෙබලුන් සමඟ කෙටි පිළිසඳරකද යෙදින. එම සංචාරය සිහිවීම පිණිස පැළයක් රෝපනය කිරීමෙන් පසු සමරු පොතෙහි සටහනක්ද තබමින් ඒකකය වෙත සුභ පැතුම් එක් කරමින් එතුමන් ඒකකය වෙතින් නික්ම යන ලදී.

## 15 (සෙව්) ගරෙ



අන්තර් ඒකක කඹ ඇදීමේ තරඟාවලිය - 2019 පසුගිය මාර්තු මස 13 වන දින සාලියපුර ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. එම තරඟාවලිය සඳහා සහභාගිවූ 15 වන ගජබා රෙජිමේන්තු කඹ ඇදීමේ කණ්ඩායම එහි ශූරතාවය හිමිකර ගනු ලැබීය. එම තරඟාවලිය සඳහා සහභාගි වූ සියළුම නිත්‍ය හා ස්වේච්ඡා ඒකක කණ්ඩායම් පරාජය කරමින් තම හැකියාවන් හා සාමුහික ජවය පෙන්වමින් ඔවුන් එම සමස්ථ තරඟාවලියේ ශූරතාවය දිනාගැනීම ස්වේච්ඡා ඒකකයක් වශයෙන් අභිමානයක් එක්කර දීමට සමත් වී ඇත.



18 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ අණදෙන නිලධාරි ලෙස මේජර් කේඒඩීඑම් විජයසේකර ආර්එස්පි අයිපි ශ්‍රීලකාහ



5 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි ලෙස මේජර් එන්බීඒයුකේ නිශ්ශංක ශ්‍රීලපාහ



2 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක මලමුළුවේ වැ:බ: අණදෙන නිලධාරි ලෙස මේජර් ආර්පිකේඑස්එස් රණසිංහ ශ්‍රීලංජාආබමු



ස්වේච්ඡා බලසේනා මූලස්ථාන රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස බනි I ජේඑම් දිසානායක

1922 ලංකා ආරක්ෂක බළසේනාව බ්‍රිතාන්‍ය රජයේ හා රෙජිමේන්තු වර්ණ මගින් ගෞරවයට පාත්‍ර වන ලදී. මෙම වකවානුවේදී ඇතිවූ විශේෂිතම සිදුවීම නම් 1922 මාර්තු මාසයේදී අති උත්තම එඩ්වඩ් වේල්ස් කුමාරයා (පසුව අටවන එඩ්වඩ් රජතුමා) ලංකාවට පැමිණීමය. මෙම අවස්ථාවේදී ලුතිතන් කර්නල් ටීජී ජයවර්ධන වීඩී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී වූ අතර ලංකා පාබල හමුදා ඒකකයට 1922 මාර්තු මස 22 වන දින රාජකීය වර්ණ හා රෙජිමේන්තු වර්ණ ප්‍රදානය සිදු කරන ලදී.

1948 දී ලංකාවට නිදහස ලැබූ මුල් කාලයේ ස්වෙච්ඡා බළකායේ කැපී පෙනෙන අවස්ථා දෙස බැලීමේදී 1953 හර්තාලය පාලනය කිරීම සඳහා සක්‍රීය සේවා රාජකාරී ඉටු කිරීම හැඳින්විය හැක. එසේම 1954 බ්‍රිතාන්‍ය මහ රැජිනගේ පැමිණීම හා එම අවස්ථාවේ ගාලු මුවදොර පිටියේදී 2 වන ලංකා පාබල හමුදාව වෙත රැජිනගේ හා බළකා වර්ණ ප්‍රදානය ඉතා උත්කර්ෂවත් උත්සවයකදී පිරිනැමීම ද සිදු කෙරුනු අතර, 1980.08.15 දින 2,3 (සෙව්) ගැමුණු හේවා බළකාය වෙත ජනාධිපති වර්ණ හා රෙජිමෙන්තු වර්ණ පිරිනැමින.



**1922 වර්ෂයේදී ප්‍රදානය කළ රාජකීය වර්ණ ධජ**



**1954 වර්ෂයේ ප්‍රදානය කල රැජින සම්මාණ වර්ණ ධජ**



**1980 වර්ෂයේ 2,3 (සෙව්) ගැහේබ ඒකක වෙත වර්ණ ධජ පිරිනැමීමේ අවස්ථාව**

1972 මැයි මස 22 වන දින ශ්‍රී ලංකාව ජනරජයක් බවට ප්‍රකාශ කිරීමත් සමග එතෙක් "ලංකා ස්වේච්ඡා බළකාය" නමින් හැඳින්වූ නාමය වෙනස් වී එය "ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බළසේනාව" ලෙස නාමකරණය විය. මෙම හේතුවෙන් ඒකකයන්ගේ නාමයන්ද ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බළසේනාවේ පිළිවෙලට අනුව සැකසුණ අතර වර්ථමානය වන විට එය ඒකක 82 කින් පරිපූර්ණ වී ඇත. ආරම්භක අවධියේ සිට රටේ අභ්‍යන්තරික වශයෙන් ආරක්ෂක කටයුතු වල නියලුනු අතර යුධමය අවස්ථාවල දී රට අභ්‍යන්තරයේ මෙන්ම විදේශීය යුධමය තත්වයන්හි දී පලමුවන ලෝක සංග්‍රාමය හා දෙවන ලෝක සංග්‍රාම අවධියේදී ද ස්වේච්ඡා බළසේනාවට අයත් භට පිරිස් සක්‍රීය යුධ සේවය සඳහා කැඳවා ඇත. නැවත 1983 වර්ෂයේ සිට මේ දක්වා ස්වේච්ඡා බළසේනාව අඛණ්ඩව සක්‍රීය සේවයේ යෙදී සිටී. 1948 පෙබරවාරි මස 04 වන දින ශ්‍රී ලංකාවට නිදහස ලැබීමත් සමග 1949 වර්ෂයේදී නිත්‍ය හමුදාව ආරම්භ වන තෙක් මූලාරම්භයේ සිට එවකට පැවති බොහෝ බළඇණි වරින් වර විවිධ හේතූන් මත විසිරුවා හැර ඇති අතර ස්වේච්ඡා බළසේනාවේ සංවිධානය හා සංයුතිය ද වරින් වර වෙනස්වීම් වලට භාජනය වී ඇත. යම්කිසි සංවිධානයක සාර්ථකත්වය මැනිය හැකිවනුයේ එම සංවිධානය තුළින් ඉටු කෙරෙන සේවාව මත නම් යුද හමුදා ස්වේච්ඡා සංවිධානය උච්ඡස්ථානයක පවතිනුයේ එවකට එහි සිටි බොහොමයක් සාමාජිකයින් විසින් ජාතික නායකත්වයට ලබාදුන් උදාර දායකත්වය නිසාවෙන් බව පැහැදිලිවේ.

එහිදී මෙරට සමාජ දේශපාලන යටගියාව ගවේෂණය කිරීමේදී මෙරට ප්‍රථම අගමැති වූ මහාමාන්‍ය ඩීඑස් සේනානායක යනු ස්වේච්ඡා කාලතුවක්කු හමුදාවෙන් බිහිවූ සුවිශේෂී දේශමාමක පුත්‍රයෙකි. තවද ශ්‍රී ලංකාවේ හිටපු අග්‍රාමාත්‍යවරයෙකු වන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල පීසී සීඑච් කේබීර් එල්එල්ඩී ද, නිදහස් ලංකා රජයේ ප්‍රථම අධ්‍යාපන ඇමැති ධූරය දැරූ මේජර් ඊඒ නුගවෙල ඊඩී ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ කර්නල් සීඒ ධර්මපාල ඕබීර් ඊඩී ද ස්වේච්ඡා බළසේනා සමාජිකයෝ වෙති. කලක් පාර්ලිමේන්තු කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍ය ධූරය ඉසිලූ මේජර් මොන්ටේගු ජයවික්‍රම මැතිතුමා ද, හිටපු කම්කරු ඇමතිවරයෙකු වූ කපිතන් සීපීජේ සෙනෙවිරත්න මැතිතුමාද, දේශපාලනඥයෙකු, සිවිල් පරිපාලන නිලධාරියෙකු මෙන්ම මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේවරයෙකුද වූ දේශමාන්‍ය නිශ්ශංක විජේරත්න මැතිතුමා ද ස්වේච්ඡා බළසේනාවේ සමාජිකයන් වන අතර, රාජ්‍ය ආරක්ෂක

**ස්වේච්ඡා බළසේනාවෙන් පන්නරය ලැබ දැයට අභිමානය එක්කළ යුග පුරුෂයෝ**



මහාමාන්‍ය ඩීඑස් සේනානායක



ජෙනරාල් සර් ජෝන් කොතලාවල



මේජර් ඊඒ නුගවෙල



කර්නල් සීඒ ධර්මපාල




මේජර් මොන්ටේගු ජයවික්‍රම



කපිතන් සීපීජේ සෙනවිරත්න




ජෙනරාල් අනුරුද්ධ රත්වත්තේ



හෙන්රි පේද්‍රිස් මැතිතුමා



නිශ්ශංක විජේරත්න මැතිතුමා



ජෙනරාල් රංජන් විජේරත්න



උපාලි අමරසිරි මැතිතුමා




රවී ජයවර්ධන මැතිතුමා



කරු ජයසූරිය මැතිතුමා (වත්මන් පර්ලිමේන්තුවේ ගරු කථානායක තුමා)

නියෝජ්‍ය ඇමැති ධූරය දැරූ ජෙනරාල් රන්ජන් විජේරත්න මැතිතුමා,ජෙනරාල් අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා හා රවී ජයවර්ධන මැතිතුමාද ද ස්වේච්ඡා බලසේනා ඉතිහාස කථාව තුළ නොමැකෙන සටහන් තැබූ චරිත වෙති. තවද වත්මන් පාර්ලිමේන්තුවේ ගරු කථානායක කරු ජයසූරිය මැතිතුමාද ස්වේච්ඡා බලසේනාව තුළින් බිහිවූ නායකයෙකු ලෙස පෙන්වා දිය හැකිය.



පරම වීර විභූෂණ පදක්කමින්
පිදුම් ලැබූ
කපිතාන් සාලිය අලදෙනිය

සැබවින්ම ස්වේච්ඡා බලසේනාව වූ කලී එක් අන්තයකට එක් පර්ශවයකට හෝ සීමාවූ ආයතනයක් නොවීය. වරෙක රණ බිමේද, තවත් වරෙක කෙළි බිමේ ද එකසේ දිග් විජය කළ හමුදාවකි ගෙවී ගිය 30 වසක යුද ඉතිහාසය තුළ ස්වේච්ඡා බලසේනා සාමාජිකයින් රණබිමේ දී කළ කැපකිරීම් අපමණය. එහිදී ශ්‍රී ලාංකීය වංශකතාව තුළ පළමු වරට පරම වීර විභූෂණ සම්මානයෙන් පිදුම් ලැබූ නිළධාරීයා ලෙසින් කපිතාන් සාලිය අලදෙනිය විරු නාමාවලියේ පළමු තැන හිමිකර ගන්නේය. එසේම එකී යුග මෙහෙවරේදී විශාල පිරිසක් දේශය වෙනුවෙන් දිවිපුදා ඇති අතර, අබාධිත තත්ත්වයට පත්වූ ගණන ද අති විශාලය. එසේම ලාංකීය කෙළි බිමෙහි එදා මෙදා තුර බිහිවුණු ඔලිම්පික් පදක්කම් ලාභීන් වන "ඩන්කන් වයිට්" හා "සුසන්තිකා ජයසිංහ" ද ස්වේච්ඡා බලසේනාවෙන් බිහිව තිබීමද කැපීපෙනෙන කරුණකි.



ඩන්කන් වයිට්

ස්වේච්ඡා බලසේනා සාමාජිකයෝ තවත් වරෙක සමාජ දේශපාලන බිමේ සිට කළා වූ මෙහෙය ද, දේශය ගොඩනැංවීම පිණිස වූ සංවර්ධන කාර්යයන්ට ලබා දෙන්නා වූ අසමසම දායකත්වයද ප්‍රශංසනීය වේ. එසේම අද වන විට ස්වේච්ඡා බලසේනාව තවදුරටත් ශක්තිමත් කරලමින් ස්වේච්ඡා උපසේවයද පනගන්වා තිබේ. ඒ යටතේ විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විද්වත් වෘත්තිකයින් ඉඳුරාම බඳවා ගනිමින් යුද හමුදාවේත් රටේත් අභිවෘද්ධිය පිණිස යොදවා ඇති බැව් විශේෂයෙන් සඳහන් කළ හැකිය.


ස්වේච්ඡා බලසේනාව අදවන විට යුද හමුදාව තුළ අතු පතර විහිදී ගිය දැවැන්ත වෘක්ෂයක් ලෙසින් සමස්ථ රටටම සෙවණ සලසමින් සිටී. නේකවිද හැලහැප්පීම්, දුෂ්කරතා, අභියෝග ජයගනිමින් නොසැලුණු ගමනක නියැලුණු ස්වේච්ඡා බලසේනාව කාලීන අවශ්‍යතා මැනවින් හඳුනා ගනිමින් දේශය වෙනුවෙන් වූ අඛණ්ඩ මෙහෙවරක නියැලී සිටිති.

---

## දිවියට ඔවදනක්




Don't wait for the
**PERFECT MOMENT**
Take the moment and make it
**PERFECT**



පොසොන් පොහොය වෙනුවෙන් ඔබට පිදෙන්නකි ...

# මිහින්තලය



**අම්බස්තලය, මිහින්තලය අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලය ආසන්නයේ පිහිටා ඇති අඩි 1000 ක් උසින් යුතු ශෘෂ කන්දකි. පුත්තලම - ත්‍රිකුණාමලය A 12 මාර්ගයේ අනුරාධපුර සිට සැතපුම් 8 ක් නැගෙනහිරට වන්නට පිහිටා ඇත. චේතියගිරිය එසේත් නැතහොත් සෑගිරි ලෙසද හඳුන්වන එය වඩාත් ප්‍රචලිත වන්නේ මිහින්තලය ලෙසටය. ඉන්දියාවේ සිට පැමිණි මිහිඳු මහ රහතන් වහන්සේ පොසොන් පොහෝදින දේවානම්පියතිස්ස රජතුමා ඇතුළු පිරිස හමු වී බුදු දහම දේශනාකලේ මිහින්තලයේදීය.**

## ඉතිහාසය

### මිහින්තලය කඳු පාමුල

වංශකතාවන්හි දක්වෙන පරිදි ක්‍රිස්තු පූර්ව 247 පොසොන් පුර පසළොස්වක පොහොදා මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ඉට්ටිය, උත්තිය, සම්බල, භද්දසාල රහතන් වහස්සේ නිර්මල දහම් පණිවිඩය රැගෙන දඹදිව සිට මිස්සක පර්වතයට වැඩිසේක. එවක ලක්දිව රජතුමා වූ දේවානම්පියතිස්ස රජතුමා මිහින්තලයේදී මෙම දූත පිරිසට හමුවූහ. මෙම ඓතිහාසික හමුවීම සිදුවූ ස්ථානය ශ්‍රී ලාංකික බෞද්ධයෝ ගෞරව බහුමානයෙන් වැඳුම් පිදුම් කරති.

මිහිඳු හිමියන්ගේ ලංකා ගමන පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍ර ඇසුරින් වගේම පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර තුලින්ද කරුණු රැස්කර ගත හැක. මේ අනුව වංශ කතා පවසන පරිදි බුදුන් පිරිනිවන් පෑ වසර දෙසිය තිස්හයක් එළඹුණදා මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ පිරිස ලංකාවේ මිහින්තලයට වැඩිසේක. එහිදී මිහිඳු තෙරුන්ට දේවානම්පියතිස්ස රජු හමුවී දෙදෙනා අතර ප්‍රශ්නෝත්තර මාලාවක ස්වරූපයෙන් සංවාදයක් ඇති විය. ඉන්පසු මිහිඳු හිමි රජු ගේ බුද්ධිය අවබෝධකර ගැනීමෙන් පසු රජතුමා ඇතුළු පිරිසට මිහින්තලා කඳු මුදුනේදී පළමු ධර්ම දේශනාව වන චුල්ලහත්තපදෝපම සූත්‍රය දේශනා කරන ලදී.

### ආශ්‍රිත උත්සව

එදා මිහිඳු මහරහතන් වහන්සේ පොසොන් පොහොදා මිහින්තලයට වැඩම කොට සිංහල ජනයාගේ ජීවිතයට නව උදාවක් ලබා දුන්නේය. සිංහල සාංස්කෘතියේ නව නැම්මක් ඇති වූයේය. මෙම උත්තම සිද්ධිය සිහිපත් කරමින් සෑම වර්ෂයකම පොසොන් පොහෝ දා සිංහල බෞද්ධ ජනයා මිහින්තලය වැඳපුදා ගැනීමට එක්රොක් වෙති. මේ අයුරින් මිහින්තලය යනු සිංහල බෞද්ධයන් වන අපට ඉතා පාරිශුද්ධ වූ සුවිශේෂ ස්ථානයකි. ඒ නිසාම පොසොන් මාසයේ මිහින්තලයට වන්දනා ගමන් යාමට පුරුදුව සිටිති.

### පුරාණ ඉදිකිරීම්

පුරාණයේ සිටම මිහින්තලය නැගීමට පියගැට විශාල සංඛ්‍යාවක් නිර්මාණය කර ඇත. එම ඉදිකිරීම් දේවානම්පියතිස්ස රජතුමා විසින් ආරම්භ කර ඇති අතර විහාර ගෙයක්ද, භික්ෂූන් වහන්සේලාට වැඩ විසීම සඳහා ගුහා 68 ක්ද කරවා ඇත. ඉන් අනතුරුව මිහින්තලය ආශ්‍රිතව විහාරාරාම කිහිපයක් ඉදිවී ඇති අතර ඒවා එම යුගයට ආවේණික ලක්ෂණ දරණු දැකිය හැක. සෙල්ලිපි, ලෙන්ලිපි, කටාරම්ලිපි ආදි පුරාවිද්‍යාත්මක සාධක තුලින්ද මිහින්තලා ඉතිහාසය පිළිබඳව තොරතුරු හමුවේ. මිහිඳු හිමියන්ගේ පැමිණීම පිළිබඳ කරුණු ඇතුළත් සෙල්ලිපියක් හමුවී ඇත. මෙම සෙල්ලිපිය කැඩී බිඳී අබලන්ව ගිය එකකි. එහි එන මහිද තෙරහව, හද්‍රසාල තෙරහව, ඉට්ටක තෙරහව, පති තෙරහව යන පාඨය අනුව මෙම ධර්මදූත ව්‍යාපාරයට සහභාගිවූවන් පිළිබඳ තොරතුරු සඳහන් වේ. මිහිඳු හිමියන් ලක්දිව පැමිණ 27 වන දිනයෙහි වස් විසීම පිණිස මිහින්තලයට වැඩියහ. මිහින්තලයේ වස් විසීම භික්ෂූන් 60 නමක් සිටි අතර එහි වස් විසීමට ආවාස නොවූහෙයින් කණ්ඨක චේතිය අසල ලෙන් ශුද්ධ කරවා ආවාස හැටියට සකස් කරවිය. මෙම ලෙන්වල ලිපි වලින් මිහින්තලා ඉතිහාසය පිළිබඳ තොරතුරු හමුවේ.

ගෘහ නිර්මාණ ක්ෂේත්‍රය අතින් මිහින්තලය සුවිශේෂ ස්ථානයක් ගනී. මිහින්තලයේ පිහිටි ගෘහ නිර්මාණ වාස්තු විද්‍යාත්මක වශයෙන් ඉතා වැදගත් වේ. ගෘහ නිර්මාණ අතර ආරාම, වෙදහල, දාන ශාලාව, සන්නිපාත ශාලාව, පොහොය ගෙවල්, භාවනා ශාලා, ආරෝග්‍ය ශාලාව, සීමා මාලක සහ සක්මළු ආදී බොහෝ නිර්මාණ තනවා තිබුණේය.

### මහා සෑය

මිහින්තලා කඳු මුදුනේ පිහිටා ඇති විශාල චෛත්‍ය මාහා සෑයයි. එය මහාදාතික මහානාග රජතුමා විසින් කරවා ඇති අතර අඩි 136 ක විශ්කම්භයකින් යුක්තය.


මිහින්තලා මහා සෑය

### කණ්ඨක චේතිය

මෙය සූරතිස්ස රජතුමා විසින් කරවන්නට ඇති බව විශ්වාස කෙරේ. එහි පේෂා වළලු සහ ඉදිරි කොටස සෑහෙන තරම් තවමත් ඉතිරිව පවතී. එය බහිරව රූප හා ඇත් රූප වලින් අලංකාරව ඇත. ස්ථූපය අඩි 425.5 කින් යුක්තය. එහි අඩි 40 ක් පමණ වූ ස්ථූපයක නටඹුන් දැකිය හැක. භික්ෂූන් වහන්සේලා මෙම ස්ථූපයට ආසන්නයේ ඇති ගල් ගුහා වල වෙසෙන්නට ඇත. මෙම ස්ථූපය කරවා ඇත්තේ සූරතිස්ස රජතුමා විසින් බැවින් එය අයත් වන්නේ පළමු බුද්ධ ශතවර්ෂයටය බව සැකයක් නැත.

### අම්බස්තල දාගැබ

මෙය කඳු මුදුනට ආසන්න වූ තැනිතලාවක පිහිටා ඇති අතර මාතලන්තිස්ස රජතුමා විසින් කරවන්නට ඇතැයි විශ්වාස කෙරේ. මිහිඳු මහරහතන් වහන්සේ හා දේවානම්පියතිස්ස රජතුමා අතර ඇති වූ ඓතිහාසික හමුවේ දේවානම්පියතිස්ස රජතුමා සිටින්නට ඇතැයි සැලකෙන ස්ථානය සිහිගැන්වීමට මෙම දාගැබ ඉදිකර ඇත.

### මිහිඳු සෑය

මිහිඳු මහරහතන් වහන්සේගේ භෂ්මාවශේෂ වලින් කොටසක් නිදන්කොට දේවානම්පියතිස්ස රජතුමාගේ බාල සොයුරු උපතිස්ස රජ විසින් ක්‍රිස්තු පූර්ව 210 - 200 විසින් මිහින්තලා කඳු මුදුනත ඉදිකරන ලද බවට මහවංශයේ සඳහන් සෑය මෙය වේ. මෙහි නටඹුන් අතර තිබූ ගඩොල් වල ඇති බ්‍රාහ්මීය අක්ෂර ක්‍රිස්තු පූර්ව සියවස් වලට අයත් වේ. මේ අනුව මෙම සෑය මෙරට ඇති පැරණිතම සෑ අතුරින් එකක් වේ. 1951 වර්ෂයේදී මෙහි කැනීම් කටයුතු ආරම්භ කෙරිණ. මිහිඳු සෑය 1941 වර්ෂයේ පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

### ගිරිභණ්ඩ සෑය

1951 වසරේදී කැනීම් කොට මතු කර ගන්නා ලද මෙම දාගැබ ක්‍රිස්තු වර්ෂ 8 වන සියවසට පමණ අයත් යැයි විශ්වාස කෙරේ. ගොඩනැංවූ අය අවිනිශ්චිතවේ. අනුරාධපුර යුගයේ දාගැබක ධාතු ගර්භයක පිහිටීම හා ඉදිකිරීම් තාක්ෂණය මෙන්ම අනුරාධපුර යුගයේ ධාතු ගර්භ සිතුවම් පිළිබඳ නිරීක්ෂණයට මින් අනාවරණය වූ ධාතු ගර්භය වැදගත් වන අතර එම ධාතු ගර්භය දැනට මිහින්තලය කෞතුකාගාරයේ තැම්පත් කර තිබේ.

### රෝහල

මිහින්තලය කඳු පාමුල පැරණි රෝහලක නටඹුන්, බෙහෙත් ඔරුවක්ද, එම යුගයට අයත් යැයි සැලකෙන ගොඩනැගිලි වල කොටස් ද දැකිය හැකිය. රෝහල සහ කඳු මුදුනට දිවෙන පඩිපෙල අතර විශාල අසපුවක නටඹුන් දැකිය හැකිය. පැත්තක් අඩි 25 ක් වූ හතරැස් ගොඩනැගිල්ලට පහලින් අලංකාර ගල් කැටයම්ද, ගලින් කරන ලද බරාඳි වැටවල්ද පිහිටා ඇත. මේ අංශය අධික ප්‍රපාත වූ බැවින් පඩි පිහිටා ඇත්තේ නැගෙනහිර බෑවුමට වන්නටය. එහි පඩි 1840 කඳු මුදුන දක්වා දිවේ. පලමු පඩි කොටස අවසානයේ කුඩා කඳු මුදුනක් හමුවේ එහි " කණ්ඨක චේතිය " පිහිටා ඇත.

### භෝජන ශාලාව

මළුව පිහිටා ඇත්තේ තුන්වන පඩිපෙල අවසානයේය. මළුවේ වම් පැත්තට වන්නට භෝජන ශාලාව පිහිටා ඇත. එය සෘජුකෝණාකාර වන අතර දිගින් අඩි 62 ක් ද, පළලින් අඩි 25 ක් ද වේ. එය වටා ගබඩා කාමර පිහිටා ඇත. ජලවහන පද්ධතියක කොටස් ඒ අසලින් සොයාගෙන ඇති බැවින් ක්‍රමානුකූල ජල සම්පාදන ක්‍රමයක් තිබෙන්නට ඇති බව විශ්වාස කෙරේ. භෝජනාගාරය අසල ආහාර ගබඩාකර තබන්නට ඇතැයි විශ්වාස කෙරෙන ගල් භාජන දෙකක් දක්නට ඇත. ගොඩනැගිල්ලට ඇතුළුවන පැති දෙකකින් විශාල ශිලා ලේඛණ දෙකක් පිහිටා ඇත. ආරාමයේ පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය නීති රෙගුලාසි මෙහි සටහන් කර ඇත. ඊට නුදුරින් තවත් තැනිතලාවක භික්ෂූන් වහන්සේලා හමුවී ධර්ම හා විනය සාකච්ඡා කරන්නට ඇතැයි සැලකේ. එය විවෘත ගොඩනැගිල්ලක් වන අතර පැත්තක් අඩි 62 කි. ගල් කණු 48 ක් මත පිහිටා ඇත. ගොඩනැගිල්ල මාධ්‍යයේ දොරටු හතරකින් යුතු වේදිකාවක් ද පිහිටා තිබේ.

### දාන ශාලාව

මෙය චේතිය පබ්බත හී භික්ෂූන් වහන්සේලාගේ දෛනික දානමය උවමනාවන් සපුරාලූ ස්ථානය වේ. ප්‍රාථමික වස්තු සලකා බැලීමේදී අනුරාධපුර මහා විහාරබද්ධ සෙසු දාන ශාලාවට සමාන වේ. මෙම දාන ශාලාව වෙත ගල් පිහිල්ලක ආධාරයෙන් ජලය සපයාගෙන ඇති ආකාරය සුවිශේෂී වේ.




ඉතිරි කොටස 44 පිටුවට ..



# සිතන්න කාලයයි මේ ...

මා මෙම විස්තරය සමාජ ආගමික සංස්කෘතික සිරිත් විරිත් සම්ප්‍රදායන් ඔස්සේ විග්‍රහ කිරීමට කැමැත්තෙමි. අපි පළමුව සිතා බලමු උගතෙක් යනු කවරෙක්ද? යහපත් පුරවැසියෙක් යනු කෙබඳු පුද්ගලයෙක්ද කියා. උගත්කම යනුවෙන් අදහස් වන්නේ තමා උපන්දා සිට මේ දක්වා උගත් සෑම දෙයක් ගැනම තමා තුල ඇති න්‍යායික දැනුමයි. තමා උගත් දෙය ප්‍රායෝගික ජීවිතයට ගලපාගෙන යහපත් ක්‍රියාවන්හී නිරත වෙමින් තමාට මෙන්ම සමාජයටද සේවයක් ඉටුකල යුතුය. රැකියාවක් අරබයා පමණක් යම් ශිල්පයක් ශාස්ත්‍රයක් ඉගෙනීමෙන් ඵලක් නැත. සමහරුන්ට උගත්කම තිබුණද බුද්ධිය නොමැත. උගත්කම යනු යම් විෂයක් පිළිබඳව ඇති න්‍යායික දැනුම පමණි. තවත් විදියකින් එය විග්‍රහ කරන්නේනම් පොතපතේ දනුම න්‍යායික දනුම වේ. දැනුම බුද්ධියෙන් වටහාගෙන එය ප්‍රායෝගික ජීවිතයට ගලපාගෙන තම ජීවිතය සාර්ථක කරගත හැකිවන්නේනම් ඒ උගත්කම කෙතරම් අගනේද?

### විස්තෘත පවුල තුලින් යහපත් පුරවැසියෙකු බිහිවන්නේද?

විස්තෘත පවුලක් යනු ආච්චි, සියා සහ තවත් ඥාතින් මුල් කොටගත් අම්මා, තාත්තා ඇතුළු දරුවන්ය. අද මෙන් නොව එදා අපි කුඩා කල හැදී වැඩුනේ විස්තෘත පවුලකය. අපි එදා ළමයින් සහ අද ළමයින් ගත කරන ජීවිත ගැන කථා කරමු. අපි පළමුව එදා ළමයින් තම නිවසේ දෛනික දින චර්යාව ගතකල හැටි කථා කරමු. එදා ආච්චි, සියා සමඟ දවස ගතකරන අපට වැඩිහිටියන් මෙන්ම යහළුවන් වුයේද ඔවුන්ය. ඔවුන්ගෙන් අපට නිවැරදි මග පෙන්වීමක් ලැබුණි. අද තරම් තාක්‍ෂණය එදා දියුණු නැත. වැඩිහිටියන්ට ගරු කිරීම, කළගුණ සැලකීම, තම ආගම නිවැරදිව ඇදහීම, සිංහල සිරිත් විරිත් අනුගමනය කිරීම හා සෞඛ්‍යවත් ආහාර රටා යහපත් කථා පිලිවෙත් ගමන බිමන අඳින පළඳින ආකාරය ඇතුලු තවත් මෙකී නොකී බොහොමයක් දේ උගත්තේ ඔවුන්ගෙන්ය.

බොහොමයක් වැඩිහිටියන් තම එදිනෙදා කරන කාර්යන් සඳහා තම දරුවන්ද සහභාගි කරවා ගත්තෝය. වැඩ කරන අතරතුරදී බෝසත් කථා සහ විවිධ රස කතාන්දර පවසා ඒවායින් ප්‍රායෝගික ජීවිතයට ගතහැකි ආදර්ශ ඉගැන්වූයෝය. බොදු සිරිත් විරිත් ජන ගී විරිදු ආගමික චාරිත්‍ර වාරිත්‍ර කියාදුනි. අද සමාජයේ මේ කියන සෑම දෙයක්ම මේ වන විට දුරස්වී ඇත. ඒ බව සිහිකරන විට නිරායාසයෙන්ම නෙතට කඳුලක් උනයි. හදවත රිදුම් දෙයි.

එදා හිමිදිරි පාන්දර අවදිවන ආච්චි අම්මා අපව අවදිකර කොළ කැඳ හෝ නැවුම් එළකිරි හෝ වෙනත් ඖෂධීය පානයකින් සංග්‍රහ කළාය. එදා අප උදෑසන සිට මුළු දවසම බීමට ගත්තේ හෙළ ඔසුය. ස්වභාවික නැවුම් පානයන්ය. ඒවායෙහි කිසිදු වර්ණක හෝ රසකාරක කල් තබාගැනීමේ ද්‍රව්‍යන් අඩංගු වුයේ නැත. වෙළඳ පොලෙන් කිරිපිටි පැකට්ටුවක් මිලදී ගත්තේ කලාතුරකිනි. එහෙත් අද අප ඒ වෙනුවට පානය කරන්නේ තේ කහට හෝ කිරිපිටිය. ඒවායේ වර්ණක රසකාරක හා තවත් ශරීරය ලෙඩ කරන ද්‍ර බොහෝය. අපි කන බොන දෙයින් වසවිස නැති දෙයක් නැති තරම්ය. අද සමාජයේ රැකියාවන් සමඟ කාර්ය බහුලත්වය මත දරුවන්ට කැඳක් සාදා දෙන්නට දෙමව්පියන්ට වේලාවක් නැත. හැකි සෑම වේලාවකදීම ස්වභාවික පාන වර්ග දරුවන්ට ලබාදීමට ඔබත් හුරුපුරුදුවී එමගින් ඔබේ දරුවා නිරෝගිමත් දරුවෙක් බවට පත් කරගත හැකිය.

### බොදු සිරිත් විරිත් තුලින් යහපත් පුරවැසියෙකු බිහිවන්නේද?

එදා වැඩිහිටි ආච්චි සීයා බුදුන් වැඳීමට පෙර අපටත් කතාකර නිවැරදිව ඒ වත් පිළිවෙත් කරන අයුරු කියාදුනි. බුදුන් වැඳ නිවසේ පිසගත් ආහාරයක් රැගෙන අපි පාසලට හෝ දහම් පාසලට ගියෙමු. එහෙත් අද ඒ පුරුදු සෑහෙන දුරට අපගෙන් දුරස්ව ඇත. අද ළමයින් අඩුතරමින් මවට පියාට වඳින ගාථා පවා නොදන්නා තරමට සමාජ සාරධර්ම අතින් පිරිහී ඇත. අපි එදා ගමනක් යනවිට නිවසින් පිටවුයේ නිවසේ සියළු වැඩිහිටියනට වැඳ ආශිර්වාද රැගෙනයි එම යහපත් දරුවාට කිසිදා වැරදුනේ නැත. අද වඳිනවා වෙනුවට "හායි බායි ටටා චෙරියෝ" කියමින් දරුවන් නිවෙස් වලින් නික්මෙති. අහෝ ! බුදුන් තුන් වරක් වැඩි මේ බෞද්ධ පින් බිමට සිදුව ඇති ඛේදවාචකය කුමක්ද? මෙසේ සිදුවීමට හේතු සොයා බැලීමට කාලය එළඹ ඇත.

දරුවන්ට යහපත් දේ උගන්වා හරි මග යැවීමේ භාරදූර වගකීමද යුද හමුදා සාමාජිකයින් වන ඔබට අද දවසේ පැවරී ඇත. අද දරුවන් නොමග ගොස් ඇත්තේ ඔවුන්ගේ වරදින් නොව ඒවා හරිහැටි ඉගැන්වීමට කිසිවෙක් නොමැති නිසාය. අද මව්පියන් දෙදෙනාම බොහෝවිට රැකියාවන්හි නියුතුවීමෙන් අතිශය කාර්යය බහුලවී ඇත. එබැවින් තම පාසල් යන දරුවනටද ආහාර ලබාගැනීමට මුදල්දී ඔවුනද ආපන ශාලා මගින් ආහාර රැගෙන රැකියාවට යන්නන් බවට පත්ව ඇත.

### න්‍යෂ්ටික පවුල් ක්‍රමය යහපත් පුරවැසියෙකු බිහිවීම කෙරෙහි කෙතරම් බලපෑමක් ඇති කරයිද?

අද සමාජයේ පවතින න්‍යෂ්ටික පවුල් පරිසරය අතිශය නොසන්සුන් කාර්ය බහුල එකක් වී ඇත. අද ළමයින් ලඟ ආච්චි සීයා නැත. බොහොමයක් දෙමාපියන් කරන්නේ ඔවුන්ව මහලු වු විට වැඩිහිටි නිවාසයන් වෙත භාරදීමය. දෙමාපියන් රැකියාවන් සඳහා ගිය පසු දරුවන් රැකබලා ගැනීමට කිසිවෙක් නොමැත. එවන් සමාජයක හුදු මුදල් ඉපැයීමේ පරමාර්ථයෙන් පමණක් පවත්වාගෙන යනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථානයන් (DAY CARE CENTER) මාපිය සෙනෙහස අහිමි හුදකලාවූ දරුවන් රැකබලා ගැනීමට බැඳි සිටී. දෙමව්පියන් තම දරුවන් එහි රඳවා රැකීරක්‍ෂා සඳහා පිටත්ව යයි. මෙවන් අදීන සමාජයක තම මහලු දෙමාපියන්ට බෙහෙත් හෙත්දී කවා පොවා නහවා පෝෂණය කරන පවුල්ද,

තම දරුවන්ට යහපත් ගුණධර්ම කියාදෙමින් තම නිවසේ ඔවුන් සමග සිටිමින් ආදරය සෙනෙහස දක්වමින් මනාව පෝෂණය කරමින් තම ගෙවත්තේ ස්වයංපෝෂිත ආර්ථික රටාවකට හුරුපුරුදු වූ දෙමව්පියන්ද නැතුවාම නොවේ.



මේ න්‍යෂ්ටික පවුල යනු දෙමාපියන් සහ දරුවන් පමණක් සිටින කුඩා පවුල් ඒකකයක් වේ එහි ආච්චි සීයා නොමැති නිසා දරුවන්ට හොඳ සිරිත් විරිත් කියා දෙන්නට කෙනෙක්ද නැත. දෙමාපියන් සිටියත් ඔවුන්ගේ කාර්ය බහුලත්වය මත ඔවුන්ටද වේලාවක් නැත. අද සමාජයේ සිටින විෂය දැනුම පමණක් ඇති කිසිදු විෂය පරිබාහිර දැනුමක් නොමැති හදවතේ තෙතමනයක් නැති රොබෝ යන්ත්‍ර වැනි දරුවන්ය. දයාව අනුකම්පාව කරුණාව ආදරය අනෙකාගේ අපහසුතාව තේරුම් ගැනීමට හැකියාවක් ඇති දුකේදී පිහිටවන යහපත් මානුෂිය හැඟීම් වලින් තොරවූ දරු පිරිසක් වර්තමානයේ නිර්මාණයවී ඇත. දරුවන් රූපවාහිනී ජංගම දුරකථන සහ පරිඝණක යන විද්‍යුත් මාධ්‍ය අවභාවිතයට අසීමිතව ඇබ්බැහි වී ඇත. අද විද්‍යුත් මාධ්‍ය මගින් ප්‍රචාරය කෙරෙන චිත්‍රපට හා ටෙලිනාට්‍ය තුල ඇත්තේ හුදු ප්‍රචණ්ඩත්වය පමණි. එමෙන්ම පරිඝණක වීඩියෝ ක්‍රීඩාවන්හි දරුවන් නිරතවීම තුලින් ඔහු ප්‍රචණ්ඩකාරී බවට පත්වේ. වීඩියෝ ක්‍රීඩාවන්හි ඇත්තේ නිතරම අනෙකා පරාජය කර තමා ජය ලැබීමේ ආත්මාර්ථකාමී බවයි. එබැවින් ඒ තුලින් පරාර්ථකාමී දරුවෙකු නොව ආත්මාර්ථකාමී අදහස් වලින් පිරි අනුන්ට කිසිදු උපකාරයක් නොකරන මානසිකත්වයක් ඇති දරු පරපුරක් බිහිවේ.

අද දරුවන් බොහොමයක් නොමග යන්නේ ඉහත කී විද්‍යුත් මාධ්‍ය අවභාවිතය නිසාය. කුඩා ළදරුවන් හඬනා විට ඔවුන් අතට ජංගම දුරකථන දී නැළවීමට අද අම්මලා හුරුවී ඇත. හැඩීම නතර කිරීම නොව හැඩීමේ ඇරඹුම එය බව මව්වරු දන්නේ නැත. අපේ අම්මලා එදා අපිව නැළවුයේ මිහිරි දරු නැළවිලි ගීත තාලයට ගයමින්ය. ඒ මිහිරි නාදය අසමින් දරුවා සුවසේ නින්දට යයි. හොඳ හදවතක් ඇති දරුවකුගේ ජීවිත ඇරඹුම එතැනය. දරුවන්ට දුරකථන අතට දී රූපවාහිනිය නැරඹීමට සලස්වා දෙමාපියන් රිසිසේ ඔවුනොවුන්ගේ කාර්‍යයන්හි නිරත වෙති. දරුවා පොත්පත් කියවීමට දක්වන මැලිකම ඇරඹෙනුයේ එතැන් සිටය. දරුවන් හුදෙකලා වන්නේ ඉලෙක්ට්‍රෝනික උපකරණ සමගය. දෙමාපියන් දරුවන් සමග දවසේ වැඩි වේලාවක් ගත කළ යුතුයි. එහෙත් එම අවකාශය රූපවාහිනිය නමැති රකුසා විසින් ඩැහැගෙන ඇත. දරුවන් සමග යහපත්දේ කරමින් ගුණධර්ම කියාදෙමින් යහපත් මිතුරන් ආශ්‍රය කිරීමටද ආච්චි සීයා ආශ්‍රය කිරීමට සලස්වා ඔවුන්ගේ ජිවිත සුමඟට ගැනීම දෙමාපියන්ගේ වගකීමකි. හෙට අනාගතය භාරගැනීමට වෙර දරන දරුවන් යහපත් පුරවැසියන් බවට පත් කිරීම මුළු මහත් සමාජයේම වගකීමකි.

එදා ළමයින් තම ගමේ පාසලට බොහෝ විට ගියේ පයින්ය. ඒ යනෙන අතරතුර සෙල්ලම් කරමින් විනෝද වෙමින් පළතුරු ගඩාගෙඩි කමින් පාරේ ගමන් කළෝය. අපට තිබුනේ එවන් සුන්දර පාසල් දිවියකි. අද දරුවන්ට එවන් තත්වයක් නැත. සිසුන්ගේ පාසල් බසය හෝ වෑන් රිය නිවස අසල ඇති මාර්ගය අසල නතර කර එතැන් සිට පාසල දක්වා ඔවුන්ව ප්‍රවාහනය කරයි. තාක්ෂණික දියුණුවද ළමයින්ගේ සුන්දර ළමාවිය හා ජිවිත අත්දැකීම් ඩැහැගැනීමට සමත්ව ඇති බවක් මෙයින් පෙනෙන්නට ඇත. අපට අපගේ එදා ළමාවිය පාසල් දිවිය ගැන ආඩම්බරයෙන් කථාකල හැකි වුවද අද ළමයින්ට අනාගතයේ කථා කිරීමට දෙයක් ඉතිරි වී නැත.

එදා ළමයින් ඉරිදාට අනිවාර්‍යයෙන්ම දහම් පාසල් ගියෝය. දහම් දැනුමට අමතරව අපි බොදු ජන ගී කවි සින්දු කෙටිකතා රචනා විවාද තරඟ සඳහා සහභාගි වුණා. එයින් ළමයින් ආධ්‍යාත්මික දියුණුවක් ලැබුවා. අද ළමයින් ඉරිදාට යන්නේ දහම් පාසල් වෙතට නොව ටියුෂන් කඩ වෙතය. එදා අපි දහම් පාසල් ගියේ සිංහල බෞද්ධ ඇඳුමින් සැරසී තෙල්, සුවඳ කූරු, පහන් තිර හා මල් වට්ටි දෝත දරාගෙනය. මල් වට්ටි සඳහා දහම් පාසල් ගුරු භවතුන් ලකුණු ලබාදුනි. එවන් අතීතයක් අපට තිබුනි. එවන් බොදු සිරිත් විරිත් වැළඳගත් සමාජයක් අද වන විට හාත්පසින්ම වෙනස්වී ඇත. ඒ යන්නේ නවීන ජංගම දුරකථන රැගෙන බටහිර පන්නයට හැඳ පැළඳ ගෙනය. සිංහල බෞද්ධ වන අපි නමට පමණක් බෞද්ධ නොවිය යුතුය. යුද්ධ හමුදා සාමාජිකයින් වන ඔබ ඔබේ දරුවා තම ආගමට, රටට, ජාතියට, සංඝයාට, ගුරුවරුන්ට, දෙමාපියන්ට, වැඩිහිටියන්ට ගරු කරන යහපත් පුරවැසියෙකු බවට පත් කිරීම ඔබේ වගකීමයි.

විශේෂයෙන්ම ටියුෂන් යනු මුදල් ඉපයීමේ හුදු පරමාර්ථයෙන් පවත්වාගෙන යන ආයතනයන්ය. එමගින් දරුවන්ට ලබා දෙනුයේ විෂය දැනුම පමණි. එපමණක් නොව ගමේ සිට නගරයට ටියුෂන් පන්ති කරා පැමිණෙන දරුවා නොයෙකුත් සමාජ විරෝධී ක්‍රියාවන් සඳහා පොළඹවා ගැනීමට පෙලග ැසි සිටින පිරිසද බොහෝමයකි. එමෙන්ම දරුවෙකුට තම සුන්දර ළමාවියේ අත්විඳිය හැකි සොඳුරු අත්දැකීම් විඳ ගැනීමට ඉඩ අහුරන විභාගයක් ලෙස 5 වසර ශිෂ්‍යත්වය අද සමාජයේ විවිධ පැතිකඩ ඔස්සේ කතා බහට ලක්වී ඇත. එය සමාජ කට වහරේ කියැවෙනුයේ අම්මලාගේ විභාගය ලෙසය. දරුවා අළුයම අවදි වී පාසල කරා ගොස් පාසල නිමාවී දිව යන්නේ ටියුෂන් පන්ති වෙතය. පන්තිය නිමාවී පාසල් නිළ ඇඳුමින්ම නිවසට පැමිණෙන්නේ බොහෝ අඳුර වැටුණාට පසුවය. ඉන් පසු ඇඳුම් උනා තබා ඇඟ සෝදා පිරිසිදුවී රාත්‍රී ආහාර ගත්තාට පසු නැවත අධ්‍යාපන කටයුතු වල නිරත වන්නට දරුවාට කාලයක් නැත. ඒ අතරතුර දෙමාපියන්ද නිසොල්මන්ව මෙගා ටෙලි නාට්‍යපෙල නරඹමින් සිටී. දරුවන්ද තමා උදේ සිට හවස් වනතුරු උගත්දේ පසෙකලා රූපවාහිණිය නැරඹීමට පටන් ගනී. එමෙන්ම මුළු දවස පුරා වෙහෙසට පත්වුණු දරුවාට විඩාව නිසා රූපවානිය නරඹමින් සිටි පුටුවේම නින්ද යති.

දෙමාපියන් කරන තව වරදක් වන්නේ තම දරුවා විභාගය සඳහා පමණක් සූදානම් කිරීමයි. දරුවා විෂය පරිබාහිර කටයුතු කිරීමෙන් අධ්‍යාපන කටයුතු අඩාලවේ යැයි දෙමාපියන් තුල මිත්‍යාවක් පවතී. දරුවා ඉගෙන ගැනීමට නම් පළමුව හොඳ මානසික සෞඛ්‍යයකින් සිටිය යුතුය. මානසික සෞඛ්‍ය රැකෙනුයේ කායික සෞඛ්‍ය රැකුණහොත් පමණි. එනම් දරුවන් ක්‍රීඩා සඳහා යොමු කරවීමයි. එමගින් දරුවා මනාලෙස සෞඛ්‍ය සම්පන්න හා නිරෝගීමත් වේ. ක්‍රීඩාවෙන් ජය පරාජය යන දෙකම එක ලෙස විඳදරා ගත හැකි දරුවෙක් බිහිවේ. අද ළමයින් විද්‍යුත් මාධය ඔස්සේ වීඩියෝ ක්‍රීඩාවන්හි නිරතවීමට ඇබ්බැහිවීම තුලින් නිවෙස් වලින් බාහිර පරිසරයට අවතීර්ණවීම අවමවී ඇත. දරුවන්ගේ එළිමහන් ක්‍රියාකාරකම් අද අතිශය දුර්ලභය. අද දරුවන් ක්‍රීඩා කිරීම අවම වීම තුලින් පරාජය ඉවසිය නොහැකි තත්වයට පත්වී ඇත. එමගින් විභාගය අසමත් වූ විට හෝ අඩු සාමාර්ථ ලැබූ විට වස පානය කිරීම නොයෙක් පෙති වර්ග භාවිතා කරන තත්වයට පත්ව ඇත. ඇතැම්විට තම ජිවිතයද නැති කර ගනිති.

ඉතිරි කොටස 44 පිටුවට ..

මා අවසාන වශයෙන් ඔබ හට පවසනුයේ ඔබේ දරුවා නිවසේ තනි නොකර හැකි සෑම විටෙකම දරුවා සමග කාලය ගත කරන්න කියාය. දරුවන් සමග සෙල්ලම් කරන්න. විනෝද ගමන් යන්න. දරුවාට සමාජය හුරු කරන්න. සමාජය සමග ගැටෙමින් ජීවත්වන ආකාරය උගන්වන්න. දරුවා ඥාතීන්, ස්වාමීන් වහන්සේ හමුවට රැගෙන ගොස් ඔවුන්ව හඳුන්වා දෙන්න. රජයේ ආයතන වලට දරුවා රැගෙන ගොස් එවායින් ඉටු කෙරෙන කාර්‍යයන් උගන්වන්න. හැකි තරම් දරුවා ජංගම දුරකථන, රූපවාහිනී, පරිඝණක භාවිතයෙන් දුරස්කර තබන්න. ඒ වෙනුවට කියවීමේ පුරුද්ද දරුවාට හුරු කරන්න. තම ආගමට ජාතියට භාෂාවට ගරු කිරීමට දෙමාපියන්ට වැඩිහිටියන්ට සැලකීමට සිංහල බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර අගයකොට සැලකීමට දරුවා හුරු කරන්න. දෙමාපියන් සැමදෙනාම උත්සාහ කරනුයේ තම දරුවා සමාජයේ රජයේ හෝ පුද්ගලික අංශයේ උසස් රැකියාවක් කරන උගත් පුද්ගලයෙක් කිරීමයි. උදාහරණයක් ලෙස වෛද්‍යවරයෙක්, ගුරුවරයෙක් යැයි සිතමු. විෂය දැනුමින් පමණක් ගොඩනගන ලද උගතා තුල ගුණධර්ම හෝ මනුෂත්වය හෝ හදවතේ තෙතමනයක් නැත. වෛද්‍යවරයෙක් වූ කල්හි අසරණ රෝගීන්ට සැර පරුෂ ලෙස බැණ නොවැදි ආදරයෙන් සෙනෙහසින් යුතුව කරුණාවෙන් ප්‍රතිකාර කල යුතුය. එමෙන්ම ගුරුවරයෙකු වූ කල්හි දරුවන් යහමගට යැවීමේ උදාර පරමාර්ථයෙන් යුතුව දයානුකම්පාවෙන් විෂය දැනුමින් සහ ගුණධර්ම වලින් පරිපූර්ණ කල යුතුය. මනුෂ්‍යත්වයෙන් තොරව මහජනයාට සලකන රජයේ හෝ පුද්ගලික අංශයේ නිලධාරීන් බිහිකිරීමෙන් සමාජයට ඇති යහපත කුමක්ද මේ සෑම සියලු දෙයින්ම මා ඔබට පහදාදීමට උත්සාහ කළේ ඔබේ දරුවා සමාජ මාධ්‍ය භාවිතය සම්පූර්ණයෙන් නවතා දැමීමම නොවේ. එය යහපත් ලෙස භාවිතා කළ යුතු බවයි. දෙමාපියන් දරුවන්ට අවවාද දීමට වඩා ආදර්ශමත් විය යුතුයි. මක් නිසාද යත් කුඩා දරුවන් සමාජානුයෝජනය වන්නේ අන් අය අනුකරණය කිරීමෙන් වන නිසාය. ඉහත කී ගුණ ධර්ම වලින් පරිපූර්ණ නම් ඔහු උගතෙක් මෙන්ම හෙට දින එළිය කරන යහපත් පුරවැසියෙකුද වනු නොඅනුමානය.

සෙ/ඊ100063 ලා/බො මධුශංක පීඑම්පී
ප්‍රධාන ශාඛාව
ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානය

---

# මිහින්තලය ඉතිරි කොටස ...

## මිහිඳු ගුහාව

අම්බස්තල දාගැබේ සිට කඳු බෑවුම දෙසට දිවෙන කුඩා අඩිපාර මිහිඳු ගුහාව තෙක් විහිදේ. මිහිඳු ගුහාව මිහිඳු මහා නාහිමියන් සැතපී විවේක ගත් ස්ථානයයි. සියළු ගුහා වලින් වඩාත් ප්‍රසිද්ධ හා බෞද්ධයින්ට වඩාත් පූජනීය වන්නේ මිහිඳු ගුහාවයි.

## ආරාධනා ගල

ආරාධනා ගල මහාසෑයට මුහුණලා පිහිටා ඇත. අධික සුළං සහිත කාල වලදීත් ආරාධනා ගල නැගීමට බැතිමත්හු අමතක නොකරති. මහාවංශයේ සඳහන්වන පරිදි අහසින් වැඩි මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිස පළමුවෙන්ම ශ්‍රී ලංකා දීපයෙහි පය තැබුවේ ආරාධනා ගල මුදුනටය.

## අටසැට ලෙන්

දේවානම්පියතිස්ස රජු මිහිඳු මහාරහතන් වහන්සේ ප්‍රමුඛ භික්ෂූන් උදෙසා ලෙන් 68 ක් සකස් කොට පූජා කළ බව මහා වංශයේ දැක්වෙයි. මෙම සෑම ලෙනකම පාහේ කටාරමට පහලින් පූර්ව බ්‍රාහ්මීය ලේඛණ දැකගත හැකි බැවින් මේවා ක්‍රිස්තු පූර්ව යුගයට අයත් බැව් පැහැදිලිවේ. ක්‍රිස්තු වර්ෂ 31-34 සමයේ කණිරජාණුතිස්ස රජ තමන් ඝාතනයට සැළසුම් කල දුශ්ශීල මහණුන් 60 නමක් කනිර නම් ප්‍රපාතයට හෙලාදැමූ බව මහා වංශයේ විස්තර වේ. එම ප්‍රපාතය මෙම ලෙන් පිහිටා ඇති බෑවුම් සහිත ප්‍රදේශය බැව් විශ්වාස කෙරේ.

## පොකුණු

මිහින්තලා පූජා භූමියේ පිහිටා ඇති මෙම පොකුණු අතර සිංහ පොකුණ, නාග පොකුණ, කළු දිය පොකුණ ප්‍රධාන තැනක් ගන්නා අතර තවත් අවශේෂ පොකුණු කිහිපයක් ද හමුවී ඇත.

## සිංහ පොකුණ

විනාශ වී ගිය ආරාමවලින් ගහණ ප්‍රදේශයේ සිංහ පොකුණ දක්නට ලැබේ. සිංහ පොකුණ යයි ව්‍යවහාර වුවද එය පොකුණක් නොව සිංහ මුඛයෙන් ජලය පිටවන දිය පිහිල්ලකි. කණ්ඨක චෛතිය හා සන්නිපාත ශාලාව අසබඩ ජීවත් වූ භික්ෂූන් වහන්සේලාගේ පැන් පහසුව පිණිස විශේෂයෙන් ස්නානය පිණිස යයි සිතිය හැකි මෙම දිය පිහිල්ල සකස්කර ඇත්තේ පසු පාද දෙකෙන් සිටගෙන සිටින ලෙස ගලින් නෙලන ලද ජීවමාන ප්‍රමාණයේ සිංහයකුගේ මුවින් ජලය පිටවන ආකාරයටය.

## කළුදිය පොකුණ

මෙය මිහින්තලයේ පිහිටි ප්‍රසිද්ධ පොකුණු වලින් එකකි. පොකුණෙහි ඇති ජලය කළු පාටට පෙනෙන බැවින් එයට කළුදිය පොකුණ යන නම ලැබී ඇත. එක් පොහෝ දිනක බුද්ධරක්ඛිත හිමියන් කළුදිය පොකුණු සමීපයෙහි ඇති තිඹිරිය ගසක් යටට වී කාල කර්ම සූත්‍රය දේශනා කල බවට විශ්වාස කෙරේ.

## නාග පොකුණ

මහා වංශයේ මහින්දාගමන ප්‍රවෘතීන් අතර නාගචතුස්ක නම් වූ විලක් පිළිබඳ සඳහන් වේ. පසු කාලීන පළමු අග්ගබෝධි රජු (ක්‍රිස්තු වර්ෂ 575 - 608 ) විසින් නාග සොණ්ඩි පොකුණ කරවූ බවක්ද වංශ කතාව වාර්ථා කරයි. මින් පැවසෙන්නේ නාගචතුශ්ක නම් විල ස්වාභාවික විල අග්ගබෝධි රජු විසින් වඩා විධිමත් පොකුණක් බවට වර්ධනය කල බවයි. වර්ෂා ජලයෙන් පෝෂණය වන බවට විශ්වාස කල හැකි මෙම පොකුණෙන් සිංහ පොකුණ, දාන ශාලාව ආදී ස්ථාන සඳහා අවැසි ජලය සැපයීමද, දෛනික භික්ෂූ ජල වුවමනාව සැපයීමද සිදුවී තිබේ. අම්බස්තලය දාගැබ පසුකර බටහිර දෙසට යනවිට මෙම නාග පොකුණ මුණ ගැසේ.

---

**උපුටා ගැනීම :** ශ්‍රී ලංකා ඉතිහාසය (මිහින්තලය)
අන්තර්ජාලය ඇසුරෙනි.

# නිර්මාණ අසපුව



සෙ/1ජේ00867 ලා/කෝ බණ්ඩාර ආර්එම්එන්
1 ශ්‍රීලංරබ
යුද හමුදා කඳවුර
පල්ලේකැලේ

## බිරිඳට සෙනෙහසින් ...

ඩිංගක් නුඹට සැර දැම්මට තරහද සොඳුර
කඳවුරේ වැඩ ගොඩයි සැනසීමක් නැහැ නිතර
දොඩමළු නොවන හින්දද මේ තරමට දඹර
පෙරුම් පුරන්නේ හනිකට එන්නයි ගෙදර

ඔබහට බැන්ද සෙනෙහස වදනින් පවසන්න බැරි
සෙබළ හිතේ ඉඩ අන් ළඳකට ගන්න බැරි
නිබඳව මට සිහිවේ ඔබේ සුදු මුව සිනා පිරි
රන් කඳ මගේ නුඹ නොමැතිව හිඳිනු බැරි

සැක මුසු තැන් සොයමින් මට රිදවන්න එපා
මගෙන් වැරදි සිදුවේ යයි බිය වෙන්න එපා
අග හිග කම් කොතෙක් ආවත් මා අත් හරිනු එපා
මා දුටු මිණි මෙවුල අන් අයෙකුට පුදනු එපා

සෙ/එල්100140 සාසෙ ජයලත් බණ්ඩාර එච්එම්ජීඑස්
වෛද්‍ය පරීක්ෂණාගාරය
හකාස අණසක මූලස්ථානය
සාලාව - කොස්ගම

## මා ආදරණීය අම්මා

උදයම අවදිවී ආහර පිසුවාය
ඉන් පසු දරුවනට ඒවා බෙදුවාය
ගලනා දහඩියෙන් ඇගෙ ගත තෙමුනාය
අම්මාවරුන් මතු ලොව බුදු වෙනවාය

හිමිදිරි පාන්දර තේ දලු නෙලුවාය
කුස තුල මා දරා ඈ දුක් වින්දාය
කල යුතුකම් අප සැමහට කෙරුවාය
ගෙදර බුදුන්යැයි බුදුහිමි දෙසුවාය

කවා පොවා ඇය අප නැහැවුවාය
හැකි පමණින් ගුරුහරුකම් දුන්නාය
දඬුවම් නොකරමින් අප නැළවුවාය
ඉගෙන ගනින් මගෙ සුදු පුතේ කිවාය

ආගම දහම ගැන ඔවදන් දුන්නාය
බියකරු සසර ගැන ගුණදම් දෙසුවාය
පන්සිල් නිති රකින් පුතුණේ කීවාය
එසේ කියා අප යහ මග යැව්වාය

ඇගේ සෙනෙහස අප සැමහට පෑවාය
ශිල්ප සතර ඇය මැනවින් දුන්නාය
උතුරා යන මෙත් කරුණා පෑවාය
මුදිතා උපේක්ඛා ගුණකඳ ඉමහත්ය

වැඩපල සියලුදේ ඇගෙනම් පිළිවෙලය
අප්පච්චිට කරන සැලකිලි ඉමහත්ය
පිරිසිදු කරයි මුලු නිවසම ලහිලහිය
අම්මා නිසා මුලු නිවසම සැණකෙළිය

ලේ කිරිකර පොවා අප දැඩි කෙරුවාය
සැන්දෑ උදා බුදු හිමියන් වැන්දාය
දිවි රැකුමට නොකල දෙයක් නැතුවාය
මතු බුදුවන්නේ ආදර මගෙ අම්මාය

සෙ/ඒ100063 ලා/බො මධුශංක පීඑම්පි
5(සෙවි) ශ්‍රීලකාහ
ප්‍ර ශාඛාව
ශ්‍රීලංයුහසෙව්බමු
සාලාව - කොස්ගම

## මතින් නිදහස් රටක්

කොතෙක් හඬ නැගුවත්
කොතෙක් දඩ ගැහුවත්
කොතෙක් ලෙඩ හැදුනත්
අත් මිදීමට නොහැකි කීවත්
මුසාවක් එය

සෙබළ සොයුර අපි
අත් මිදෙම් අත් හරිමු "මත් රකුසා"
මුදවමු අපි මතින් තොර
දේශයක්

සෙ/2එල්00815 ලා/කෝ චතුර කුමාර පීජීඑන්
2 (සෙවි) ශ්‍රීලයුවෙබ
යුද හමුදා ජනපදය
පනාගොඩ

ඇද විය. යුද්ධයක ප්‍රධාන පාර්ශවකරුවන්ට සේම ඊට අතරමැදි වන අයවලුන්ටද එහි බිහිසුණ කටුක බවට මුහුණ දීමට සිදුවීම සාමාන්‍ය වේ. නැති බැරි කමද ජීවිත අවධානමද සමගින් අවිනිශ්චිත හෙට දවසට මුහුණදුන් ඇය තුළින් යුධ පරිසරයන්හි යුද්ධයෙන් බැටකන සමස්ථ තරුණියන්ගේ පැතිකඩක් නියෝජනය වුවායැයි මට සිතුණි.

එක්තරා දිනක යාබද කොවිල් බිමේ සිට තනිව එමින් සිටි මොහොතක අතර මගදී ඈ මාහට හමු විය. දරාගත නොහැකි ගිනි අව්වේ වුව පාවහන් දෙකක් හෝ නොපැලඳ සිටි ඇගේ හිසකේ අවුල්ව තිබූ අතර නළල මත දා බිඳු ඉස ඇති සෙයකි. එදිනද සුපුරුදු පරිදි මද සිනහවක් මා වෙත පෑ ඇය බිම බලාගෙනම යන්නට වූවාය.
මෙසේ දින සති ගෙවියත්ම අප හදවත් තුළ එකිනෙකා පිලිබඳ පැහැදීමක් ඇතිවන්නට වූයේ නොදැනුවත්මය. අප දෙදෙනාටම එකිනෙකාට කියාගන්නට යමක් ඉතිරිව තිබුණද භාෂාව නොදැන සිටීමද පැවති අවිනිශ්චිත වටපිටාවද අප බොහෝ සේ දුරස් කොට තිබුණි. එවක නව යෞවන වියේ සිටි මා හට ඈ දැකීමද ආශ්වාදයක් විය. ඈ පිළිබඳව අනුකම්පාව මුසු ලෙංගතු කමක් මා හදෙහි ජනිත වුවද එය මා තුළම සඟවා ගන්නට මම පරිස්සම් වුනෙමි. එහෙත් කඳවුරේ තනිවූ එක්තරා දිනක මම ඈ පිළිබඳ වූ මතක අකුරු කරන්නට අමතක නොකලෙමි.

අද ඈ කොහේ සිටීදැයි මා නොදනී. ඈ සිටි ඉසව්වට ගතවූ විසි වසර පුරා මා පාතැබුවේද නැත. ඇතැම් විට අද ඇය කිසිවෙකුගේ දයාබර බිරිඳක් වන්නට පුලුවන. නොඑසේනම් යුද්ධයේ අවාසනාවන්ත බව කර පින්නාගෙන දිවියෙන් වන්දි ගෙව්වාදැයි නොදනී. කෙසේ වුව ඈ පිලිබඳ වූ සොඳුරු මතක සදා මා සිත අවදිකරවයි.

## *නළලත සිඹින්නද තිලකය මැකෙන ලෙස ...*


**සීතල දෑත හදවත උණුසුම රැඳුන**
**පාවඩ නොමැති බිම පය අතුරා නිතින**
**තල්ගස් සෙවන යට ඉඳ ලෝකය බලන**
**තංගච්චියෙකි නුඹ තනිකම දුක දැනුන**

**සුළඟින් පවා සිසිලස නොදැනෙන ලොවක**
**නුඹ සියපතක් රොන් පිරී සුසිනිඳු මෙලෙක**
**සුව විඳගන්න හිතුනත් ළඟ ඉඳ මලක**
**මම දුර වැඩියි නුඹ ගැන ඒ නිසයි දුක**

**කෝවිල් බිමේ දහසක් සළකුණු ඇඳුන**
**මිරිවැඩි සඟල නැති නුඹෙ පා යුග රැඳුන**
**වැලි දූවිලි ඇතත් ජීවිතයට බැඳුන**
**හදවත පිරිසිදුයි නුඹෙ සැක නැහැ එගැන**

**තල් අතු ඉහලගෙන ගිනි අව්වේ තදට**
**දුව පැන අතීතයෙ නුඹ කල කී කවට**
**හසරැලි මැකුණ කෙහෙරැලි වියවුල් හිසට**
**මතකය අමතකද කඳුළැලි ඇයි නෙතට**

**සාමය පොදි බැඳන් දෑවැද්දක් විලස**
**නුඹ එනවාද පුරවන්නට මගෙ හිඩස**
**සිහිනෙන් ඇවිත් නුඹ අබියස සලා හිස**
**නළලත සිඹින්නද තිලකය මැකෙන ලෙස**



**මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ**



# CLIFFORD RICHARDS IN CONCERT

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා සාමාජිකයන්ගේ සුභසාධන කටයුතු හා මූලස්ථාන කඳවුරු පරිශ්‍රයෙහි පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අවැසි අරමුදල් වර්ධනය කර ගැනීමේ අරමුණින් පසුගිය අප්‍රේල් මස 07 වන දින නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව වෙතින් "CLIFFORD RICHARDS IN CONCERT" නමින් ප්‍රසංගයක් පැවැත්විණ. එහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී සහභාගී විය. එම අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් එල්එච්එස්සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඇතුලු යුද හමුදා ජ්‍යෙෂ්ඨ නිළධාරින් රැසක්ද, ස්වේච්ඡා බළසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ජීආර්එච් ඩයස් වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී ද නියෝජ්‍ය සේනාවිධායක ඇතුලු ස්වේච්ඡා බළසේනා කාර්ය මණ්ඩලයේ මූලික මාණ්ඩලික නිළධාරි, පුහුණු පරීක්ෂක, බ්‍රිගේඩියර් පාලන, බ්‍රිගේඩියර් භකාස ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් රැසක්ද ස්වේච්ඡා ඒකකයන් හි සෙසුනිළයින් විශාල පිරිසක් සහ සිවිල් වැසියන් විශාල පිරිසක් සහභාගි වූහ.

















# ජවය, පුහුණුව, කැපවීම මුසුකොට ජයටැඹ කරා ...

## ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා තරඟාවලිය - 2019













Visit us

Towards a Proud Organization with Excellence